# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2014** අගෝස්තු **19** වන අඟහරුවාදා
2014 ஆவணி 19 செவ்வாய்க்கிழமை
Tuesday 19th August 2014

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාතේ සභා ගොඩනැඟිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවැති සභා රැස්වීම**

பத்தரமுல்ல .இல ,டென்சில் கொப்பேகடுவ மாவத்தை ,ஸ்ரீ ஜயவர்த்தனபுர , 204இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.36 ට පළාත් සභාව රැස් විය.**
மு.ப. 09.36 க்கு சபை கூடியது
*The Provincial Council met at 09.36 a.m.*

**ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர் [ சுனில் விஜேரத்ன அவர்கள்] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම ගරු ඔබතුමන්ලා වෙත පිළිගන්වනවා.

i. 2014.07.16 වන දින පැවති මහජන පෙත්සම් කාරක සභා රැස්වීම් වාර්තාව.

ii. 2014.08.06 වන දින පැවති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සහ ගෘහ කාරක සභා රැස්වීම් වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු කිත්සිරි කහටපිටිය**
Hon. Kithsiri Kahatapitiya

ගරු සභාපතිතුමනි, වරකාගොඩ, පොල්ගස් හන්දිය හි පදිංචි ඩී.එච්.ඩී. සිරිපාල යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

***[සභා මේසය මත තබන ලද පෙත්සම්]**
*[Tabled petitions]*

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

දකුණු කළුතර, වික්‍රමසිංහ පෙදෙස, අංක 42/17 හි පදිංචි ජේ.එච්. සීලවතී යන අයගේ පෙත්සම සහ

ගරු කීර්ති කාරියවසම් ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

නුගේගොඩ, තලපත්පිටිය, කනත්ත පාර, අංක 121 බී හි පදිංචි එල්.ටී.ඩබ්ලිව්. ගමගේ යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
## ORAL ANSWERS TO QUESTIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

න්‍යාය පත්‍රයේ අංක 01 යටතේ ජගත් විතාන ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සෞඛ්‍ය අමාත්‍යතුමාට ඉදිරිපත් කිරීමට අවස්ථාව. ගරු මන්ත්‍රීතුමා සභා ගර්භයේ නැහැ.

**ගරු රංජිත් සෝමවංශ** (සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Ranjith Somawansha (Minister of Health, Indigenous Medicine, Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, එතුමා සභාවේ නොමැති නිසා මම පිළිතුරු සභාගත කරනවා.

***[සභාගත කරන ලද පිළිතුරු]**
*[Tabled Answer]*

***ප්‍රශ්නය :***

*අ. මූලික රෝහලක හදිසි ප්‍රතිකාර ඒකකය සෝදනා බව පවසා රෝගියෙකු වාට්ටුවට ඇතුළත් කර නොගැනීමට හැකිද?*

***පිළිතුර :***

*අ. ඇතුළත් කර නොගැනීමට හැකියාවක් නැත.*

***ප්‍රශ්නය :***

*ආ. 2014.07.12 දින හොරණ මූලික රෝහලට ඇතුළත් වීමට පැමිණි හොරණ, පොකුණුවිට, කරදගහවත්ත ප්‍රදේශයේ පදිංචි කොලඹගේ දොන් ලක්ෂ්මි නමැති 54 හැවිරිදි රෝගියාට රෝහලේ අදාළ වෛද්‍යවරයා විසින් හදිසි ප්‍රතිකාර ඒකකය සෝදන බව පවසා රෝගියාගේ දියණිය වන හර්ෂණී ජයවර්ධන යන අයට තුණ්ඩු කැබැල්ලක් දී රෝහල ඉදිරිපිට ඇති පෞද්ගලික රෝහලින් ප්‍රතිකාර ගැනීමට යවා ඇති බව ඔබතුමා දන්නෙහිද?*

***පිළිතුර :***

*ආ. නොදනිමි. මේ පිළිබඳව හොරණ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් එවා ඇති වාර්තාවේ තුණ්ඩු කැබැල්ලක් දී රෝහල ඉදිරිපිට ඇති පුද්ගලික රෝහලට යැවූ බවක් සඳහන් නොවේ.*

***ප්‍රශ්නය :***

*ඇ. එම පෞද්ගලික රෝහලෙන් ප්‍රතිකාර ලබා නිවසට ගිය රෝගියා එදින රාත්‍රියේම මියගොස් ඇති බව දන්නෙහිද?*

***පිළිතුර :***

*ඇ. නොදනී. එම රෝගියා මිය ගොස් ඇති බව වෛද්‍ය අධිකාරී විසින් මා වෙත එවා ඇති වාර්තාවේ සඳහන් වේ.*

***ප්‍රශ්නය :***

*ඈ. හොරණ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වන්නේද?*

***පිළිතුර :***

*ඈ. හොරණ මූලික රෝහලේ වෛද්‍ය අධිකාරී විසින් මේ පිළිබඳ පරීක්ෂණයක් පවත්වා ඇත.*

***ප්‍රශ්නය :***

*ඉ. නොඑසේ නම් ඒ මන්ද?*

***පිළිතුර :***

*ඉ. ඉහත ඈ යටතේ පරීක්ෂණයක් පවත්වා ඇත.*

***ප්‍රශ්නය :***

*ඊ. පරීක්ෂණයක් පවත්වන්නේ නම් එහි වත්මන් තත්ත්වය කුමක්ද?*

***පිළිතුර :***

*ඊ. පරීක්ෂණය පවත්වා අවසන් කර ඇත. ඒ අනුව කොළඹගේ දොන් ලක්ෂ්මී ගෞරි යන වයස අවුරුදු 54 ක කාන්තාවගේ මරණය සම්බන්ධයෙන් 2014.07.12 වන දින මූලික ප්‍රතිකාර ඒකකයේ කාර්ය භාර වෛද්‍ය නිලධාරී හා එම අවස්ථාවේ සේවය කළ අනෙකුත් වෛද්‍ය නිලධාරීන්ගේ ප්‍රකාශ සටහන් කර ගෙන ඇත. ඒ අනුව මෙම රෝගියා එදින පස්වරු 1.30 ට පමණ රෝහලට ඇතුළත් කිරීම සඳහා රැගෙන විත් ඇති අතර, එම අවස්ථාවේදී රෝහලේ විශේෂඥ වෛද්‍යවරයකු සේවයේ යෙදී නොසිටි බැවින් විශේෂඥ වෛද්‍යවරයෙකුට පෙන්වීමේ අවශ්‍යතාවය අගතියට පත් පාර්ශවය විසින් තහවුරු කර ඇත. රෝහලට ඇතුළත් කළ රෝගියෙකුට විශේෂඥ වෛද්‍යවරයෙකුගේ ප්‍රතිකාර ලබා දීමේ ක්‍රමවේදය පැහැදිලි කර ඇති අතර, එම තත්ත්වයට අකමැත්ත ප්‍රකාශ කර රෝගියාගේ ඥාතීන් පෞද්ගලික රෝහලකදී විශේෂඥ වෛද්‍යවරයෙකුට පෙන්විය හැකි බවට තීරණය කර ගනිමින් රෝගියා පරීක්ෂා කිරීමට ඉඩ නොදී ආපසු රැගෙන ගොස් ඇති බව සේවයේ යෙදී සිටි සියලුම වෛද්‍යවරුන් ප්‍රකාශ කර ඇත.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට න්‍යාය පත්‍රයේ අංක 02 වශයෙන් අරුණ දීපාල් ගරු මන්ත්‍රීතුමාගේ නමින් යුතු ප්‍රශ්නය ඉදිරිපත් කිරීමට අවස්ථාව.

**ගරු ප්‍රසන්න රණතුංග** (ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමා)
Hon. Prasanna Ranathunga (Chief Minister and the Minister of Finance and Planning, Law and Order, Land, Education, Local Government and Provincial Administration, Manpower and Employment, Engineering Services and Information)

ගරු සභාපතිතුමනි, මම කල් ඉල්ලා සිටිනවා. මොකද, මට පිළිතුර ලබා දීලා තියෙනවා. මම ඒ ගැන සෑහීමකට පත් වෙන්නේ නැහැ. ඒ නිසා ලබන සභා වාරයේදී ඉදිරිපත් කරන්න කල් ඉල්ලා සිටිනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මම දන්නවා පිළිතුරක් ලබා දීලා තිබෙනවා. අසත්‍ය තොරතුරු ඒ පිළිතුරේ තිබෙන්නේ. ඒ නිසා ඒ සම්බන්ධයෙනුත් ඔබතුමා පරීක්ෂණයක් කරන්නය කියලා මම ඉල්ලනවා. දීලා තිබෙන තොරතුරුත් අසත්‍යයි. මම දන්නවා තොරුතුරු ටික.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක තමයි මම කිව්වේ, මේක ගැන මම සෑහීමකට පත් වෙන්නේ නැහැ.

***ප්‍රශ්නය ඉදිරි සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***
*The Hon. Chairman ordered by to refer the question to the next Council sitting.*

# ගම්/කැළ/හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා
# GM/ KEL/ HENEGAMA MADYA MAHA VIDYALAYA

**03.**

**මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා විසින් ගරු ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකීරක්ෂා, ඉංජිනේරු සේවා සහ ප්‍රවෘත්ති අමාත්‍යතුමාගෙන් අසන ලද ප්‍රශ්නය : (ප්‍ර/VI(1)/14/34)**

අ. කැලණිය අධ්‍යාපන කලාපයේ හේනේගම මධ්‍ය මහා විද්‍යාලයේ විදුහල්පතිවරයා සම්බන්ධව මූල්‍ය අක්‍රමිකතා පිළිබඳ මූලික විමර්ශනයක් සිදු කර තිබේද?

ආ. එම මූලික විමර්ශනයේ නිර්දේශයන් මොනවාද?

ඇ. එකී නිර්දේශයන්ට අනුව විදුහල්පතිවරයාට එරෙහිව ගත් ක්‍රියාමාර්ග තිබේද?

ඈ. එසේ නම් ඒ මොනවාද?

ඉ. මෙකී විදුහල්පතිවරයා තවමත් මෙම විද්‍යාලයේ විදුහල්පතිවරයා ලෙස කටයුතු කරන්නේ කුමන පදනමකින්ද?

ඊ. මෙකී විදුහල්පතිවරයා විදුහල්පති සේවයේ දරන ශ්‍රේණිය කුමක්ද?

උ. මෙම විද්‍යාලයේ විදුහල්පති සේවයේ පත්වීම් සහිත විදුහල්පතිවරුන් කී දෙනෙකු සිටීද?

ඌ. ඔවුන් කවුරුන්ද? හා ඔවුන්ගේ විදුහල්පති ශ්‍රේණීන් මොනවාදැයි මෙම සභාවට දැනුවත් කරන්නේද?

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අ. ඔව්.

ආ. 1. මෙම විදුහල්පතිවරයා වහාම ක්‍රියාත්මක වන පරිදි එම පාසලෙන් ඉවත් කර බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවට අනුයුක්ත කිරීම.

2. 2011, 2012 වර්ෂවල සම්පූර්ණ මූල්‍ය විගණනයක් සිදු කර විදුහල්පතිගෙන් රජයට අය විය යුතු මුදලක් ඇත්නම් අය කර ගැනීම.

ඇ. ඔව්.

ඈ. විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට යොමු කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී.

ඉ. අභ්‍යන්තර විගණන අංශයේ පරීක්ෂණ වාර්තාව ලැබෙන තෙක්.

ඊ. 2-1 (මෙම විදුහලට විදුහල්පති ලෙස පත් වූ දිනය 2007.03.26)

උ. තුන් දෙනෙකි.

ඌ.

| අනු අංකය | විදුහල්පතිවරයාගේ නම | විදුහල්පති ශ්‍රේණිය | මෙම විදුහලට විදුහල්පති ලෙස පත් වූ දිනය |
|---|---|---|---|
| 1 | අරුණ ජයන්ත සේනාධීර මහතා | විදුහල්පති 1 | 2011.06.29 |
| 2 | එස්.කේ.බී.ආර්. විමලදාස මහතා | විදුහල්පති 1 | 2011.05.24 |
| 3 | එස්.එස්.එස්. පෙරේරා මහත්මිය | විදුහල්පති 2 - 1 | 2013.01.01 |

*පසුබිම් වාර්තාව*

*වී.එස්. කුලරත්න මහතා මෙම විදුහලේ විදුහල්පති ලෙස පත් වූයේ 2007.03.26 දිනය. ඒ වන විට පාසලේ දෛනික කටයුතු අඩපන වී තිබුණු අතර, ඒ සඳහා විදුහල්පතිවරයෙක් එම පාසලට පත් කිරීමට නොහැකි වූ*

*බැවින් පාසලේ දරුවන්ගේ අධ්‍යාපන කටයුතු ඉදිරියට ගෙන යාම සඳහා මෙම විදුහල්පතිවරයා පත් කරන ලදී. 2007.03.26 දින මෙම විදුහලේ විදුහල්පති ලෙස පත් වන වී.එස්. කුලරත්න මහතා 2007.01.01 දින සිට විදුහල්පති 2 – 1 ට උසස් කර ඇත.*

*ඒ.ජේ. සේනාධීර මහාත විදුහල්පති 1 ශ්‍රේණියේ නිලධාරියෙක් වන අතර ඔහු විදුහල්පති වශයෙන් රාජකාරී කළ දඹුව කණිටු විදුහලේ ශිෂ්‍යයන් අඩු වීම මත වසා දමන ලදී. ඉන් පසු ඔහුගේ ඉල්ලීම මත වී.එස්. කුලරත්න මහතා යටතේ සේවය කිරීමට කැමති බව ප්‍රකාශ කළ නිසා නියෝජ්‍ය විදුහල්පති වශයෙන් පත් කරන ලදී. තවද එස්.කේ.බී.ආර්. විමලදාස මහතා මෙම විදුහලට නියෝජ්‍ය විදුහල්පති වශයෙන් පත් කරන විට ඔහු ද විදුහල්පති 2 -1 ශ්‍රේණිධාරියෙකි.*

*බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව විසින් කරන ලද මූලික විමර්ශනයට අදාළ වාර්තාවේදී විශේෂයෙන් පෙන්නුම් කර ඇත්තේ මූල්‍ය අක්‍රමිකතාවලට වඩා මුදල අවභාවිතා කිරීම හා අමාත්‍යාංශය යටතේ ඇති චක්‍රලේඛවලට අනුකූලව අදාළ නිර්දේශ ලබා නොගැනීම හා අවිධිමත් ලෙස මූල්‍ය කටයුතු සිදු කර ඇති බවයි. එබැවින් විනය පරීක්ෂණයකට යාමට පෙර තවදුරටත් මූල්‍ය කටයුතු පිළිබඳව වාර්තාවක් ලබා ගැනීමට අභ්‍යන්තර විගණන අංශයට යොමු කර ඇත.*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, “අද” පුවත්පතේ පළ වෙලා තිබුණා - මට මතක විධියට ජුනි මාසේ 15 වාගේ දවසක. පළාත් අධ්‍යාපන අධ්‍යක්ෂ විමල් ගුණරත්න මහතා පැවසුවයි කියලා, මේ විදුහල්පතිතුමා මූල්‍ය අක්‍රමිකතා ඇතුළු චෝදනා ගණනාවකට වරදකරු වී ඇති හෙයින් වහාම ක්‍රියාත්මක වන පරිදි පාසලෙන් ඉවත් කිරීමටත්, ඔහුගෙන් රජයට අය විය යුතු මුදල් වහාම අය කර ගැනීමටත් තීරණය කළ බව. මෙතුමා මේ පුවත්පතට එහෙම කියලා තිබෙනවා. නමුත් දැන් මේ ප්‍රකාශය කරලත් මේ වන කොට මාස එකහාමාරකට, මාස දෙකකට ආසන්න කාලයක් ගත වෙලා තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කෙටියෙන් ප්‍රශ්නය අහන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

එසේ තිබියදී ඇයි මොහු තවදුරටත්, විශේෂයෙන්ම ඔබතුමා කිව්වා වාගේ මේ විගණන වාර්තාවේ සඳහන් පරිදි මූල්‍ය අක්‍රමිකතාවලට චෝදනාකරු වෙලා තිබෙනවා. එසේ තිබියදී ඇයි ඔහු -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඒක පැහැදිලි කරන්නම්. මේක මූලික පරීක්ෂණය -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. මගේ ප්‍රශ්නය එසේ තිබියදී ඇයි තවදුරටත් මාස දෙකකටත් වැඩි කාලයක් මොහු මේ පාසලේ රඳවාගෙන තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

පැහැදිලිව ප්‍රශ්නයේ (ඈ) යන්නට මේ හා සම්බන්ධ පිළිතුර තිබෙනවා. ඔබතුමා අහන ප්‍රශ්නයටම. විධිමත් ක්‍රියාමාර්ග ගැනීම සඳහා අභ්‍යන්තර විගණන අංශයට යොමු කර වාර්තාවක් ලබා ගැනීමට කටයුතු කරමින් පවතී. ඒ විගණන වාර්තාව එනකල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ ගරු මහ ඇමතිතුමනි, මේ විගණන වාර්තාව සම්බන්ධව මම ගරු සංගමයේ ප්‍රධාන ලේකම් ලෙස බස්නාහිර පළාත් ප්‍රධාන අධ්‍යාපන ලේකම්වරයාට 2013.09.02 වැනිදා ලිපියක් යොමු කළා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඔබතුමා කියන්නේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ලිපියක් යොමු කළා, මේ 5/3/1/12/26 හා 2013.02.13 දිනැති විගණන වාර්තාව තිබෙන බව. එතකොට මේ විගණන වාර්තාව ගරු සභාපතිතුමනි, 2013.02.13 වැනිදා ඉදිරිපත්ව තියෙන්නේ. මේ වන කොට මේ විගණන

වාර්තාවට අවුරුදු එකහාමාරකට වැඩි කාලයක් ගත වෙලා තිබෙනවා. ඉතින් මේ විධියට තවදුරටත් ඇයි මේ විදුහල්පතිවරයා ආරක්ෂා කරන්නේ කියන ප්‍රශ්නය මට තිබෙන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

විගණන වාර්තාවක් නොවෙයි ඔබතුමා ඉදිරිපත් කළේ. මම හිතන්නේ ඔය කියන්නේ විගණන විමසුමක් ගැන. එතකොට විගණන විමසුමකට පිළිතුරු ලබා දෙන්න අයිතිය අපට තිබෙනවා. අපි විගණනයට දෙන්නේ, මේ චෝදනා පත්‍රයට අදාළව පරීක්ෂණයක් කරලා වාර්තාවක් දෙන්නය කියලා. නැත්නම් ඔහුට පුළුවන් උසාවියට ගිහිල්ලා අපට විරුද්ධව කටයුතු කරන්න. විධිමත් විධියට කටයුතු කිරීමට දැනටමත් කටයුතු කරලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, මූලා වාර්තාවෙන් අපි පැහැදිලිව තීන්දු කරලා තිබෙනවා, මේ වාර්තාව ලැබූ වහාම මේ මූලික පරීක්ෂණයෙන් කරපු නිර්දේශ ක්‍රියාත්මක කරන්න අපි කටයුතු කරනවාය කියලා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟ අතුරු ප්‍රශ්නය. දැන් ඔබතුමාම පිළිතුරේ සඳහන් කළා තවදුරටත් මේ පාසලේ තවත් නියෝජ්‍ය විදුහල්පතිවරු තුන් දෙනෙක් සිටිනවා කියලා. එයින් දෙදෙනෙක්, විමලදාස මහතාත්, ඒ වාගේම සේනාධීර මහතාත් විදුහල්පති 1 ශ්‍රේණිය. එතකොට මොහු විදුහල්පති 2. මේ වී.එස්. කුලරත්න මහතා විදුහල්පති 2-1 ශ්‍රේණිය. ඒ කියන්නේ, ඔහුට වඩා ඉහළ ශ්‍රේණියේ විදුහල්පතිවරු දෙදෙනෙක් මේ පාසලේ ඉන්නවා. එසේ තිබියදී මේ වාගේ චෝදනා ගණනාවකට ලක් වෙලා තිබෙන විදුහල්පතිවරයෙක් තවදුරටත් ආරක්ෂා කරන්නේ ඇයි? ඔබතුමාට පුළුවන් අර කියපු විධයට Audit report එක එනකල් මේ කෙනෙක්ව හරි තාවකාලිකව අනුයුක්ත කරන්න.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මේ විදුහල්පතිවරයාට පත්වීම දීලා තිබෙන්නේ 2007.03.26 වැනිදා. විදුහල්පති 1 වන ශ්‍රේණියේ විදුහල්පතිවරු දෙන්නාටම පත්වීම් දීලා තිබෙන්නේ ඒ ස්ථානයට 2011 දී. අවුරුදු හතරක් විදුහල්පතිවරයෙක් හැටියට මේ පාසල තුළ සියලු කටයුතු කරන කෙනෙක්. ඒ නිසා තමයි අපට ගැටළුව වෙලා තිබෙන්නේ, මේ කෙනෙකුට දීලා - ඒ අයගේ කැමැත්ත අරගන්න ඕනෑ ඒගොල්ලන්ට භාර දෙන්න. නමුත් විගණන වාර්තාව - මොකද, විගණන වාර්තා පරීක්ෂණයෙන් අනතුරුව තමයි මේ පිළිබඳව අපට කටයුතු කරන්න වෙන්නේ. අනිවාර්යයෙන්ම ඒක කෙරෙනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඊළඟ අතුරු ප්‍රශ්නය. ඔබතුමා සඳහන් කළ කරුණු නිසාද? එහෙම නැත්නම් සන්ධාන ආණ්ඩුවේ දේශපාලන මැදිහත් වීම නිසාද මේ කාරණය මේ විධියට සිදු වෙන්නේ කියන ප්‍රශ්නය මට තිබෙනවා. මොකද, මම ඉතා වගකීමෙන් කියන්නේ. පසුගිය අගෝස්තු මාසේ 30 වැනිදා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ප්‍රශ්නය විතරක් අහන්න කෝ?

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්නය තමයි. ජූලි මාසේ 30 මේ පාසලට ගියපු ගරු පළාත් සභා මන්ත්‍රී සහන් ප්‍රදීප් මැතිතුමා දෙමව්පිය රැස්වීමකදී කියලා තිබෙනවා, කුමන වැරදි කළත් එම ගුරුවරු සහ විදුහල්පතිවරු වැඩ කරනවා නම් අපි ආරක්ෂා කරනවාය කියලා. එතකොට ඒ මන්ත්‍රීතුමාගේත්, ඒ වාගේම පාර්ලිමේන්තු මන්ත්‍රී ඩුලිප් විජේසේකර ගරු මන්ත්‍රීතුමාගේත් මැදිහත්වීමෙන් ද මොහු තවදුරටත් ඒ තනතුරේ තබාගෙන ඉන්නේ?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා, සන්ධානයට උදව් කරනවා නම් මම ආරක්ෂා කරනවා. ඒක වෙනම කාරණාවක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ කියන්නේ වැරදි කළත් ඔබතුමා -

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මම වැරදි කළා කියන කාරණාව කිව්වාද? මම කිව්වේ සන්ධානයට උදව් කරනවා නම් මම ආරක්ෂා කරනවා. ඒක පැහැදිලිවම මගේ වගකීමක්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

නැහැ. මම අහන්නේ, සභන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා ඉතා පැහැදිලිව කියන්නේ, කුමන වැරදි කළත් ඒ නිසා ඔහුව ආරක්ෂා කරනවා කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවාදයකට යන්න ඉඩ දෙන්න අමාරුයි මට.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රසිද්ධියේ දෙමව්පිය රැස්වීමකදී කියන්නේ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම මෙතුමාට පැහැදිලිව උත්තරය දීලා තිබෙනවා. මෙතැන අපි ගන්නා වූ ක්‍රියාමාර්ගය පිළිබඳව. නමුත් එතුමා මගෙන් ඇහුවා සන්ධානයට උදව් කරන නිසාද කියලා. ඔව්. සන්ධානයට උදව් කරනවා නම් මම ඒ අයට උදව් කරනවා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අර කාරණයත් එක්ක මම ඇහුවේ. ඒ කියන්නේ කුමන වැරදි කළත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වාර්තා ටික සභාගත කරන්න. අර කලින් -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

කුමන වැරදි කළත් සන්ධානයට උදව් කරනවා කියලා විදුහල්පතිවරුන්ව ආරක්ෂා කරන්න බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමා කිව්වේ නැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ඒක ඔබතුමාගේ හතරවැනි ප්‍රශ්නය නේ. අර තුනට උත්තර දුන්නා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මම මතු කළේ, සභන් මන්ත්‍රීතුමා ප්‍රසිද්ධියේ - මම හිතන්නේ එතුමා සභාවේ ඉන්නවා. එතුමා ප්‍රසිද්ධියේ දෙමව්පිය රැස්වීමකදී කියපු කාරණාවක්.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ප්‍රශ්න තුනකට උත්තර දුන්නා. මේක හතරවැනි කාරණාව.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි පැහැදිලියි ඒක.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, ඊට අමතරව මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා අතුරු ප්‍රශ්නයක් ඇහුවා, 2014.08.05 වැනිදා. ඒකට උත්තර දෙන්න මේ අවස්ථාවේ අවසර තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

අතුරු ප්‍රශ්නය විධියට අහලා තිබුණේ කළුතර මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයේ 2 – 1 විදුහල්පති ශ්‍රේණිධාරීන් සිටියදී 2 -2 ශ්‍රේණිධාරියෙක් පත් කළේ ඇයි කියලා. ඒකට විදුහල්පති 2 -2 ආර්.එම්. ජෙෆ්රි මහතා කළුතර මුස්ලිම් මධ්‍ය මහා විද්‍යාලයට විදුහල්පති ලෙස පත් වන අවස්ථාවේ එම විද්‍යාලයේ වෙනත් විදුහල්පති ශ්‍රේණිධාරියෙක් සේවයේ යෙදී ඉඳලා නැහැ, ගරු සභාපතිතුමනි මම දන්නා තරමින්. මම කිව්වා, මට ඒකටත් වාර්තාවක් දෙන්නය කියලා. මේ වන කොටත් මේ පාසලේ තවම ශ්‍රේණිධාරීන් නැහැ. මම හිතන්නේ, එතුමා ඒක අහන්නේ වෙනත් මුස්ලිම් පාසලක් ගැන. මේ පාසලට අදාළව නොවෙයි ඕක වෙන්නේ. ඒක මේ පාසලේ නොවෙයි. ඔබතුමා ඒ ගැන බලලා ඉදිරිපත් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ අවස්ථාවේදී අවස්ථාව ලබා දෙනවා, පිළිතුරු දීමට කල් ගත් අතුරු ප්‍රශ්නවලට පිළිතුරු දීමට සූදානම් ඇමතිවරු ඉන්නවා නම් එහෙම -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගෙන් ඉල්ලීමක් කරනවා. අපට අර අතුරු ප්‍රශ්න ටික විධිමත් විධියට එවනවා නම් හොඳයි. මොකද, මේක බලපුවාම ගොඩක් මන්ත්‍රීවරු ඒක ප්‍රශ්නයක් විධියට අහන්නේ නැහැ. කථාවක් වාගේ කරලා තිබෙන්නේ. පැහැදිලි කිරීම් කරනවා වාගේ. ඔබතුමන්ලා අපට ඉදිරිපත් කරනවා නම් මේ අතුරු ප්‍රශ්න ටිකට උත්තර මේ ප්‍රශ්න වෙලාවේදී අපට ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන අමාත්‍යතුමා කියන කථාව සත්‍යයක්. මීට පෙර අවස්ථා ගණනාවකදීම අපි අතුරු ප්‍රශ්න නගලා තිබෙනවා. ඒවා විධිමත් විධියට එතුමාට යොමු වෙන්නේ නැති ස්වභාවයක් තිබෙනවා. ඇත්ත වශයෙන්ම. දැන් මුද්දර පනත පිළිබඳව ප්‍රශ්නයක් ඇහුවා. ඒකත් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අතුරු ප්‍රශ්නවලට ගරු මන්ත්‍රීතුමා, එවෙලේම අදාළ විෂය භාර අමාත්‍යතුමාට උත්තරයක් දෙන්න පුළුවන්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

නමුත් ගරු සභාපතිතුමනි, ඊට පස්සේ අතුරු ප්‍රශ්නවලට කාලය ඉල්ලනවා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, අතුරු ප්‍රශ්නයක් අහද්දී මට ඒකට පිළිතුරක් දෙන්න බැරි නම් මට ලබා දිය නොහැක කියලා කියන්න වෙනවා. හැබැයි, තොරතුරු අරන් මන්ත්‍රීවරයාගේ අවශ්‍යතාවයට දෙන්න ඕනෑ නම් කල් ගන්න වෙනවා. හැබැයි, කල් ගන්න -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

තිබෙන රීතිවලට අනුව බැහැ.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

රීතිවලට අනුව බැහැ. අපි එදා සාකච්ඡාවේදී ගියවර සභාවේදී කිව්වා -

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

නැහැ. අපි කාරක සභාවේදී -

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ලොකු දෙයක් එහෙම වෙනවා නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් මේකයි. ඇත්ත වශයෙන්ම කියනවා නම්, සමහර මන්ත්‍රීවරු අතුරු ප්‍රශ්න අහන වෙලාවේ ඇත්ත වශයෙන්ම අදාළ විෂය භාර ඇමතිතුමාට පහසු වෙනවා ඒක පැහැදිලිව කෙටියෙන් ඒ ප්‍රශ්නය අහනවා නම්. කෙටියෙන් අහන්නේ නැහැ නේ? ලොකු හැල්ලක් නේ කියවන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

අතුරු ප්‍රශ්නයක් කියන්නේ ඒ ප්‍රධාන ප්‍රශ්නයටම අදාළ යම් දෙයක්. ඉතින් අපට තිබෙන රීති අනුව ඒක කල් ගැනීමේ ප්‍රශ්නයක් අපට තිබෙනවා. ඒකයි තිබෙන ප්‍රශ්නය. කල් ගන්නයි බැරි. ඒකට පුළුවන් උත්තරේ එවෙලේ දෙන්න ඕනෑ. උත්තරයක් දෙන්න බැරි නම් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙන්න පුළුවන්. ඉතින් ඇමතිතුමන්ලාට ඒකයි අපි මේ අවස්ථාව ලබා දුන්නේ. ඒ මන්ත්‍රීතුමාට අතුරු ප්‍රශ්න අහනවා නම් එහෙම, අදාළ ඇමතිවරුන්ට පුළුවන් මේ අවස්ථාවේ සූදානම් නම් උත්තර දෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මම 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න සූදානම්. පළාත් සභා මන්ත්‍රීවරයෙකුට තමන්ගේ කටයුතු කර ගෙන යාමට කිසියම් බලපෑමක් තිබෙනවා නම් මම හිතන්නේ, ඒ පිළිබඳව මේ සභාවට කරුණු පැහැදිලි කරන්න ඕනෑ. මම කොළොන්නාවේ ජීවත් වන කෙනෙක් හැටියට ඒ වාගේම කොළොන්නාවේ පුරවැසියෙක් විධියට, මන්ත්‍රීවරයෙක් විධියට මගේ පළාතේ ජනතාවට කටයුතු කර ගෙන යන්න කිසියම් බාධාවක් එල්ල වෙලා තිබෙනවා නම් මම හිතන්නේ, ඒ පිළිබඳව මේ සභාවට දැනුම් දෙන්න ඕනෑ. කොළොන්නාවේ පළාත් පාලන ආයතනයක මතු වෙලා තිබෙන තත්ත්වය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමාට ඒ තත්ත්වය නොවෙයි. ඔබතුමාට ඇති වුණු ප්‍රශ්නය කියන්න කෝ? ඔබතුමා පැහැදිලි කිරීම්වලින් මට ඒවා ඉදිරිපත් කරන්න. දැන් ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්න කියලා ඉවර වෙලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ප්‍රස්තුථ කාරණය ගරු සභාපතිතුමා මම ඉස්සෙල්ලා කියන්න ඕනෑ. ඇයි මම මේ කියන්නේ කියලා. කොළොන්නාව නගර සභාවේ කටයුතු සම්පූර්ණයෙන් බිඳ වැටිලා තිබෙනවා. අපි ජනතා නියෝජිතයෝ විධියට, ජනතාව අපට ඇවිල්ලා කියන -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් ගැන කියන්න කෝ? ඔබතුමා මේ කොළොන්නාවේ වෙන -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා කියන්න දෙන්නේ නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා කාලයක් ගන්නේ නැතිව කෙටියෙන් වරප්‍රසාද ප්‍රශ්නය යොමු කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් කොළොන්නාවේ අපටත් තර්ජනයක් එල්ල වෙලා තිබෙනවා. නගර -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඇයි වෙඩි තියන්න ආවාද?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වෙඩි තියයි අද හෙට යන කොට. එහෙම නොවෙයි. වෙඩි තියන්න යනවා නොවෙයි. ඒක ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි නේ? ගරු සභාපතිතුමනි, ජනතාවගේ කටයුතු කර ගෙන යන්න අපි ජනතා නියෝජිතයෝ හැටියට පළාත් පාලන ආයතනයේ සහායක් ලැබෙන්නේ නැත්නම් පළාතේ කටයුතු කර ගන්න බැරි නම්, පළාතේ ඉන්න ඒ පාලන අධිකාරිය එකිනෙකාට තුවක්කු දික් කර ගන්නවා නම්, අනික් මිනිස්සුන්ට තර්ජනය කරනවා නම්, ඒ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඒක වෙන ප්‍රශ්නයක්. එතැන වෙන ප්‍රශ්නයක් තිබෙන්නේ. ඔබතුමාට -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මේ නගර සභාවට (බාධා කිරීම්) තුවක්කු නොවෙයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩ වීමක් එතැන සිදු වෙලා නැහැනේ ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට ප්‍රශ්නයක් වෙලා නැහැ එතැන. කොහෙත්ම වෙලා නැහැ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

හෙට දිනයේදී ඇවිල්ලා තුවක්කු දික් කරයි. ඒ නිසා මම කියන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට තවදුරටත් කාලය දෙන්න බැහැ. ඔය වාගේ දේවල්වලට කාලය දෙන්න අමාරුයි.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පළාත් පාලන ආයතනයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මේ වෙන ප්‍රශ්නයක් නේ කථා කරන්නේ. ඔබතුමාට වුණු වරප්‍රසාද කඩ වීමක් නම් මට කරුණාකරලා කියන්න. එහෙම නැතිව කොළොන්නාවේ නගර -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

දැන් මේ ආයතනයට -

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමා, එතුමාට ඒ පළාත් පාලන ආයතනයෙන් වැඩ කර ගන්න බැරි වීම නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ටික කියන්න ඔබතුමා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඉතින් ඒක කියන්න දෙන්නේ නැහැනේ ඔබතුමන්ලා.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

ඔය වාගේ පළාත් පාලන ආයතන ඕනෑතරම් තිබෙනවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, ඒ පළාත් පාලන ආයතනවලට වඩා කොළොන්නාවේ තත්ත්වය වෙනස්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා විවාදයකට යන්න දෙන්න බැහැ. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය කරුණාකරලා කෙටියෙන් කියන්න කෝ.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

වෙඩි තියා ගන්නවා. තුවක්කුවලින් ගහ ගන්නවා. අනෙකුත් දේශපාලන නියෝජිතයන්ට තර්ජනය කරනවා. මේ කොළොන්නාව නගර සභාවට ගිහිල්ලා වැඩ කර ගන්න බැහැ. ගේට්ටුවෙන් ඇතුළු වෙන කොට මන්ත්‍රීවරයෙකුට වුණත් එතැන ඉන්න හෙංචයියෝ ටික, එහේ ඉන්න මන්ත්‍රීවරයාගේ ගෝලයෝ ටික තර්ජනය කරනවා. මොනවාටද ආවේ කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමාගේ කථාව අවසන් කරන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඒ නිසා ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ කොළොන්නාවේ තත්ත්වය සොයා බලන්න. විශේෂයෙන්ම මේ ලේකම්වරිය යවලා තිබෙනවා, පළාත් පාලන කොමසාරිස් -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මට දිගින් දිගටම කාලය දෙන්න බැහැ. ඔබතුමා වෙන වරප්‍රසාද ප්‍රශ්න කියන්නේ. මේ පැහැදිලි කිරීම් කරන්න දෙන්න බැහැ. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු මහ ඇමතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා කොළොන්නාවේ නගර සභා පරිපාලනය සම්බන්ධයෙන් (බාධා කිරීමක්) මේවා කරන්න. අපට ආරක්ෂාව දෙන්න කටයුතු කරන්න කියලා. අනාරක්ෂිත තත්ත්වයක් කොළොන්නාවේ තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න.

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES' ANNOUCEMENTS/ MINISTERS' STATEMENTS

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

පක්ෂ භේදයෙන් තොරව මගේ උපදේශක කාරක සභාවට මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා. (බාධා කිරීමක්) ගරු සභාපතිතුමනි, මගේ උපදේශක කාරක සභාවේදී විශේෂයෙන්ම ඩෙංගු මර්දන කටයුතු සම්බන්ධව ගරු මන්ත්‍රීතුමන්ලා මට ලොකු සහයෝගයක් ලබා දෙමින් අලුත් යෝජනා ඉදිරිපත් කළා. විශේෂයෙන් සහන් ප්‍රදීප් ගරු මන්ත්‍රීතුමා හොඳ යෝජනා සහ වැඩ පිළිවෙළකුත් ඉදිරිපත් කළා. ඉතින් මගේ උපදේශක කාරක සභාවේ සියලුම ගරු මන්ත්‍රීතුමන්ලාත් එක්ක ඩෙංගු මර්දන වැඩ සටහන් රාශියක් කරන්න මම සූදානම් කරලා තිබෙනවා. උපදේශක කාරක සභාවේ නොමැති ගරු මන්ත්‍රීතුමන්ලාට මම ආරාධනා කරනවා. ඩෙංගු මර්දන වැඩ සටහන් එක් එක් මන්ත්‍රීතුමන්ලා හරහා ක්‍රියාත්මක කරන්න මගේ බලාපොරොත්තුවක් තිබෙනවා. ඒ නිසාවෙන් සියලු දෙනාම මාව හෝ අපේ අමාත්‍යාංශයේ ලේකම්තුමාව අමතන්න කියලා ආරාධනා කරනවා. එතකොට අපට මේ වැඩ සටහන ශක්තිමත්ව ඉස්සරහාට ගෙනයන්න පුළුවන්. දැන් වෙනදාට වඩා ඩෙංගු මර්දන වැඩ සටහන සාර්ථකව කෙරෙමින් තිබෙනවාය කියන එක සන්තෝෂයෙන් මතක් කරන්න ඕනෑ. මාධ්‍ය හරහාත් අපට උදව් කළ බව, විශේෂයෙන් සිරස මාධ්‍ය ඉහුකක් උදව් කළා. ඒකත් මතක් කරන්නට ඕනෑ. බොහොම ස්තුතියි.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව රාජ්‍ය ආයතනයකින් සිදු වී ඇති නීතිවිරෝධී කාරණාවක් ගැන කරුණු කීමට. එතුමා මේ අවස්ථාවේ සභා ගර්භයේ නැහැ. මීළඟට මංජු ශ්‍රී අරංගල විපක්ෂ නායකතුමාට අවස්ථාව.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, පළාත් පාලනය මේ රටේ කීර්තිමත් දේශපාලඥයෝ ගණනාවක් තනපු තැනක්. අපි හිතනවා පළාත් පාලන ආයතනවලින් බිහි වුණු අපේ රටේ කීර්තිමත් දේශපාලන නායකයෝ ගණනාවක් හිටිය බව. ඔවුන් තමන්ගේ ගෞරවය ආරක්ෂා කර ගත්තා. තමන්ගේ සභිකත්වය, මන්ත්‍රීකම ආරක්ෂා කර ගත්තා. ඒ නිසාම මේ රටේ කීර්තිමත් ආයතනයක් බවට පළාත් පාලන ආයතන පත් වුණාය කියන එක ප්‍රථමයෙන්ම මතක් කරන්නට ඕනෑ. නමුත් මේ මෑත කාලය තුළ පළාත් පාලනය සහ එහි සභාපතිවරු, මන්ත්‍රීවරු පැති ගණනාවකින්ම ඉතාම අපකීර්තිමත් තත්ත්වයට පත් වෙලා තිබෙනවාය කියන එක මතක් කරන්නට ඕනෑ. එකක් තමයි අද මන්ත්‍රීවරුන්ගේ දඩබ්බරකම් නිසාම සභාවත්, ඒ වාගේම මන්ත්‍රීකමත්, සභාපතිකමත් අද ඉතාම පහළ මට්ටමට වැටිලා, පරිහානියට පත් වෙලා තිබෙනවාය කියන එක නිරන්තරයෙන් අපට අහන්න, දකින්න තිබෙන දෙයක්. ඉතාම ආසන්න සිද්ධිය බැලුවත් ඊයේ පෙරෙයිදා කොළොන්නාවේ ඇති වුණු සිද්ධිය තුළ අද සභාපතිවරයා රිමාන්ඩ්ගත වෙලා තිබෙනවා. තමන්ගේ උප සභාපතිවරයාට පිස්තෝලයෙන් පහර දෙන්න ගිහිල්ලා කියලයි කියන්නේ. ඒකේ ඇත්ත නැත්ත මම දන්නේ නැහැ. මේ නිසාම පළාත් පාලන ආයතන, අර අනික් පැත්තෙන් අපි දන්නවා. පත්තරේ ගියා. ඇත්තද? නැත්ත ද? දන්නේ නැහැ. වී 56 ක් අරගෙන ගිහිල්ලා දන්සැලකට පැනලා කන්න ඉල්ලුවාය කියලා. ඉතින් මෙවැනි චෝදනා ගණනාවක් අනන්ත අප්‍රමාණ අද -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

මොන ප්‍රාදේශීය සභාවේද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

පත්තරේ බලන්න. පත්තර බලන්නේ නැද්ද?

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හැම එකම බලන්න බැහැ ඉතින්.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එහෙම නම් කරන්න දෙයක් නැහැ. (බාධා කිරීමක්) ඒ නිසා මේ හැම තැනම -

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

නම කියන්න බැහැ. වණ්ඩියා නම් නම කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මම කාගේවත් නම් කියන්න ඕනෑ නැහැ. (බාධා කිරීම්) ඔබතුමා හය වෙලා ඉන්නේ බියගම මුදලාලි පෙරේතයෙක් විධියට එයි කියලා. මතක තියා ගන්න. බියගම විලේජ් මුදලාලි. ඒ නිසා අපි එක පැත්තකින් කියනවා, මේ පළාත් සභාවේ ආයතනවල අද නරක කිරීම නිසාම ඒ පළාත් පාලන ආයතනය ඉතාම අගෞරවයට පත් වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් තමයි මේ පළාත් පාලන ආයතනවල ගරු මන්ත්‍රීවරුන්ට වඩා අද වැඩියෙන්ම බිහි වෙලා ඉන්නේ කොන්ත්‍රාත්කාරයෝ. සමහර මන්ත්‍රීවරු කොන්ත්‍රාත් ලිපිගොනු අරගෙන අදාළ නිලධාරීන් ළඟට ගිහිල්ලා මේක ඉක්මණට කරලා දෙන්නය කියලා අර නිලධාරීන්ට වැඳ වැටෙන තත්ත්වයන් ඇති වෙලා තිබෙනවා. අනික් පැත්තෙන් මූල්‍යමය වශයෙන් අපේ සභාවල මන්ත්‍රීවරු, සභාපතිවරු ඉතාම පරිහානියට පත් වෙමින් තිබෙනවා. ඒ වාගේම අපි දන්නවා, අද ආණ්ඩුව මේ රජය මගින් ග්‍රාමීය මට්ටමේ සංවර්ධනයට විශාල මුදල් කන්දරාවක් පල්ලෙහාට කාන්දු කරලා තිබෙනවා. අපි ඒක පුද්ගලිකව දන්නවා. අද මේ කොන්ත්‍රාත් ටික කර ගන්න මන්ත්‍රීවරු පුදුම වෙහෙසක් ගන්නේ. මේ කෙටි කාලය තුළ කීයක් හරි හම්බ කර ගන්න ඕනෑය කියන චේතනාවෙන් සභාවේ ගෞරවය, මන්ත්‍රීවරුන්ගේ ගෞරවය අද විනාශ වෙමින් යනවා. ඒ නිසා අපි මතක් කරන්නේ, වෙන මොකුත් නොවෙයි. අද මන්ත්‍රීවරුන් හැටියට ඉන්න සමහර මන්ත්‍රීවරු හම්බ වෙන්න ඕනෑ නම් ඒ අය හම්බ වෙන්න යන්න වෙලා තිබෙන්නේ පාරවල්වල තාර දාන තැන්වලට. නැත්නම් සමහර මන්ත්‍රීවරු අද ලඹ කැටෙයි මේසන් හැන්දයි අර ගෙන පාලම් බෝක්කු යට ප්‍රතිසංස්කරණය කරන තරමට පත් වෙලා තිබෙන්නේ. මන්ත්‍රීවරියක් ගල් අල්ලන්න හැදුවාම තව මන්ත්‍රීවරයෙක් ගිහිල්ලා පාරට ගල් හලාගෙන යනවා. මේ හෝමාගම කිරිවත්තුඩුව පැත්තේ. (බාධා කිරීම්) අපට කවදාවත් චෝදනාවක් නැහැ. (බාධා කිරීම්) මම හිතන්නේ, අපි ඔබතුමා මාර්ගයෙන් ගරු ප්‍රධාන අමාත්‍යතුමාට කියන්නේ. පළාත් පාලන ආයතන නියාමනය කිරීමේ වගකීම තිබෙන්නේ අපට. මීට වඩා සංවරයක් මේ පළාත් පාලන ආයතන තුළ ඇති කිරීමේ මූලික වගකීම ගරු ප්‍රධාන අමාත්‍යවරයාට භාර ගන්නය කියන එක ඔබතුමා මාර්ගයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රසන්න රණතුංග - ප්‍රධාන අමාත්‍යතුමා**
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක්. අපේ විරුද්ධ පක්ෂයේ නායකතුමා කියනවා මන්ත්‍රීවරිය ගල් අල්ලන එකේ වගකීම මට ලූ තිබෙන්නේ. ඒ වගකීම භාර ගන්න බැහැ ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. ඔබතුමා ඒවාගේ ඒවාට සම්බන්ධ නැහැ. ඔබතුමා ගල් අල්ලන වැඩේට සම්බන්ධ නැහැ. මම දන්නවා.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, පසුගිය සති අන්තයේ මට ලියුමක් ලැබුණා. CD පටියකුත් එක්ක.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ශීර්ෂය යොදා තිබුණේ අලුත්ගම කථාවේ ඇත්ත නැත්ත කියලා. ඊළඟට ඒ CD පටියේ දාලා තිබුණා, අලුත්ගම සිදුවීමේ පළමු ගල ගැසුවේ කවුද? මුස්ලිම්වරුන්ද? බෞද්ධයින්ද? ගරු සභාපතිතුමනි, අපි බහුවාර්ගික, බහු ආගමික රටක්. ඒ නිසා හැම පුද්ගලයෙකුගේම අයිතිවාසිකම් ගැන සැලකිල්ලට ගැනීම ජනතා නියෝජිතයන් විධියට අපට තිබෙනවා වගකීමක්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

කිසියම් ආගමික කණ්ඩායමකට එරෙහිව ගොඩ නැගුණු ප්‍රශ්න මාලාවක් මේකේ අඩංගු කරලා තිබෙන බව.

ගරු සභාපතිතුමනි, අලුත්ගම ප්‍රශ්නය පිළිබඳව මේ සභාවේදී අපි අවස්ථා ගණනකදී සාකච්ඡා කරන්න සූදානම් වුණා. නමුත්, ඒකට ඉඩ ප්‍රස්ථාව ලබා දුන්නේ නැහැ. එය අවස්ථා ගණනාවකදීම පරාජය කරනු ලැබුවා. අපි මේ ප්‍රශ්නය සාකච්ඡා කරමු, විවාද කරමු කියලා අවස්ථාවක් තිබියදී මේ සභාවේ ඊට අවස්ථාව ලබා නොගෙන මේ විධියට ලිපියක් යැවීම සහ ගරු සභාපතිතුමනි,

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

[ ගරු සුසිල් කිඳෙල්පිටිය]

මේක පෞද්ගලික දෙයක් විධියට ප්‍රකාශ කරන්න පුළුවන්. නමුත් ගරු සභාපතිතුමනි, අපි දන්නේ නැහැ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

කොහේට කොහේට ගියාද කියලා. මන්ත්‍රීවරයෙක් විධියට මට ලැබෙන්න පුළුවන්.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

අය අතට යන්න පුළුවන්. තානාපතිවරුන් අතට යන්න පුළුවන්. වෙන රටවල් අතට යන්න පුළුවන්. ඒ නිසා බැලූ බැල්මට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

පළමුවැනි ගල ගැහුවේ කවුද කියලා මේක කෙළින්ම සාධාරණීයකරණය කරන්න හදනවා, මුස්ලිම්වරුන් කියලා. ඒ නිසා මුස්ලිම්වරුන්ද බෞද්ධයන්ද පළමු ගල ගැහුවේ කියන එක සාකච්ඡා කළ යුතුයි. අපි තර්ක කළ යුතුයි. ඒ නිසා ඒ සඳහා ඉඩකඩ ලබා ගන්නවා වෙනුවට, ඒ සඳහා අපි සාකච්ඡා මාර්ගයෙන් මේ ප්‍රශ්නය විසඳන්න කටයුතු කරනවා වෙනුවට

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

බස්නාහිර පළාත් සභාවේ මන්ත්‍රීවරයෙක් විධියට මම ලැජ්ජා වෙනවා. මේක ඉතාම නිහීන තුච්ඡ ක්‍රියාවක් විධියට සඳහන් කරන්න කැමැතියි.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද යවලා තිබෙන්නේ?

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

පොඩ්ඩක් ඉන්න මම කියන්නම්. සාකච්ඡා කරන්න කැමැතියි. අනික් කාරණය

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

සමහර අවස්ථාවලදී මේක ප්‍රතික්ෂේප කරපු අය, මේකේ සම්බන්ධයක් නැහැයි කියපු අය මේ මෙහෙයුම පිටිපස්සේ හිටියාය කියන එක මේකෙන් පේනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, පළාත් සභාව මේකට හොඳ සාකච්ඡා මණ්ඩපයක් කර ගනිමු. පළාතේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්න මේක යොදා ගනිමු. වාර්ගික සමඟිය ඇති කරන්න මේ පළාත් සභාව යොදා ගනිමු.

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මම විශේෂයෙන්ම මේ වන විට රටේ ජාතික විභාගවල මතු වෙලා තිබෙන ගැටළු සම්බන්ධයෙන් මේ සභාවේ අවධානය යොමු කරන්න අද බලාපොරොත්තු වෙනවා. මේ වන විට සාමාන්‍ය පෙළ සහ උසස් පෙළ විභාගයට මුහුණ දෙන දරුවන්ගෙන් 20% කට වැඩි ප්‍රමාණයක් ජීවත් වෙන්නේ අපේ පළාත තුළ සහ අපේ පාසල් තුළ තමයි ඔවුන් අධ්‍යාපනය හදාරන්නේ. ඒ නිසා දැන් මේ වන විට මේ විභාගවල මතු වෙලා තිබෙන ගැටළු අපේ පළාතේ වාගේම මුළු රටේම දරුවන්ටත් බරපතළ ලෙස බලපාන කාරණයක් බවට පත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම එක පැත්තකින් විභාගවල ප්‍රශ්න පත්‍ර පිට වෙනවා. විභාග දෙපාර්තමේන්තුවෙන් ප්‍රශ්න පත්‍ර පිට වෙනවා. ඒ වාගේම ප්‍රශ්න පත්‍රවල දෝෂ තිබෙනවා. ඒ විතරක් නොවෙයි, දැන් විභාග ශාලාවල විවිධ අර්බුද, විවිධ දෝෂ ඇති වෙලා තිබෙනවා. (බාධා කිරීම්) ගරු සභාපතිතුමනි, දැන් මට මගේ කථාව කරන්න විධියක් නැහැ. ඔබතුමා සභාව නිශ්ශබ්ද කරනවා නම් හොඳයි. මම හිතන්නේ, මෙතුමන්ලාගේ දරුවන්ටත් ඒක වැදගත්. මම මේ මතු කරන කාරණය මගේ පෞද්ගලික කාරණයක් නොවෙයි. පොදුවේ සමස්තයක් ලෙස මේ රටේ සියලු දෙනාට අදාළ කාරණයක්.

දැන් 2012 වසරේ ශිෂ්‍යත්ව විභාගයේ ප්‍රශ්න පත්‍රය පිට වුණා. ඉතා පැහැදිලිව මම ඒක රටට හෙළිදරව් කළා. ඒ වාගේම දෙමව්පියෝ විශාල ප්‍රමාණයක් මේ ශිෂ්‍යත්ව ප්‍රශ්න පත්‍රය පිට වුණු අවස්ථා, සාකච්ඡා කරපු අවස්ථා ගැන කරුණු කිව්වා. ඊත් එක්කම 2012 විද්‍යාව ප්‍රශ්න පත්‍රයත් පිට වුණා. එය පෞද්ගලික උපකාරක පන්තිවල සාකච්ඡා කළා. දැන් කුමක්ද සිදු වෙලා තිබෙන්නේ? දැන් සිදු වෙලා තිබෙන කාරණය තමයි විභාග දෙපාර්තමේන්තුවට,

මේ ආණ්ඩුවට හැකියාවක් නැහැ ප්‍රශ්න පත්‍ර පිට වෙන එක වළක්වන්න. ප්රශ්න පත්‍ර පිට වෙන එක වළක්වන්න බැහැ. විභාග දෙපාර්තමේන්තුවේ ප්‍රශ්න පත්‍ර එළියට එනවා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? එළියට එන ප්‍රශ්න පත්‍රය එළියේ සාකච්ඡා කරන එක තහනම් කරලා තියෙනවා. වැඩමුළු තියලා, සම්මන්ත්‍රණ තියලා, උපකාරක පන්ති තියලා ඒ පන්ති ඇතුළේ, වැඩමුළු ඇතුළේ, සම්මන්ත්‍රණ ඇතුළේ ප්‍රශ්න පත්‍රය සාකච්ඡා කරන එක තහනම් කරලා තිබෙනවා. ප්‍රශ්න පත්‍රය එළියට එන එක වළක්වන්න බැහැ. ඒ හිල් වහන්න බැහැ. ඒ නිසා දැන් කරලා තිබෙන දේ තමයි. නීති ගෙනැල්ලා තිබෙනවා. එළියට ආපු ප්‍රශ්න පත්‍රය සාකච්ඡා කරන එක තහනම් කරලා. ඒකෙත් ඇත්ත ගත්තොත් එහෙම සාමාන්‍ය දරුවන්ට තමයි ඒකේ අවැඩක් වෙලා තිබෙන්නේ. මොකද, අති විශාල මුදල් ගෙවලා පෞද්ගලිකව තම තමන්ගේ නිවෙස්වලට ගුරුවරුන්ව ගෙන්වලා දරුවන්ට උගන්වන ඒ පවුල්වල අයට මේකේ කිසි ප්‍රශ්නයක් නැහැ. හැබැයි, අර අපි කියන Hall Classes, එහෙම නැත්නම් සම්මන්ත්‍රණ වැඩ මුළුවලට සහභාගී වන දරුවන්ට තමයි මේ ප්‍රශ්න මතු වෙලා තිබෙන්නේ.

ඒ වාගේම දැන් අලුතෙන්ම මතු වුණු ප්‍රශ්නය තමයි 2014 දැන් පවත්වන උසස් පෙළ විභාගයේ ආර්ථික විද්‍යාව ප්‍රශ්න පත්‍රය සම්බන්ධයෙන් මතු වුණු ප්‍රශ්නය. එතකොට ආර්ථික විද්‍යාව පළමු ප්‍රශ්න පත්‍රයේත්, ඒ වාගේම දෙවැනි ප්‍රශ්න පත්‍රයේත් දෝෂ රැසක් තිබුණා. මේ දෝෂ මෙලෙස ඇති විය හැකි බවට පසුගිය 2014 මැයි මාසයේ 12 වැනිදා මේ රටේ විශ්ව විද්‍යාල ආචාර්යවරු, ආර්ථික විද්‍යාව උත්තර පත්‍ර ඇගයීම්වලට සහභාගී වන ආචාර්යවරු 50 කට ආසන්න සංඛ්‍යාවකගෙන් 39 දෙනෙකු අත්සන් කරලා, විභාග කොමසාරිස්වරයාට මේ ප්‍රශ්නය ලිඛිතව දැනුම් දුන්නා. මෙවැනි දෝෂ ඇති වෙන්න පුළුවන්. ආර්ථික විද්‍යාවේ මෙහෙම ප්‍රශ්නයක් ඇති වෙන්න පුළුවන් කියලා දැනුම් දුන්නා. හේතුව තමයි, ආර්ථික විද්‍යාව ප්‍රධාන පාලක පරීක්ෂකවරයා ලෙස කටයුතු කරපු මහාචාර්යවරයා මේ තනතුරෙන් ඉවත් කළා. දැන් මාධ්‍ය වාර්තා කරන විධියට එතුමා උපකාරක පන්ති කරනවා. සම්මන්ත්‍රණ කරනවා. එහෙම කරලා මේ කරුණු එළියට දානවා. ඒ නිසා ඉවත් කළා කියලා තමයි ආණ්ඩුව කියන්නේ. එතකොට ඔහු ඉවත් කළා නම්, අපි ඔහු වෙනුවෙන් පෙනී සිටින්නේ නැහැ. ඔහු ඉවත් කළා නම් ඊළඟට කළ යුතුව තිබුණේ දෙවැනි මහාචාර්යවරයා මේ තනතුරට පත් කරන එක. ඔහුත් ඉවත් කළා. ඔහුත් සුදුසු නැත්නම් ඊළඟට කරන්න ඕනෑ තුන්වැනි මහාචාර්යවරයා මේ තනතුරට පත් කරන එක. ඔහුත් ඉවත් කළා. මේ පැනල් එකේ හිටපු තුන් දෙනාවම ඉවත් කළා. ඉවත් කරලා අලුත්ම කණ්ඩායමකට මේක දුන්නා. දැන් වෙන කොට මම ඉතා වගකීමෙන් කියනවා. මේ වැරදුණු ප්‍රශ්න නිවැරදියි කියලා කියන්න මහ බැංකුවත් උපයෝගී කර ගෙන තොරතුරු සකස් කරනවා. එවැනි තත්ත්වයකට අද පත් වෙලා තිබෙනවා. දැන් මොකක්ද කරලා තිබෙන්නේ? ප්‍රශ්න පත්‍රය වැරදියි. වැරදි ප්‍රශ්න පත්‍රය වෙනුවට නිවැරදි ප්‍රශ්න පත්‍රයක් දෙන්න හැකියාවක් නැහැ. මාස හතරක්. කල්පනා කරලා බලන්න. මේ උසස් පෙළ ප්‍රශ්න පත්‍ර මාස හතරක් හදනවා. මාර්තු මාසේ අග ඉඳලා තමයි ප්‍රශ්න පත්‍ර හදන්න සකස් කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න පත්‍ර හදන්න සූදානම් කරන්නේ. එතකොට මාස හතරක් හදපු ප්‍රශ්න පත්‍රය තමයි මේ වරදින්නේ. වාර විභාග ප්‍රශ්න පත්‍රයක් නොවෙයි. සතියෙන් දෙකෙන් හදපු එකක් නොවෙයි. මාස හතරක් හදපු ප්‍රශ්න පත්‍රය තමයි වරද්දලා තිබෙන්නේ. එතකොට එහෙම වරද්දන්න බැහැ. මේක ඉතාමත් තීරණාත්මක කඩඉම් විභාගයක්. මම කියනවා, එක මුද්‍රණ දෝෂයක්වත් තිබෙන්නට බැහැ. මම මේ සභාවට යෝජනා කරනවා. ඔබතුමන්ලාට කියනවා. එක මුද්‍රණ දෝෂයක්වත් තිබෙන්නට බැහැ. මොකද, මාස හතරක් තිස්සේ හදපු ප්‍රශ්න පත්‍රයක් එහෙම වරදින්න බැහැ. වැරැද්දුවා. වරද්දලා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, ප්‍රකාශය අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉවර කරනවා. අද මොකද කරන්න යන්නේ? ප්‍රශ්න පත්‍රය වැරදුණු එක හදන්න බැහැ. වැරදුණු ප්‍රශ්න පත්‍රය ගැන රටට කියන එක වළක්වන්න සී.අයි.ඩී. එකට යනවා. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුවට යනවා. නඩු දාන්න

[ ගරු මහින්ද ජයසිංහ]

යනවා. ඉතින් අපි කියන්න කැමැතියි. මම එකපාරකුත් ගියා ඔය හතරවැනි තට්ටුවට. අපි ලැහැස්තියි හතර වන තට්ටුවට නොවෙයි, ඕනෑ තට්ටුවකට යන්න මේ රටේ දරුවන්ගේ නිදහස් අධ්‍යාපන අයිතිය රැකදීම වෙනුවෙන්. ඒ නිසා ගරු සභාපතිතුමනි, විභාග සම්බන්ධයෙන් මට තව එක කාරණයකට ඉඩ දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. කාලය දෙන්න බැහැ ඔබතුමාට. මට කාලය මදි. ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

අවසන් කරනවා. ශාලාධිපතිවරු පත් කිරීමේදීත් මේ ගැටළුව මේ විධියටම මතු වෙලා තිබෙනවා. ඊයේ කළුතර සර් ජෝන් විදුහලේ උදේ සවස ප්‍රශ්න පත්‍ර දෙක මාරු කරලා දුන්නා. ඇයි මෙහෙම වෙලා තියෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමාට තවත් කාලය දෙන්න මට අමාරුයි. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමා කථාව අවසන් කරන්න.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ සියලු නිරීක්ෂකවරු, ශාලාධිපතිවරු බහුතරයක් පත් කිරීම දේශපාලන හිතවත්කම් මත කරන්නේ. කළුතර කවුද නිරීක්ෂකවරු පත් කරලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ආණ්ඩුවේ රෝහිත අබේගුණවර්ධන ඇමතිවරයාගේ ඥාතියෙක්. ඔහු තමයි මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දිගින් දිගටම කාලය ගන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, මේ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු සභාපතිතුමනි, මේකේ ඕනෑ තරම් වල්පල් කියවනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක වෙනම දෙයක්. එහෙම නම් කාලය ඉල්ලා ගන්න වෙන අයෙකුගෙන්.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඕනෑ තරම් කෑ ගහනවා. වල් පල් කියවනවා. මම ඉතාම වැදගත් කාරණයක් මතු කරන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් ඉතින් කාලය ඉල්ලා ගන්න. විපක්ෂයෙන් කාලය ඉල්ලා ගන්න. මට කාලය දෙන්න අමාරුයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා විනාඩියක් දෙන්න. ඔබතුමා මට විනාඩියක් දෙන්න. මේ සභාවේ ඇති තරම් වල් පල් කියලා කෑ ගහනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

36(1) රීතිය යටතේ මම මේ සියලුම ගරු මන්ත්‍රීවරුන් වෙනුවෙන් කථා කරන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට න්‍යාය පත්‍රයට යන්න බැහැ ගරු මන්ත්‍රීතුමා. විනාඩි 13 යි විපක්ෂය වෙනුවෙන් තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා මේ ශාලාධිපතිවරු පත් කරන්නේ දේශපාලන හිතවත්කම් නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා. මේ සභාව කෝලම් මඩුවක් කරන්න එපා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කරුණාකරලා වාඩි වෙන්න කියන්න.

**ගරු හෙක්ටර් බෙත්මගේ**
Hon. Hector Bethmage

හැන්සාඩ් එකෙන් අයින් කරන්න. හැන්සාඩ් එකෙන් කථාව අයින් කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය දුන්නා නේ?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මේ සභාවේ රීති තිබෙනවා, රීති -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

තප්පුලන්නේ නැතිව ඉන්නකෝ. ඔබතුමන්ලාගේත් දරුවන් වෙනුවෙන් කථා කරන්නේ. පොඩ්ඩක් තප්පුලන්නේ නැතිව ඉන්න. (බාධා කිරීම්) විභාග අවුල් කළාම ඔබතුමන්ලාගේ දරුවන්ටත් ඒක බලපානවා. ප්‍රශ්න පත්‍ර එළියට දැම්මාම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා දරුවාගේ මට්ටමට යන්න එපා. ඔබතුමා මන්ත්‍රීවරයෙක්.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ප්‍රශ්න පත්‍ර එළියට දැම්මොත් ඔබතුමන්ලාගේ දරුවන්ටත් ඒක බලපානවා. විභාග අවුල් කරන කොට ඒක ඔබතුමන්ලාගේ දරුවන්ටත් බලපානවා. ඒ නිසා - (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා ඔබතුමා මේ දරුවෙක් වෙන්න හදන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

පොඩ්ඩක් ඉන්නකෝ තප්පුලන්නේ නැතිව. හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, මම ඔබතුමාට ගරු කරනවා. සෞඛ්‍ය ඇමතිතුමා ඔබතුමාටත් ගරු කරනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. ගරු මන්ත්‍රීතුමා වාඩි වෙන්න. කාලය ඉවරයි.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඔබතුමා තප්පුලන්නේ නැතිව ඉන්න කෝ. මට ඉවර කරන්න දෙන්න කෝ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාඩි වෙන්න. ඔබතුමාගේ කාලය ඉවරයි.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඉතින් මට ඉවර කරන්න දෙන්න කෝ ගරු සභාපතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය ඉවරයි. ඔබතුමා දරුවෙක් වෙන්න හදන්න එපා. ඔබතුමා මන්ත්‍රීවරයෙක්.

[සභාවේ ඝෝෂා]

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මුළු රටම කනවා. විභාගත් කනවා. ඒකයි අපි මේ කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න ගරු මන්ත්‍රීතුමා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

විභාග ටිකත් කාලා දැන් මේ රටේ දරුවන්ගේ අනාගතය විනාශ කරනවා. ඒකයි අපි මේ කථා කරන්නේ. ඒකයි අපට තිබෙන කැක්කුම. ඒ කැක්කුමට වේදනාවට මේ කථා කරන්නේ. හරිද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

බන්දුල ගුණවර්ධනගේ දේශපාලන වේදිකාව තමයි Panel එක වෙනස් කළේ. ඒකයි අපි කථා කරන්නේ.

[සභාවේ ඝෝෂා]

පොඩ්ඩක් ඉන්න. තප්පුලන්නේ නැතිව ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩි වෙන්න. ඔබතුමා මූලාසනයට ගරු කරන්න. ඔබතුමා දරුවෙක් වෙන්න එපා.

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ඒ නිසා මම මේ පළාත් සභාවට යෝජනා කරනවා. (බාධා කිරීම්) දේශපාලනීකරණය වහාම නතර කරන්නය කියලා යෝජනා කරමින් මම නිහඬ වෙනවා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වන්න. සභාව කර ගෙන යන්න බැහැ මේ විධියට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ මගේ වරප්‍රසාද ප්‍රශ්නයක් මතු කරන්න තිබෙනවා. සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා මා විසින් පෞද්ගලිකව යවනු ලැබූ ලිපියක් සම්බන්ධයෙන් කරුණු මෙම සභාවට ඉදිරිපත් කළා. ඒ මට තිබෙන අයිතියක්. මේ රටේ සිදු වන යම් යම් සිදුවීම් සම්බන්ධයෙන් මගේ පෞද්ගලිකව කරුණු පැහැදිලි කිරීම් තිබෙනවා. ඒ කරුණු පැහැදිලි කිරීම - (බාධා කිරීම්)

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කැඩුණු වරප්‍රසාදය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. එතුමා 36 (1) රීතියට අදාළව කථා කරන්නේ. පොඩ්ඩක් අවස්ථාව දෙන්න එතුමාට. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කැඩුණු වරප්‍රසාදය මොකක්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. අහගන්න පොඩ්ඩක්. එතුමාට ඉඩ දෙන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමා බුරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට ඉඩ දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමාගේ කැඩුණු වරප්‍රසාදය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. කියන්න ඉඩ දෙන්න පොඩ්ඩක්.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නැහැ. නැහැ. එතුමා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කියන්න දෙන්න පොඩ්ඩක්. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

පොඩ්ඩක් කියන්න දෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමාගේ කැඩුණු වරප්‍රසාදය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා වාඩි වෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කියන්න දෙන්න කාරණාව.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම කියන්න දෙන්න බැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා වාඩිවෙන්න. එතුමාට අවස්ථාව දෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

මා විසින් යවන ලද ඒ ලිපිය ඔබතුමන්ලා සභාවට ඉදිරිපත් කරන්න. මුළු සභාවම දැන දැන -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, එතුමාගේ වරප්‍රසාදයක් කැඩිලා නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වාඩි වෙන්න. මම බලා ගන්නම් ඒක. කරුණාකරලා වාඩි වෙන්න ඔබතුමා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

මට පුද්ගලිකව පැහැදිලි කරන්න තිබෙන ඒ අයිතිය -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් මටත් නැගිටලා කථා කරන්න පුළුවන් නේ එහෙම නම්. මමත් 36(1) යටතේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම ඔබතුමාටත් දෙන්නම් අවස්ථාව. ඔබතුමාත් කියන්න ඕනෑ එකක්. 36(1) දෙන්නම් ඔබතුමාට.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

මගේ වරප්‍රසාද උල්ලංඝණය කිරීමක් කරලා තිබෙන්නේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නිකම් වරප්‍රසාද කථා කරන්න දෙන්න බැහැ නේ එහෙම නම්?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇයි මට පුළුවන්. මම දෙන්නම් අවස්ථාව. ඔබතුමා කථා කරන්න.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමා සභාපතිද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එහෙම නම් අපිත් කථා කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කථා කරන්න. මම දෙන්නම් ඔබතුමාට අවස්ථාව. 36(1) දෙන්නම්.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔබතුමා කලින් වෙලාවක් ඉල්ලා ගන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ගරු සභාපතිතුමනි පෞද්ගලිකව මා විසින් යවනු ලැබූ ලිපියක්. අලුත්ගම සිද්ධිය සම්බන්ධයෙන් මේ රටේ විශාල මාධ්‍ය වාරණයක් ඇති වුණා. ඒ පිළිබඳව කරුණු පැහැදිලි කරලා මම යම් මන්ත්‍රීවරු පිරිසකට ලිපියක් යොමු කළා. ඒ සමඟ CD තැටියකුත් යොමු කරලා තිබෙනවා. ඉතින් ඒ පිළිබඳව මෙතැන මට නිග්‍රහ කරන්න, මට අවමන් කරන්න එය හෙලා දකින්න කිසිදු අයිතියක් නැහැ, මේ සභාවේ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මොකක්ද නිග්‍රහ කළේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉන්න කෝ. ඔබතුමාගේ ප්‍රශ්නයක් නොවෙයි නේ තිබෙන්නේ. ඔබතුමා මේ අහක යන ඒවාට ඔලුව දාන්න යන්න එපා. ඔබතුමා පැත්තකට වෙලා ඉන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

කිසිදු ආකාරයක ඒ ලිපියෙන් වාර්ගික වශයෙන් කුපිත කිරීමක් හෝ වෙනත් ආකාරයක ආගම්වාදයක්, ජාතිවාදයක් ඇවිස්සීමක් කරලා නැහැ. (බාධා කිරීමක්) කරුණු පැහැදිලි කිරීමක් පමණයි මා කරලා තිබෙන්නේ. ඒ නිසා ඒ කරුණු සම්බන්ධයෙන් මෙතැන අවමන් කරන්න, නින්දා කරන්න එතුමාට අයිතියක් නැහැ. (බාධා කිරීම්)

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා මේ 36(1) –

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, කරුණාකරලා වාඩි වෙන්න. මම පැහැදිලි කිරීමක් කරන්නම්.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි, මට විරුද්ධව ප්‍රකාශයක් කරන්න ගියාම මගෙත් වරප්‍රසාද කඩ වීමක්. ගරු සභාපතිතුමනි, මේ ලෙටර් හෙඩ් එක පාවිච්චි කරලා ජාතිවාදය පතුරුවන්න පුළුවන්ද?

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** (කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත, පරිසර කටයුතු සහ සංස්කෘතික හා කලා කටයුතු අමාත්‍යතුමා)
Hon. Udaya Prabhath Gammanpila (Minister of Agriculture, Agrarian Development, Minor Irrigation, Industry, Environmental Affairs and Cultural and Art Affairs.)

ගරු සභාපතිතුමනි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය ටික සභාගත කරන්න.

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල** - අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය රීතිවලට යොමු කරන්න කැමැතියි. මන්ත්‍රීවරයෙක් පළාත් සභාවෙන්

බැහැරව කරන ලද යම් කාරණයක් පිළිබඳව මේ සභාවේදී ප්‍රශ්න කිරීමක් කළ නොහැකියි ගරු සභාපතිතුමනි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

බැහැ. පැහැදිලිව කරන්න බැහැ ඒක. මම ඒ ටික හැන්සාඩ් එකෙන් අයින් කරනවා. මොකද, එතුමාට ඒ අයිතිය නැහැ. මම අන්තිමට දන්නේ ඒක.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ගරු සභාපතිතුමනි,මම කාටවත් නින්දා කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා මුලින් මන්ත්‍රීවරයෙක් ගැන කිව්වේ නැහැ. අන්තිමට තමයි ඔබතුමා එතැනට ආවේ. ඒ නිසා ඔබතුමාට එහෙම කරන්න දෙන්න බැහැ ඒක. 36(1) කියලා ඔබතුමාට එහෙම කරන්න බැහැ ඒක. රීතිවල නැහැ එහෙම ප්‍රකාශයක් කරන්න. (බාධා කිරීම්) ගරු මන්ත්‍රීතුමා 34(5) රීතිය තිබෙනවා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඇයි? නිර්නාමිකව ද යවන්න කියන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, 34(5) රීතිය යටතේ තිබෙනවා සභාවෙන් බාහිරව මන්ත්‍රීවරයෙක් විසින් කරන ලද හෝ කියන ලද දෙයක් ගැන සභාවේදී පැහැදිලි කිරීම් ඉදිරිපත් කළ නොහැකිය.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

මේක යවලා තිබෙන්නේ නිර්නාමිකව නොවෙයි. නම සඳහන් කරලා. වගකීම භාර අරගෙන මේ ලිපිය යවලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඕක සභාගත කරන්න.[1]

[1] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

බෞද්ධයන්ව කුපිත කරන්න හදන්නේ. ආයිත් ආගම් වෛරයක් ඇති කරන්න හදන්නේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඒ පිළිබඳව සාකච්ඡා කරන්න අවශ්‍ය නම් මේ සභාවේ සාකච්ඡාවක් කරමු.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

දැන් මේක ඇති. නිකම් අන්තවාදී වාගේ තවත් ඕක ඇදගෙන යන්න එපා.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

හැබැයි, ඔබතුමන්ලාගේ මේ විධියට වර්ගවාදී ජාතිවාදය අවුස්සනවා කියලා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

අපි රීති අත්හිටුවලා දැන් විවාද කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

කරුණාකරලා මේ රටේ තිබෙන සහජීවනය නැති කරන්න හදන්න එපා. ඔබතුමන්ලායි වර්ගවාදය අවුස්සන්නේ. ආගම්වාදය අවුස්සන්නේ. ජාතිවාදය අවුස්සන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ජාතික හෙළ උරුමය -

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

මුස්ලිම් ජනතාව කිව්වොත් පළමු වැනි ගල ගැහුවේ කවුද කියලා. මේක විවාද කරමු මෙතැන. මේකට ලැහැස්ති වෙන්න. අපි රීති අත්හිටුවලා විවාදයක් කරමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමන්ලා කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඒ අයිතිය මට තිබෙනවා. විවාදයක් කරන්න -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ආණ්ඩුවෙන් අයින් වෙන්න. ඔබතුමා අත දික් කරන්නේ ආණ්ඩුවට. ආණ්ඩුවෙන් අයින් වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ආණ්ඩුවෙන් අයින් වෙන්න එහෙම නම්. ආණ්ඩුවට බැණ බැණ -

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වාද විවාදවලට යන්න එපා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඔබතුමා ආණ්ඩුවේ ඉඳගෙන අපි ලවා ආණ්ඩුවට ගස්සන්න හදනවා. ඒකයි මේ කරන්නේ. අපි ලවා ආණ්ඩුවට ගස්සන්න හදනවා. ඔබතුමා අයින් වෙන්න ඉස්සෙල්ලා. මේක විවාද කරන්න එන්න. විවාද කරන්න ඉඩ දුන්නේ නැහැ. ඔබතුමා එදා සභාවෙත් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඒ සත්‍ය තමයි ලියලා එවලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

කරුණු පැහැදිලි කරන්න අයිතියක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒක ඉවරයි නේ. මේ කථාව දැන් නවත්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඒක කරුණාකරලා තේරුම් ගන්න.

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ගරු සභාපතිතුමනි, මේ ප්‍රශ්නය දිගින් දිගට ගෙනියන්න අවශ්‍යතාවයක් නැහැ. තවත් අවුල් කරන්න අවශ්‍යතාවයක් නැහැ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඔය ලිපියේ කොතැනද ජාතිවාදයක් තිබෙන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තවත් අවුල් කරන්න අවශ්‍යතාවයක් නැහැ.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

අපි ඉවසීමෙන් ඉන්නේ. බොරුවට රටේ කෝලාහල ඇති කරලා - (බාධා කිරීම්) මේක හැමදාම කරන්න බැහැ. මේක ඉවරයක් කරන්න කරුණාකරලා.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

ඒක සී.අයි.ඩී. යට යවන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා ගරු මන්ත්‍රීතුමන්ලා වාඩි වෙන්න. දෙන්නම වාඩි වෙන්න. සභාව ගෙනියන්න බැහැ මේ විධියට.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

CD එක සී.අයි.ඩී. එකට යවන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒකට සම්බන්ධයක් තිබෙනවා නම් එයාව අත්අඩංගුවට ගන්න කියන්න.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ගරු මන්ත්‍රීතුමා මේක සී.අයි.ඩී. එකට නොවෙයි, පොලිස්පතිතුමාටත් යවලා තිබෙනවා. සී.අයි.ඩී. එකට -

[සභාවේ ඝෝෂා]

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

තමුන්නාන්සේලා වරප්‍රසාදවලට ජාතිය පාවා දෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

නිකම් මේක තවත් පාරන්න එපා. නවත්වන්න දැන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වන්න. මේ විධියට න්‍යාය පත්‍රයට යන්න අමාරුයි. කරුණාකරලා ඔබතුමන්ලා වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු එම්. ෂාෆි රහීම්**
Hon. M Shafi Raheem

කෝටි ගණනක වන්දි ගෙවන්නත් කවුරුත් නැහැ. ඒකේ පාඩු ගෙවන්න කවුරුත් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. ශ්‍රීනාත් ගරු මන්ත්‍රීතුමා කරුණාකරලා නිශ්ශබ්ද වන්න. ඔබතුමා අනවශ්‍ය ඝෝෂා කරන්න එපා. ඔබතුමා හැම තිස්සේම මේ -

[සභාවේ ඝෝෂා]

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක්. රීති ප්‍රශ්නයකට ඉඩ දෙන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

රීති ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොටම කථා කරන්න දෙන්න බැහැ. මෙතුමාගේ රීති ප්‍රශ්නයක් තිබෙනවා. මට රීතිය කියන්න කෝ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පෞද්ගලික පැහැදිලි කිරීම් යටතේ 34(3) සඳහන් වෙනවා, ගරු සභාපතිතුමනි පෞද්ගලික පැහැදිලි කිරීමකට අදාළ කාරණය සම්බන්ධයෙන් විවාද කරන්න බැහැයි කියලා. ඒ නිසා මන්ත්‍රී වරප්‍රසාද හැටියට ඔබතුමාගේ යුතුකමක් වෙනවා සුසිල් කිඳෙල්පිටිය ගරු මන්ත්‍රීතුමා කරන ලද පැහැදිලි කිරීමට අදාළව විවාදයකට භාජනය වන කාරණයක් යම් මන්ත්‍රීවරයෙක් කරනවා නම්, ඒක නතර කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක තමයි නතර කළේ ඉතින්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා ඒක නතර කළේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කිව්වාට අහන්නේ නැහැ නේ ඉතින්. මම කිව්වා. එතුමාට වාඩි වෙන්න කිව්වේ ඒකයි එතුමාට.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමා ආණ්ඩු පක්ෂයටයි විපක්ෂයටයි දෙවිධියකට සලකන ප්‍රතිපත්තිය නිසයි මේ දේවල් වන්නේ. ඔබතුමා ආණ්ඩු පක්ෂයටයි විපක්ෂයටයි දෙවිධියකට සලකනවා. ඒකයි වෙලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. දෙවිධියකට නැහැ ගරු මන්ත්‍රීතුමා. එතුමාට මම කිව්වා කරුණාකරලා වාඩි වෙන්න කියලා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඔබතුමාට හැකියාවක් තිබුණා 34(5) යටතේ ඒ අවස්ථාවේ ඒක නතර කරන්න. 34(5) යටතේ ඒක නතර නොකර, 34(3) යටතේ ඔබතුමා අවස්ථාව දෙනවා. එතුමාට පිළිතුරු සපයන්න. ඒක වැරැද්දක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. නැහැ. වැරැද්දක් නොවෙයි. පැහැදිලිව කිව්වා එතුමාට. එතුමාට මම පැහැදිලිව කිව්වා. වරප්‍රසාද ප්‍රශ්නයක් නොවෙයි යොමු කළේ.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ගරු සභාපතිතුමනි, මගේ නම සඳහන් කරලයි මේ ලිපිය ඉදිරිපත් කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අන්තිමට ඒක -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

ඕගොල්ලෝ නම ඇහුවා. නම ඇහුව නිසයි කිව්වේ. නැත්නම් නම කියන්නේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ටික හැන්සාඩ් එකෙන් ඉවත් කරනවා.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඔබතුමා නේ නම ඇහුවේ. ඔබතුමාගේ නම කියන්නේ නැතිව තාත්තාගේ නම කියන්නද?

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ඒක තමයි කිව්වේ, කියන්න කියලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා වාඩි වෙන්න. උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා -

**ගරු සුසිල් කිඳෙල්පිටිය**
Hon. Susil Kindelpitiya

නම ඇහුවේ ඔය පැත්තෙන්. නම අහපු නිසයි කිව්වේ.

[සභාවේ ඝෝෂා]

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න. මෙතුමාගේ රීති ප්‍රශ්නයක්.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

එදා විවාදයට ගන්න තිබුණා නේ. ඇයි ඒක ගත්තේ නැත්තේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. සභාව මේ විධියට යන්න බැහැ. ගරු ඇමතිතුමා රීති ප්‍රශ්නයක් ඉදිරිපත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක නීතියක් ක්‍රියාත්මක කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හරි. හරි. මම ක්‍රියාත්මක කරන්නම්. ඔබතුමා ඉන්න කෝ. ඔබතුමා හැමදාම මේ සභාව අවුල් කරනවා, මොකක් හරි ප්‍රශ්නයක් දා ගෙන. ඔබතුමා කියන්න කෝ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, රීති ප්‍රශ්නයක් මම ඔබතුමා වෙත යොමු කරන්නේ.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩ්ඩක් ඉන්න. මෙතුමාගේ රීති ප්‍රශ්නයක්. වාඩි වෙන්න මන්ත්‍රීතුමා. ඔබතුමාට අවස්ථාව දෙන්නම්.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ඔබතුමාගෙන් කී පාරක් අවස්ථාව ඉල්ලුවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එකපාර දෙන්නෙක් කථා කරන්න බැහැ නේ ගරු මන්ත්‍රීතුමා. (බාධා කිරීම්) රීති කියවන්න. මෙතුමා ඉස්සෙල්ලා ප්‍රශ්නය ඉදිරිපත් කරන්නේ. රීති ප්‍රශ්නය. ඔබතුමා කියන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු සභාපතිතුමනි, ඔබතුමාගේ අවධානය මම යොමු කරනවා. කාර්ය පටිපාටි රීති 8(4) ට. ඒකේ සඳහන් වෙනවා සභා රැස්වීමක් පෙ.ව. 9.30 ට ආරම්භ විය යුතුය කියලා. මේ සභාව ආරම්භ වුණු දවසේ ඉඳන් ගරු සභාපතිතුමනි, කවදාවත් 9.30 ට රැස්වීම පටන් ගත්තේ නැහැ. අදත් මේ රැස්වීම පටන් ගත්තේ 9.40 ට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ. 9.35 ට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම මේ කාරණය ඔබතුමා වෙත යොමු කරන්නේ, මහින්ද ජයසිංහ ගරු මන්ත්‍රීතුමා, එතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම අවසන් කරන්න, එතුමා පුල පුලා ඔබතුමාගෙන් ඉල්ලා සිටියා මම අවසන් කරන්න හදන්නේ, ඒකට මට ඉඩ දෙන්නය කියලා. නමුත් ඒකට ඔබතුමා මරාගෙන මැරෙන සටනක් දීලා, එවෙලේම කථාව නතර කරන්න හැදුවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම සටනක් දුන්නේ නැහැ. එහෙම අවශ්‍ය නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඉස්සෙල්ලා මේ රීතිය පටලවගන්න එපා. ගරු මන්ත්‍රීතුමා, රීතිය පටලවා ගන්න එපා. ඔබතුමා රීතිය පටලවා ගන්න එපා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඔබතුමා මට ඉස්සෙල්ලාම රීතිය පැහැදිලි කරන්න දෙන්න කෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

අපේ සභාපතිතුමාට අගෞරව කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පැහැදිලි කිරීමේ ප්‍රශ්නයක් නැහැ එතැන. පොඩ්ඩක් ඔබතුමා මට ඇහුම්කන් දෙන්න කෝ.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

මේ සභාවට අගෞරව කරන්න එපා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා නිශ්ශබ්ද වෙන්න. පෞද්ගලික පැහැදිලි කිරීම්වලට කාලය තිබෙන්නේ විනාඩි 30 යි. අපි තීරණය කරලා තිබෙනවා විනාඩි 17 ක් ආණ්ඩු පක්ෂයට. විනාඩි 13 ක් විපක්ෂයට. එතකොට අද දවසේ පෞද්ගලික පැහැදිලි කිරීම් විපක්ෂයෙන් කරුණු හතරක් ගැන මට හතර දෙනෙක් ඉදිරිපත් කරලා තිබෙනවා. එතුමාට මම විනාඩි 3 යි වෙන් කරලා තිබුණේ. නමුත් වැඩිපුරත් දුන්නා එතුමාට.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක ඇත්ත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ කාලය මට දික් කරන්න බැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභාව පරක්කු වෙනවා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම පැහැදිලි කරන්නේ. මම රීතිය පෙන්වලා දෙන්නේ. ඔබතුමා ඒක ඒ ආකාරයෙන්ම රකින්න කටයුතු කරනවා. නමුත් උදේ 9.30 ට මේ සභාව පටන් ගැනීම සඳහා ඔබතුමාගේ පැත්තෙන් ක්‍රියාමාර්ග ගන්නේ නැහැ. ඒ නිසා මම මේ රීති හරහා පැහැදිලි කරන්නේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම උපරිම උත්සාහ කරනවා පටන් ගන්න.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒ විධියටම ඔබතුමා සභාවේදි කටයුතු කරනවා වාගේම -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

උදේ 9.30 ට මේ සභාව පටන් ගැනීමට කටයුතු කරන්නේ නම් මේ රීති ආරක්ෂා වෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම පිළිගන්නවා ඒක. ගරු මන්ත්‍රීතුමා, සභා ගර්භයට එන්නට පෙර මම විමසලා බලනවා මේ සභාවේ ගණ පූරණය තිබෙනවාද කියලා.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඒක වෙනම වැඩක්. අපි 9.30 ට ඇවිල්ලා වාඩි වෙලා ඉන්නවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම 9.35 ට අද ආවේ ඒකයි. නමුත් පෞද්ගලික පැහැදිලි කිරීම්වලට මරාගෙන මැරෙන ප්‍රශ්නවලට අපි යන්න ඕනෑ නැහැ. විනාඩි 13 යි විපක්ෂයට කාලය තිබෙන්නේ. ඉතින් මට ඊට වඩා දෙන්න බැහැ කාලය. මම ඒත් දෙනවා කාලය. මෙතුමාට විනාඩි 4 යි තිබුණේ. විනාඩි 6 ක් ගත්තා එතුමා. විපක්ෂ නායකතුමා. ඉතින් ඔබතුමා කියන දේම සභාවේ යන්න බැහැ. එහෙම කරන්න අමාරුයි. මමත් කැමැතියි එහෙම කරන්න. ඒ විධියට රීතිවලට යන්න කැමැතියි. රීති වලට යන්න බැහැ.

මීළඟට උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට විනාඩි 4 ක කාලයක් තිබෙනවා. මහේල ජයවර්ධන ක්‍රීඩකයාට පළාත් සභාවේ ගෞරවය පිරිනැමීම.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් ඉදිරිපත් කරන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ආ කියන්න කෝ.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ගරු සභාපතිතුමා ප්‍රධාන මේ මුළු සභාවෙන්ම මම දැන ගන්න කැමැතියි, වරප්‍රසාද ප්‍රශ්නයක් විධියට. නවක මන්ත්‍රීවරයෙක් විධියට. මේ සභාව ආචාරශීලී, විචාරශීලී, සමාජයට වැඩදායී වන සභාවක් විධියට පවත්වාගෙන යන්න පුළුවන් සභාවක අසුන් ගෙන සිටින්න අපට වරප්‍රසාදයක් තිබෙනවාය කියලා මම විශ්වාස කරනවා. ඒ වරප්‍රසාදයට අනුව දිගින් දිගටම - පසුගිය කාලයේ මම නවක මන්ත්‍රීවරයෙක් විධියට පත් වෙලා ඇවිල්ලා අපි දැක්කා දිගින් දිගටම - මේ සභාවේ ආණ්ඩු පක්ෂයේ හෝ විපක්ෂයේ හෝ වේවා අපි සියලු දෙනාම මේ ජනතා මුදල් වියදම් කරලා තමයි මේ තැන්වලට ඇවිල්ලා ඉන්නේ, ජනතාවගේ ප්‍රශ්න කථා කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා පෞද්ගලික පැහැදිලි කිරීමක් නොවෙයි. මට වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ජනතාවගේ ප්‍රශ්න කථා කරනවා වෙනුවට මෙතැන කාලගෝට්ටි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට පෞද්ගලික පැහැදිලි කිරීම්වලට යන්න දෙන්න බැහැ. මට ඔබතුමා වරප්‍රසාදය කියන්න.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

ඒක තමයි. අපි මන්ත්‍රීවරයෙක් විධියට මට වරප්‍රසාදයක් තිබෙනවා ආචාරශීලී, විචාරශීලී සභාවක වාඩි වෙලා ඉන්න. ඒ වරප්‍රසාදය දිගින් දිගටම කඩ වෙමින් පවතිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මමත් උපරිම උත්සාහ කරනවා, ඒ වරප්‍රසාදය ආරක්ෂා කර දෙන්න.

**ගරු ජගත් කුමාර**
Hon. Jagath Kumara

ඔය ළඟ ඉන්න අයට කියන්න.

**ගරු රජිත රංගන හපුආරච්චිගේ**
Hon. Rajitha Rangana Hapuarachchige

මම කියන්නේ ආණ්ඩු පක්ෂයට සහ විපක්ෂයට. මේ දෙගොල්ලන්ටම මේ කියන්නේ. (බාධා කිරීම්) දෙගොල්ලන්ටම මම මේ කියන්නේ. (බාධා කිරීම්) ඔබතුමා ඇතුළු දෙගොල්ලන්ටම මම මේ කියන්නේ, (බාධා කිරීම්) අපේ ඒ වරප්‍රසාදය රැක දෙන්න කියලා අපි ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකරලා පොඩ්ඩක් නිශ්ශබ්ද වෙන්න. මමත් ආසයි මේ සභාව ආචාරශීලී, විචාරශීලීව යන්න. (බාධා කිරීම්) ඒක හදන්න බැහැ ඉතින්.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා, ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමාට ඇඟිල්ල දික් කරනවා. ශ්‍රීනාත් පෙරේරා මන්ත්‍රීතුමා සමානයි හෙක්ටර් බෙත්මගේ ගරු මන්ත්‍රීතුමා. එයා එහෙම කියනවා නම් සමානයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමාට විනාඩි හතරක් තිබෙනවා. කරුණාකරලා සභාව නිශ්ශබ්ද වෙන්න.

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු සභාපතිතුමනි, මම විශ්වාස කරනවා, මේ රට වෙනුවෙන් විශාල සේවයක් කරපු ඊයේ දිනයේ ටෙස්ට් ක්‍රීඩාවෙන් සමුගත්ත මහේල ජයවර්ධන අපේ ක්‍රීඩකයාව බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා ප්‍රධාන අපි හැම කෙනාගේම ගෞරවයට පාත්‍ර වෙන්න ඕනෑ කියලා. ඔහුට ගෞරවය පුද කිරීම වැදගත් කියලා හිතලයි මම මේ යෝජනාව ඉදිරිපත් කළේ. විශේෂයෙන් අපි ශ්‍රී ලංකාව වශයෙන් ගත්තාම ඉතාමත් පුංචි රටක්. යම් යම් අවස්ථා ගණනාවකදී මේ රටට ගෞරවය ලැබුණා. ඒ ගෞරවය ලැබුණු අවස්ථාවක් තමයි මේ මහේල ජයවර්ධන ක්‍රීඩකයා හරහාත් අපට ලැබුණේ. 1996 දී අර්ජුන රණතුංග මහත්මයාගේ නායකත්වය යටතේ අපේ රටට ක්‍රිකට් ලෝක කුසලානය දිනා ගත්තා. මුත්තයියා මුරලිදරන් වාගේ ක්‍රීඩකයෝ. ඒ නිසා අපේ රටේ නම ලෝකයා ඉදිරියට ගියා. ඒ වගේම මහේල ජයවර්ධන ක්‍රීඩකයාත් මේ රටේ විශාල සේවයක් කරලා ඊයේ දිනය වන කොට ජයග්‍රාහී මට්ටමෙන් ටෙස්ට් තරග 149 කට තරග කරලා, ලකුණු 11,814 ක් ලබා ගෙන, ඒ වාගේම ශතක 34 ක්, අර්ධ ශතක 50 ක්, උඩ පන්දු දෙසිය ගණනක් ලබා ගෙන මේ රටේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාව නඟා සිටුවන්න ඔහු විශාල සේවයක් කළා කියන එකයි මා විශ්වාස කරන්නේ. ඒ නිසා එම ක්‍රීඩකයා වෙනුවෙන් අපි බස්නාහිර පළාතේ හැම කෙනාගේම ගෞරවය එතුමාට හිමි කරන්නට ඕනෑ.

විශේෂයෙන්ම අපි ඉතා වගකීමෙන් රටක් ගැන බලන්න ඕනෑ. රටේ ගෞරවය ආරක්ෂා කරන, රටේ කීර්තිනාමය රකින්නට, රටට ගෞරවයක් ලබා දෙන්න මේ ක්‍රීඩකයා මොනතරම් කැප කිරීම් කළාද? ඒ හරහා අපේ රටට ලොකු කීර්ති නාමයක් ලැබුණා. ඒ වාගේම ලෝක වාර්තා ගණනාවක් බිහි කරන්න පුළුවන්කම ලැබුණා. පුද්ගලයන් වශයෙන් අපි හොඳ පෞරුෂයක් ගොඩනඟා ගන්නට ඕනෑ. අපි යමක් කරන්න පෙර අපට ලොකු උසක් ඕනෑය, ලොකු මහතක් ඕනෑය, ලොකු හැඩි දැඩි ඇඟක් ඕනෑය කියලා අපි හිතනවා. නමුත් මේ පුංචි ක්‍රීඩකයා දිහා බලනකොට අපට ඔහුගේ පෞරුෂය පිළිබඳව හිතන්න පුළුවන්. අපට යමක් කරන්න උස වැදගත් වෙන්නේ නැහැ. මහත වැදගත් වෙන්නේ නැහැ. ඔහුගේ පෞරුෂය, අපට තිබෙන්නේ යම්කිසි උට්ඨාන වීර්යය හා එක අරමුණක්. ඒ අරමුණ කරා යන කොට අපට ඒ අරමුණ කරා ගිහිල්ලා අපට ඒ දේ කරන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා මේ ක්‍රීඩකයා එදා නාලන්දා විද්‍යාලයෙන් මේ රටට බිහි වෙලා, 1997 වාගේ කාලයකදී ලංකාව නියෝජනය කරමින් ඉතාමත් හොඳින් තමන්ගේ රටට නායකත්වයක් දෙන්න ක්‍රීඩාව තුළින් කටයුතු කළා.

ඒ වාගේම අපි දන්නවා, ඉතාමත් ලස්සනට ඉස්සරහ පාදයේ Cover drive පහර ඉතා අලංකාර විධියට ගහන ක්‍රීඩකයෙක්. Late cut පහර ඉතාම ලස්සනට ක්‍රීඩා කරන ක්‍රීඩකයෙක්. Sweep පාර හොඳට ගහන ක්‍රීඩකයෙක්. මේ වාගේ පහරවල් එල්ල කරන ක්‍රිකට් ක්‍රීඩකයෙක් දකින්න මම හිතන්නේ අපට තව බොහෝ කාලයක් ගත වෙයි කියලා මම විශ්වාස කරනවා. එම නිසා අද මේ අවුරුදු 37 ක් වාගේ වයසේදී තමන්ගේ ක්‍රීඩාවෙන් තුන් ඉරියව් ක්‍රීඩකයෙක් වශයෙන් ඇවිල්ලා පස්සේ හොඳ පිතිකරුවෙක් වශයෙන් මේ රටට, ජාතියට, ලෝකයට අපේ රටේ නමට විශාල කීර්ති නාමයක් ලබා දීලා, ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමුගත්ත අපේ මහේල ජයවර්ධන ක්‍රීඩකයාට බස්නාහිර පළාත් සභාවේ ගෞරවය, ප්‍රණාමය පුද කරමින් මා නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු ලලිත් වර්ණකුමාර**
Hon. Lalith Warna Kumara

ගරු සභාපතිතුමනි, ඊයේ රෑ වුණු සිද්ධියක් පිළිබඳවයි මගේ පෞද්ගලික පැහැදිලි කිරීම සිදු කරන්නේ. රාත්‍රී 11.45 ට විතර හොරණ ගිනි නිවන ඒකකය ඉස්සරහායින් මම යන කොට ජනතාව කිහිප දෙනෙක් එතැන සිටියා. ඒ අය මාව දැකලා නැවැත්තුවාම මේ ඉන්න නිලධාරීන් සිංදු කිය කිය ඉන්නාවය කියන එක චෝදනා කළා. ඊට පස්සේ මමත් එතැන විනාඩි 10 ක් විතර ඉඳලා ඒ අයට කථා කරලා ඇහුවා, කවුද? වග කියන කෙනෙක් ඉන්නේ කියලා. මම ඊට පෙර නගරාධිපතිතුමාව සම්බන්ධ

කර ගන්න බැලුවා. සම්බන්ධ කර ගන්න බැරි වුණා. නමුත් ඒ අයට කථා කරලා ඇහුවාම කිසිම වග කියන කෙනෙක් නැහැ. අපි නොවෙයි. අපි නොවෙයි. අපට ඉහළ අය මෙතැන කවුරුත් නැහැයි කියලා චෝදනා කළා. ඊට පස්සේ මම පොලීසියට කථා කරලා කිව්වා, මෙන්න මේ අය මෙන්න මේ ආකාරයට හැසිරුණා. මේ අය රාජකාරී කටයුතුවල යෙදී සිටින්නේ. බලන්න කියලා. ඊට පස්සේ පැය 01 1/2 කින් පොලීසියේ දෙන්නෙක් බයිසිකලයකින් ඇවිල්ලා කථා කළා. මම කිව්වා එහෙම නොවෙයි, පැමිණිල්ලක් හැටියට - ඒ අවස්ථාවේ දුරකථනයෙන් පැමිණිලි කරලා. ඊට පස්සේ ඒ දෙන්නා ඇතුළට ගියා. ඒ වනකොටත් සරම් ඇඳගෙන හිටපු ඒ නිලධාරීන්ට ඒ යුනිෆෝම් ඇන්දුවේ නිලධාරීන් ඇතුළට ඇවිල්ලා. ඊට පස්සේ පොලීසියෙනුත් වගකීමක් භාර ගන්න බැහැයි කිව්වා. මම කිව්වා, මේ අය චෙක් කරලා බලන්න බීලද ඉන්නේ කියලා. නමුත් ඒ අය වගකීමක් ගන්න බැහැයි කියලා කිව්වාම උප පොලිස් පරීක්ෂක කෙනෙක් ඊට පස්සේ වෙනම ඇවිල්ලා, මගේ පැමිණිලිවලට මිනිස්සු බීලද නැද්ද කියලා බලන්න මට අයිතියක් නැහැ. මට පුළුවන්කමක් නැහැ. ඒක නගරාධිපතිතුමා කළ යුතු කාර්යයක් හැටියට සඳහන් කළා. නමුත් මම කිව්වා, නගර සභාවත්, පළාත් සභාවට වග කියන ආයතනයක් හැටියට මහජන නියෝජිතයන් හැටියට අපට යුතුකමක් තිබෙනවා කියලා. නමුත් එතැනදී පොලිසියෙනුත් කිසිම සාධාරණයක් වුණේ නැහැ. ඒ වැඩ පිළිවෙළ තුළ පොලීසියේ නිලධාරීනුත් ඇත්තටම ඒ අවස්ථාවේ ඒකමතිකව එක පැත්තකට කටයුතු කළයි කියන එකයි මම දකින්නේ.

ගරු සභාපතිතුමනි, මම ඊට පස්සේ ලිඛිතව පැමිණිලි කරලා තිබෙනවා. 131/256 පැමිණිල්ල අනුව පොලීසිය පැත්තෙනුත් අපේ කාර්යය ඉටු නොවීම පිළිබඳවත්, නගර සභාවේ ගිණි නිවන ඒකකය වගකියන විශාල දේපළක් එතැන තිබෙනවා. කිසිම වගකියන කෙනෙක් නැහැ. මීට පෙර වතුර බවුසරයක් පාරේ මැද්දේ පෙරළුනා. තවමත් ඒක එතැන. හදලා ඉවර කරලා නැහැ. විශාල මුදලක් ඇත්තටම මේ වන විට වැය වෙලා තිබෙනවා. මේවායේ වගකීම කවුද දරන්නේ කියන එක පිළිබඳවයි මම මගේ පෞද්ගලික පැහැදිලි කිරීම තුළින් කරන්නේ. ඒකේ වගකීම දරන ඒ ආයතන, පොලීසිය ඒ ආකාරයෙන් කටයුතු කිරීම පිළිබඳව ඒ අයගේ වගකීම මේ පැමිණිල්ල තුළ ගැළපෙන ආකාරයට විභාග වෙයි කියලා මම විශ්වාස කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. මේක මම හිතන්නේ සියලුම ගරු මන්ත්‍රීවරුන්ට බලපාන ප්‍රශ්නයක්. පසුගිය පළාත් සභා සැසි වාරයේදී අපට ලබා දුන්න උදේ ආහාරයෙන් පසු සමහර ගරු මන්ත්‍රීවරුන්ට අසනීප තත්ත්වයක් ඇති වුණා. ගරු සභාපතිතුමනි, මම දැනගන්න කැමැතියි. මේ ටෙන්ඩරය අවසන් වෙලාද? අලුත් ටෙන්ඩරයක් කැඳවලා තිබෙනවාද? එහෙම නැත්නම් කාගේ හරි මිත්‍රකමකට මෙය තවමත් කරගෙන යනවාද? කියන කාරණය මම දැනගන්න කැමැතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා, මේ වන විට ඒ සම්බන්ධව ටෙන්ඩර් කැඳවලා තිබෙන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, 36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අනේ ගරු මන්ත්‍රීතුමා, 36(1) පස්සේ ගමු කෝ. අපි න්‍යාය පත්‍රයට යමු. ඔබතුමාට අතවශ්‍ය දෙයක් නොවේ නේ. 36(1) කියලා මේක මේ විධියට කරන්න බැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36(1) පස්සේ ගමු කියලා කොහේ හරි තිබෙනවාද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) පස්සේ ගමු කියලා කොහේවත් නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමා 36(1) පස්සේ ගමු කියලා කොහේ හරි තියනවා පෙන්නුවොත් මම වාඩි වෙන්නම්. ඔබතුමාට ඕනෑ විධියට පාලනය කරන්නත් බැහැ. මට ඕනෑ විධියට පාලනය කරන්නත් බැහැ. රීතිවලට ඕනෑ විධියට තමයි. කොහේ හරි තිබෙනවා නම් 36(1) පස්සේ ගමුයි කියලා මම වාඩි වෙන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

36(1) රීතිය කියලා නිතරම කථා කරන්න ගියොත් මේ සභාව ගෙනි යන්න බැහැ. කරුණාකරලා ඔබතුමා වාඩි වෙන්න. පොඩ්ඩක් ඔබතුමා ඉන්න. ඔබතුමා 36(1) කියලා එක පාරක් කියනවා. ආපසු රීති ප්‍රශ්නයක් කියලා කියනවා. මේ විධියට යන්න බැහැ. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, 36(1) ගරු මන්ත්‍රීතුමන්ලාගේ වරප්‍රසාද යටතේ. මම සන්තෝෂ වෙනවා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

දෙවිධියකට සලකන්නේ ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක හරි. එතුමා ඇමැතිවරයෙක් නම් අවස්ථාව දෙන්න පුළුවන්.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

රීතියක් නම් ඔක්කොටම එකයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා 36 (1) නොවෙයි.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ විපක්ෂයේ මන්ත්‍රීවරයෙකුට ඉඩ අවස්ථාව දෙන්නේ නැත්නම් ඔබතුමා ආණ්ඩු පක්ෂයේ එක මන්ත්‍රීවරයෙකුටවත් අවස්ථාව දෙන්න එපා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

නීතිය එකයි. මෙතැන නීති දෙකක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා 36 (1) නොවෙයි. අමාත්‍යාංශ ප්‍රකාශ යටතේ එතුමා ඉල්ලන්නේ.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

36 (1) වරප්‍රසාද නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

එක නීතියයි. මෙතුමාට වරප්‍රසාද බැරි නම් අනෙක් අයටත් බැහැ.

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

ඒකත් වරප්‍රසාද තමයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා අවස්ථාව ඉල්ලන්නේ වරප්‍රසාද ප්‍රශ්නයකටද? අමාත්‍යාංශ ප්‍රකාශයකටද?

[සභාවේ ඝෝෂා]

**ගරු හර්ෂණ රාජකරුණා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

වරප්‍රසාද. වරප්‍රසාද.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අතන වරප්‍රසාද බැරි නම් මෙතැනත් බැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට හදිසි වරප්‍රසාද ප්‍රශ්නයක් නැහැ නේ? පොඩ්ඩක් වාඩි වෙන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම අමාත්‍යවරයෙක් හැටියට ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාට සහයෝගය පළ කරන්න කථා කළේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉස්සෙල්ලා -

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

සභා කටයුතු ඇමැතිවරයා හැටියට විනාඩියක් කථා කරන්න දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට අවස්ථාව දෙන්න පුළුවන්. එතුමා සභා කටයුතු අමාත්‍යතුමා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මට මූලාසනයේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා විනාඩියක් දෙන්න. ඔබතුමා කථා කරන්නේ 36 (1) යටතේද? අමාත්‍යවරයෙක් වශයෙන් කරන ප්‍රකාශයක්ද?

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ. මම සහයෝගය පළ කරන්න කථා කරන්නේ. හේතුව -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවස්ථාව දෙන්න පුළුවන්. ඇමැතිතුමා ඉල්ලුවොත් අවස්ථාව දෙන්න පුළුවන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ශ්‍රීනාත් පෙරේරා ගරු මන්ත්‍රීතුමාව -

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

මේ න්‍යාය පත්‍රයේ -

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම අහනවා, මේ වැඩ මුළුව තිබුණා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමාට, අමාත්‍යවරයෙකුට සභාවේ කථා කරන්න අවස්ථාව තිබෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු සභාපතිතුමනි, වැඩ මුළුවක් තිබුණා ඒකට මේ මන්ත්‍රීතුමන්ලා ගියේ නැද්ද?

**ගරු හර්ෂණ රාජකරුණා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Harshana Rajakaruna - Chief Opposition Whip

න්‍යාය පත්‍රයේ තියෙනවා නේ ඇමැතිවරයෙකුගේ ප්‍රකාශ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔව්. මේක මොකක් හරි හදිසි ප්‍රකාශයක්, අත්‍යවශ්‍ය කාරණාවක් සම්බන්ධයෙන්.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කැමැතිද -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමා සභාය දෙන්න හදන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, තමුනාන්සේ එක වෙලාවක එක නීතියක්. එහෙම කරන්න එපා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මේ සභාවේ මන්ත්‍රීවරු 104 දෙනා වෙනුවෙන්ම කරන රීති ප්‍රශ්නයක් මිස හුදෙක් මේ ඇති වෙලා තිබෙන තත්ත්වය මත -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කථා කරන්න අවස්ථාව දුන්නා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

බොහොම ස්තුතියි. ගරු සභාපතිතුමනි, -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මම කලින් රීති ප්‍රශ්නයට අවස්ථාව දුන්නා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කොහේද? රීති ප්‍රශ්න දෙකක් කඩ වුණාම එකෙන් කියන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔය විධියට රීති ප්‍රශ්න කියන්න ගියොත් -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

රීති ප්‍රශ්න දෙකක් කඩ වුණාම රිති දෙකම එකේ කියන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔක්කොම එක පාර කියන්න. ප්‍රශ්න ටික ඔක්කෝම එකපාර කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මේක අහන්න. ඇහුවාම තේරෙයි ඔබතුමාට මේක වටිනවා කියලා. පොඩ්ඩක් අහගෙන ඉන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මතක් වෙන, මතක් වෙන පාරට රීති ප්‍රශ්න ගේන්න ගියොත් මේ සභාව කරගෙන යන්න බැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මේක අහන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා එකපාර ඔය ටික කියන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරු 104 දෙනාම වෙනුවෙන් කථා කරන්නේ. පසුගිය 07 වැනිදා මධ්‍යම රජය විසින් තැපැල් ගාස්තු වැඩි කරනු ලැබුවා. එතකොට -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

බාධාවක්. බාධාවක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොඩි කාර්මික දෝෂයක්.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

තැපැල් ඇමැතිතුමාගේ දුවද දන්නේ නැහැ මේ වැඩේ කරන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඇහෙන්නේ නැහැ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු සභාපතිතුමනි, කමක් නැහැ. පසුගිය දවසක -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරන ප්‍රකාශය හැන්සාඩ්ගත වෙන්න ඕනෑ. Recording වෙන්න ඕනෑ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

පසුගිය දවසක මධ්‍යම රජයේ තැපැල් ඇමැතිතුමා විසින් ලංකාවේ තැපැල් ගාස්තු වැඩි කරනු ලැබුවා. රුපියල් 5/- ගාස්තුව -

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

ගරු සභාපතිතුමනි, ඒ සම්බන්ධව ගෘහ කාරක සභාවේ වාර්තාවේ තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගෘහ කාරක සභා වාර්තාවේ ඔබතුමා කියන ප්‍රශ්නය තිබෙනවා. අපි ඒ ගැන කථා කළා.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මම ඒකේ තියෙන එක නොවෙයි කියන්නේ. වෙන එකක් කියන්නේ. මම කියන එක කොහොමද මෙතුමා දන්නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

අහගෙන ඉන්න පුරුද්ද නැහැ නේ? මම මේ ගෘහ කාරක සභා වර්තාවේ තියෙන එකත් දැක්කා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

මයික්‍රෆෝනය හැදුවාම කියන්නම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා ඔබතුමා කියපු කාරණාව සම්බන්ධව පසුගිය ගෘහ කාරක සභාවේදී සාකච්ඡා කළා. මුද්දර ගාස්තු සම්බන්ධව. අපි ගත්තු තීන්දු සම්බන්ධව වාර්තාවේ පැහැදිලිව තිබෙනවා. ඒක නිසා ඔබතුමාගේ ප්‍රකාශය මෙතැනට අදාළ වෙන්නේ නැහැ.

මහේල ජයවර්ධන ක්‍රිකට් ක්‍රීඩකයාට උපහාර දැක්වීමේ ප්‍රකාශය කිරීමට සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුවෙන්ම මම ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා. ඒ වාගේම මහේල ජයවර්ධන ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා ඊයේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩාවෙන් සමු ගැනීම පිළිබඳව සහ එතුමන්ගේ ක්‍රීඩා ජීවිතය පිළිබඳව උපුල් මහේන්ද්‍ර ගරු මන්ත්‍රීතුමා බොහෝ තොරතුරු පැහැදිලි කළා. නමුත් මා බලාපොරොත්තු වෙනවා ගරු සභාපතිතුමනි, මහේල ජයවර්ධන නැමැති ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා අපේ රට වෙනුවෙන් ශ්‍රී ලාංකීක ජාතිය වෙනුවෙන් ජාත්‍යන්තර තලයේදී කරන ලද කැප කිරීම සහ එහි වැදගත්කම පිළිබඳවත්, එහි අනාගත වැදගත්කම පිළිබඳවත් මේ සභාවට කරුණු පැහැදිලි කරන්නට. ගරු සභාපතිතුමනි, අපේ ගරු මන්ත්‍රීතුමා සඳහා කළා මේ ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා වාර්තා පොත්වල තමන්ගේ නම සටහන් කරලා තිබෙන ආකාරය. ඒ ඉදිරියෙන් ශ්‍රී ලංකාවේ නම සඳහන් කරලා තිබෙන ආකාරය. ජාත්‍යන්තර ක්‍රීඩා පිටිය තුළ ශ්‍රී ලංකාවේ නම කෙතරම් උසස් මට්ටමකට ඔහු රැගෙන ගියාද කියන කාරණාව පිළිබඳව. (බාධා කිරීමක්) පාදුක්ක මන්ත්‍රීතුමා කරුණාකරලා මට අවස්ථාව දෙන්න මගේ කථාව කරගෙන යන්න. එම නිසා ගරු සභාපතිතුමනි, මේ අවස්ථාවේදී මම මේ සභාවේ අවධානය යොමු කරනවා මහත්මා ගුණයෙන් යුක්ත ක්‍රීඩකයෙක් විධියට, බුද්ධිමත් නායකයෙක් විධියට, ඒ වාගේම සටන්කාමීත්වයෙන් යුත් ක්‍රීඩකයෙක් විධියට, නොපසුබස්නා වීර්යෙන් යුතුව රටක් මෙහෙය වූ ක්‍රිකට් නායකයෙකු විධියට, මේ ක්‍රිකට් ක්‍රීඩකයා ශ්‍රී ලංකාවේ නම ජාත්‍යන්තර තලයට ගෙන ගියේ මේ රටේ ඉතිහාසය තුළ ඉතාමත් වැදගත් කාල සීමාවක. මේ ක්‍රීඩකයා ශ්‍රී ලංකාව වෙනුවෙන් ක්‍රීඩා කරන්න පටන් ගත්තේ මේ රටේ යුද්ධයක්

[ ගරු සුසාර දිනාල් සිල්වා]

තිබෙන වකවානුවක. ජාත්‍යන්තර වශයෙන් ඉතා විශාල ලෙස ශ්‍රී ලංකාවට මඩ ප්‍රහාර එල්ල වන යුගයක තමයි මේ ක්‍රිකට් ක්‍රීඩකයා ශ්‍රී ලංකා කණ්ඩායමට පැමිණෙන්නේ. 1997 අවුරුද්දේ ශ්‍රී ලංකා කණ්ඩායම ලකුණු 952 ක් ලබා ගත්තු ඛෙත්තාරාම ක්‍රිකට් ක්‍රීඩාංගණයේදී ඔහු ලකුණු 66 ක් ලබාගෙන ඔහුගේ මංගල ටෙස්ට් තරගයට සහභාගී වන වෙලාවේ පෞද්ගලික ප්‍රේක්ෂකයෙක් විධියට මම ඒ ක්‍රීඩාංගණයේ හිටියා. ඒක නිසා එදා ඉඳලා මේ ක්‍රීඩකයා පසුපස ප්‍රේක්ෂකයකු ලෙස ඉතාමත් සමීපව හිටපු පුද්ගලයෙක් බව මම මේ සභාවේදී සඳහන් කරනවා.

ශ්‍රී ලංකාව පිළිබඳව වැරැදි ආකල්පයක් ලෝකය තුළ මැවෙමින් පවතින වෙලාවක නායකයෙකු විධියට, ශ්‍රී ලංකාවේ ජීවත් වන්නේ මහත්මා ගුණයෙන් යුක්ත පිරිසක්, ශ්‍රී ලංකාවේ මිනිස්සු වැදගත් මිනිස්සු, බුද්ධිමත් මිනිස්සු කියන කාරණාව ක්‍රිකට් ක්‍රීඩාව හරහා ජාත්‍යන්තර තලයට ගෙන යන්නට කටයුතු කරපු ක්‍රීඩකයෙක් මහේල ජයවර්ධන නැමැති ටෙස්ට් ක්‍රිකට් ක්‍රීඩකයා. ඒක නිසා අපි ඒ කාරණාව පිළිබඳව මේ සභාවේදී ස්තුති පූර්වකව සඳහන් කිරීම වැදගත් වෙනවා. ඒ වාගේම තමයි ගරු සභාපතිතුමනි, මේ ක්‍රීඩකයාට ඔහුගේ ක්‍රීඩා ජීවිතය තුළදී ඔහුට ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට පවා මුහුණ පාන්නට සිද්ධ වුණා. ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම පකිස්ථානයේදී ත්‍රස්තවාදී ප්‍රහාරයන්ට මුහුණ දුන්න අවස්ථාවේදී පවා ශ්‍රී ලංකා කණ්ඩායමේ ක්‍රීඩකයින්ව එකතු කරගෙන, මේ ත්‍රස්තවාදී බලපෑම් හමුවේ රටක් විධියට, ක්‍රීඩකයින් විධියට අපි මුහුණ පාන ගැටළු පිළිබඳව ජාත්‍යන්තරය දැනුවත් කරන්නට, ජාත්‍යන්තරයේ වැදගත් ආකාරයට පෙනී සිටින්නට මේ ක්‍රීඩකයාට හැකි වුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මට -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දුන්නා.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මට විනාඩියක් ලබා ගන්න පුළුවන්ද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

තව විනාඩියක් ?

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු සභාපතිතුමනි, මම මේ -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් ප්‍රකාශය කරන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

මම මේ අවස්ථාවේදී විශේෂයෙන්ම සඳහන් කරන්නේ, වර්තමානය වන විට ක්‍රිකට් ක්‍රීඩාවට පාසල් මට්ටමෙන් ක්‍රීඩකයන් පැමිණෙන ආකාරය පිළිබඳව ගැටළුවක් පවතිනවා. මේ ගැටළුකාරී තත්ත්වය ඇති වෙලා තිබෙන්නේ, විශේෂයෙන්ම අපි දන්නවා මහේල ජයවර්ධන ක්‍රීඩා කරපු සමයේ පාසල් ක්‍රිකට් ක්‍රීඩකයින් විශාල වශයෙන් ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායමට පැමිණියා. නමුත් අද වන විට මේ තත්ත්වය අඩු වෙලා තිබෙනවා. පාසල් මට්ටමේ ක්‍රීඩකයින් ජාත්‍යන්තර තලයේ, ජාතික තලයේ සාකච්ඡාවට බඳුන් වන්නේ නැහැ. මට මතක් වෙනවා ප්‍රේමසර ඇපාසිංහ මහත්මයා 1994 කාලයේදී පුවත්පතකයට කරන ලද ප්‍රකාශයක්. ඔහු දිනමිණ පුවත්පතේ සඳුදා ක්‍රීඩා විග්‍රහයට සඳහන් කරනු ලැබුවා *"මහේල ජයවර්ධන නොමැති නාලන්දා ක්‍රිකට් කණ්ඩායම හැම්ලට් කුමාරයා නොමැති හැම්ලට් නාටකය වැනිය"* කියලා. ඒක නිසා මම මේ සභාවේදී සඳහන් කරන්නේ මහේල ජයවර්ධන නොමැති -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න.

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ශ්‍රී ලංකා ක්‍රිකට් කණ්ඩායම මනමේ කුමාරයා නොමැති මනමේ නාටකයක් නොවේවා කියලා මේ සභාවේදී සඳහන් කරමින් මගේ කථාව අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නිශාන්ත ශ්‍රී වර්ණසිංහ**
Hon. Nishantha Sri Waranasinghe

ගරු සභාපතිතුමනි, පසුගිය 12 වැනිදා රිජ්වේ ආර්යා ළමා රෝහලේ ප්ලාස්ටික් ශෛල්‍ය වෛද්‍ය ඒකකයේ වෛද්‍යවරියක් ඉතාමත් අවාසනාවන්ත ලෙස මිය ගියා. රූපලාවන්‍ය කරන සුවහසක් කාන්තාවන් මෙම සිදුවීමෙන් කම්පනයට පත් වුණා. ඒ වාගේම තිගැස්මට පත් වුණා. එහෙම නම් අද මේ රටේ තිබෙන රූපලාවන්‍ය ක්ෂේත්‍රය මේ කර්මාන්තය සම්බන්ධයෙන් අද පැන නැගිලා තිබෙන ගැටළු මොනවාද කියන එක අපි සියලු දෙනාගේම අවධානයට යොමු විය යුතුයි. විශේෂයෙන්ම මනුෂ්‍යයින් විධියට ලස්සනට ඉන්න, පැහැපත්ව ඉන්න, ඒ වාගේම හැඩකාර, දඟකාර සිහින් සිරුරක් ඇති කර ගන්න අපි සියලු දෙනාම කැමැතියි. (බාධා කිරීමක්) ඒ නිසා අද අපට පෙනෙනවා, රූපලාවන්‍ය ක්ෂේත්‍රයේ විශාල කර්මාන්තයක් විධියට ප්‍රසාරණය වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මැදි ආදායම් ලබන රටක් විධියට අද අපේ රටේ ජනතාවගේ ප්‍රමුඛතාවයන් වෙනස් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම මේ රූපලාවන්‍ය ක්ෂේත්‍රය සම්බන්ධයෙන් ඇති වෙලා තිබෙන ගැටළු පිළිබඳව අපේ අවධානය යොමු විය යුතුයි. මේ පිළිබඳව සෞඛ්‍ය ක්ෂේත්‍රයේ වගකිව යුතු, ඒ වාගේම නිලධාරීන් බලධාරීන් විතරක් නොවෙයි, අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේත් අවධානය යොමු විය යුතුයි. විශේෂයෙන්ම මම කියන්න ඕනෑ, මේ සම්බන්ධයෙන් අද රට පුරාම ඇති වෙලා තිබෙන කථා බහ පිළිබඳව සාකච්ඡාවක් අප තුළ ඇති විය යුතුයි.

මොකද, මේ රූපලාවන්‍යාගාර, ඒ වාගේම Beauty Salon, සම්බාහන මධ්‍යස්ථාන අද රට පුරා හතු පිපෙන්නා වාගේ බිහි වෙලා තිබෙනවා. සෑම නගරයකම අද මේක අපට දැක ගන්න පුළුවන්. විශේෂයෙන්ම අද මේ රූපලාවන්‍යාගාරවලට ගිහිල්ලා විශාල අවධානමක් අරගෙන සැත්කම් කරන, ඒ වාගේම තමන්ගේ මුහුණ පැහැපත් කර ගන්න, ප්ලාස්ටික් සැත්කම් කරන්න යොමු වන මේ අය දෙස අරගෙන බැලුවාම අපට පෙනෙනවා, මේ අය මෝඩයෝ නොවෙයි. නූගත් අය නොවෙයි. දැන උගත් ඉහළ සමාජයේ ඉන්න විශේෂඥ පිරිස් පවා අද මේවාට යොමු වෙලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම පසුගිය කාලයේ මේ ආකාරයේ මරණ තුනක් වාර්තා වුණා. ඒ මරණ තුනෙන් එකක් තමයි මහචාර්යවරයෙක් මරණයට පත් වීම. එහෙම නම් මේ සම්බන්ධයෙන් අපි කල්පනා කරලා බලන්න ඕනෑ. අද මේවාට ප්‍රමිතියක් තිබෙනවාද? ඒ වාගේම මේවා නියාමනය කරන්න වැඩ පිළිවෙළක් තිබෙනවාද? අද හැම නගරයකම රූපලාවන්‍යාගාර හත අටක් තිබෙනවා. මේක ඇත ගම්මාන දක්වාම පැතිරිලා ගිහිල්ලා තිබෙනවා. එහෙම නම් මේ ඇති වෙමින් තිබෙන තත්ත්වය සම්බන්ධයෙන් අපි සියලු දෙනාගේම අවධානය යොමු විය යුතුයි. අනාගතයේදී මේක විශාල ප්‍රමාණයක ප්‍රශ්නයක් බවට පත් වීමට නියමිතයි. ඒ නිසා ගරු සභාපතිතුමනි, මා ඉල්ලා සිටිනවා මේ සම්බන්ධයෙන් සෞඛ්‍ය අමාත්‍යාංශය විතරක් නොවෙයි. අපේ පළාත් සෞඛ්‍ය අමාත්‍යාංශයේත්, ඒ වාගේම වෛද්‍ය සභාවේත් අවධානය යොමු කරලා මේවාට නිසි ප්‍රමිතියක් ඇති කරන්න. ඒ වාගේම නියාමනය කරන්න සහ අධීක්ෂණය කරන්න අවශ්‍ය කරන ක්‍රමවේදයක් සකස් කරන්න කියලා මම මේ සභාවට යෝජනා කරනවා.

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ගරු සභාපතිතුමනි, නිශාන්ත ශ්‍රී වර්ණසිංහ ගරු මන්ත්‍රීතුමා කියපු කථාව ඇත්ත. ඒකට පූර්ණ අනුග්‍රහය, ප්‍රචාරය ලබා දෙන්නේ රාජ්‍ය නාලිකා. ඒ අය තමයි මේවා ගෙනැල්ලා බොරුවට පුම්බලා මිනිස්සුන්ව නොමඟ යවන්නේ, ඒ නාලිකා. ඉස්සෙල්ලාම ඒවා සොයලා බලලා ඒවාට ක්‍රියාත්මක වෙන්න කියන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. ඉසුර දේප්‍රිය ගරු මන්ත්‍රීතුමා ඔබතුමාගේ පෞද්ගලික පැහැදිලි කිරීම සඳහා විනාඩි 03 ක කාලයක් තිබෙනවා.

**ගරු ඉසුර දේවප්‍රිය**
Hon. Isura Devapriya

ගරු සභාපතිතුමනි, ඔබතුමා මගින් මේ සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි 2006 විශ්‍රාම වැටුප් විෂමතාවයන් මේ වනකොට තවම වෙනස් කරලා නැහැ. විශේෂයෙන්ම පසුගිය අයවැය ලේඛන තුනකින්ම රජයේ සේවකයින්ගේ 5%, 10% වශයෙන් වැටුප් වැඩිකිරීම් කළද විශ්‍රාමිකයින්ට අදාළ වැටුප් වැඩි කිරීම් නොකිරීම නිසා ඒ අය දැඩි අපහසුතාවකයට ලක් වෙලා, පීඩනයකට ලක් වෙලා ඉන්නවා. ඒ නිසා මේ සභාවේත් යුතුකමක් තිබෙනවා, මොකද, මේ පළාත් සභාවේ සේවය කළ විශ්‍රාමිකයන්ටත් මේ ප්‍රශ්නය බලපානවා. ඒ නිසා

[ ගරු ඉසුර දේවප්‍රිය]

මේ පිළිබඳව සභාවේ අවධානය යොමු කරන්න කැමැතියි. ඉදිරි අයවැයේදී මේ පිළිබඳව අවධානය යොමු කරලා, ඒ අයගේ ඉල්ලීම් සලකා බලන්න කියලා ඉල්ලා සිටිනවා. ඒ වාගේම ගිය ඉරිදා Sunday Observer පත්තරේ තිබෙනවා Plea to Rectify Concerned Anomalies කියන Headline එක යටතේ වයඹ පළාත් සභාව මේ පිළිබඳව අවධානය යොමු කරලා වයඹ පළාත් සභාවේ සියලුම - අපේ විපක්ෂ නායකතුමාට එහෙම ඕනෑකමක් නැහැ මේ රජයේ සේවකයන්ට (බාධා කිරීම්) කරන්න. නමුත් වයඹ පළාත් සභාවේ විපක්ෂ නායකතුමා මේ කාරණය සභාවට ඉදිරිපත් කරලා සභාවේ පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු ඒකට එකඟතාවය පළ කරලා තිබෙනවා. ඒ නිසා මේ සභාවේත් එකඟතාවය ලබා දීලා ඉදිරි අයවැයේදී මේ විෂමතාවය ඉවත් කරන්න කටයුතු කරන්න කියලා මම ඉල්ලා සිටිනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

රබර් පිටරටින් ගෙන්වීම නිසා රබර් මිල පහත වැටීමෙන් සිදු වූ පාඩුව මඟ හරවා ගැනීම පිළිබඳව කරුණු දැක්වීමට පී.ඩී. අබේරත්න ගරු මන්ත්‍රීතුමාට විනාඩි 03 ක කාලයක් ලබා දෙනවා.

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, මට විනාඩි 10 ක කාලයක් ලබා දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. දැන් කාලය පිළිබඳ ප්‍රශ්නයක් ආවොත් - දැන් වැඩිපුර ගියා නේ? ඔබතුමාගේ කථාව කෙටියෙන් කරන්න කෝ?

**ගරු පී.ඩී. අබේරත්න**
Hon. P. D. Abeyrathne

ගරු සභාපතිතුමනි, දැනට මාස කිහිපයකට පෙර රුපියල් හත්සියයට ආසන්න මිලකට වැඩි වෙලා තිබුණු රබර් කිරි මිල අද රුපියල් 200/- කට ආසන්න මිලකට අඩු වෙලා තිබෙනවා. මේ නිසා කළුතර දිස්ත්‍රික්කය ප්‍රධාන බස්නාහිර පළාතේත්, සමස්ත ලංකාවේත් රබර් කිරිවලින් යැපෙන විවිධාකාරයේ ජනතාව විශාල අසීරු තත්ත්වයකට පත් වෙලා තිබෙන අවස්ථාවක් බව මේ අවස්ථාවේ මම මතක් කරන්න කැමැතියි. මා නියෝජනය කරන කළුතර දිස්ත්‍රික්කයෙන් 50% ක් පමණ රබර්වලින් යැපෙන්නන් ඉන්නවා. ඉඩම් හිමියෝ ඉන්නවා. වෘත්තියෙන් සම්බන්ධ වන අය ඉන්නවා. ව්‍යාපාරික ප්‍රජාව ඉන්නවා. ඒ වාගේම රබර් පැළ තවාන්කරුවන් ඉන්නවා. මේ තුළින් ලක්ෂ ගණනක ජනතාව අද ඉතාම අසීරු තත්ත්වයට පත් වෙලා තිබෙනවා. රබර් මිල පහත වැටීම තුළ - ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ කියලා අපේ කථාවක් තිබෙනවා. මේ දිනවල වර්ෂාව නිසා මේ මාසයට එකම දවසයි කිරි කපලා තිබෙන්නේ. අද රබර් ව්‍යාපාරය ගැන මෙතැන ඉන්න හුඟ දෙනෙක් දන්නවා. රබර් ගහක දවස් ගණනාවක් කිරි කපන්නේ නැතුව ඉඳලා කැපුවාම කිරි එන්නේ නැහැ. නමුත් අපි කම්කරුවන්ට පඩි ගෙවන්න ඕනෑ. දවස් දෙකක්, තුනක්, හතරක් කපනකොට තමයි කිරි ලබා ගන්න පුළුවන් වෙන්නේ. නමුත් දවසක් දෙකක් කැපුවාම ආයිත් වහිනවා. ඊට පස්සේ තවත් දවස් දහයකට විතර පස්සේ කපන්නේ. ව්‍යාපාරිකයින්ට එතකොට පඩි ගෙවන්න බැරි තත්ත්වයට පත් වෙලා අද ව්‍යාපාරිකයෝ, රබර් ඉඩම් හිමියෝ කිරි කැපීම නවත්වන්න කටයුතු කරපු බවක් තිබෙනවා. ඒ තුළින් ලක්ෂ සංඛ්‍යාත කම්කරුවන්ගේ රැකියා නැවතිලා තිබෙනවා. පවුල් ප්‍රමාණය බැලුවොත් විශාල ජනගහනයක්. ඒකට හේතුව තමයි මේ මිල පහළ වැටීම. ඒ වාගේම රබර් පැළ තවාන්කරුවෝ. පසුගිය දවස්වල රබර් මිල වැඩි වුණු අවස්ථාවේ රබර් පැළය රුපියල් 150 කින් ඉහළට ගියා. රබර් පැළ වවන අය ලක්ෂ 5, 6 ක රබර් පැළ දැම්මා. අද රබර් මිල පහත වැටීම නිසා රබර් පැළ හිටවන්නේ නැහැ. රබර් වගාව නවත්වලා. මේ නිසා රබර් පැළ වගා කරපු අයට, පැළ නිෂ්පාදනය කරපු අයට ඒවා විකුණා ගන්න බැරුව ඉතා අසීරු තත්ත්වයට පත් වෙලා ඉන්නවා. තවාන්වල 50, 60 වැඩ කරනවා. ඒ අයට පඩි ගෙවන්න බැරුව ඉන්නවා. මේ තුළින් අද අපේ දිස්ත්‍රික්කය ඇතුළු රබර් වගාවට සම්බන්ධ පවුල් ඉතාම අසරණ තත්ත්වයට පත් වුණා.

ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම ඔබතුමාගේ අවධානයට යොමු කරනවා. විශාල වතුවලට වැඩිය අපේ ගම්වල පවුලකට අක්කර 1 ½ ක 2 ක රබර් තිබෙනවා. ඒ රබර් කිරි කපන්න කවුරුවත් ගන්නේ නැහැ. තමුන්ම කපා ගන්නවා. දවසකට රබර් කිලෝ 10 ක් 15 ක් දානවා. අඩුම ගාණේ දවස් 10 ක්වත් කිරි කැපුවා නම් රබර්

කිලෝ 100 ක් විතර කපා ගන්නවා. ඒ කාලේ රුපියල් 100 ට 150 ට තිබියදී රුපියල් 15,000/- ක ආදායමක් ලබපු අයට රුපියල් 600 ට නැග්ගාම රුපියල් 90,000/- ක විතර ආදායමක් ලැබුණා. එහෙම ලැබුණාම මොකද කළේ? දුප්පත් දෙමව්පියෝ, දරුවෝ බස් එකේ පාසල් යවපු දරුවාව වෑන් එකකට දැම්මා. දරුවන්ට හොඳට අඳින්න පළඳින්න දුන්නා. සෙරෙප්පු දාපු ළමයින්ට සපත්තු දැම්මා. කන බොන දේවල් වැඩියෙන් දුන්නා. අනෙක් දේවල් වැඩියෙන් ලබා දුන්නා. අද රබර් මිල පහත වැටිලා. නමුත් ඒ දරුවන්ගේ ඉල්ලීම් අඩු කරන්න පුළුවන්කමක් නැහැ. ඒ වාගේම සුළු සුළු වාහන, ත්‍රීවීල් ගත්තා. පොඩි කාර් ගත්තා. අද ඒවාට පෙට්‍රල් ගහගන්න පුළුවන්කමක් නැහැ. කෙටි කාලයක් තුළ තමුන්ගේ ජන ජීවිතය විශාල ලෙස වෙනස්වීම තුළින් එක පැත්තකින් මිනිස්සු මානසික වශයෙන් වැටීමට පත් වෙලා ඉන්නවා. මිනිස්සු වහ බොන තත්ත්වයට පත් වෙලා ඉන්නවා. සමාජයේ අපි දකිනවා දරුවාත් එක්ක අම්මා කෙනෙක් වතුරට පැනලා මැරිලා තිබෙනවා. මේවාට අදාළ හේතුව ආර්ථිකය කඩා වැටීම. මට පෙර කථා කරපු ගරු මන්ත්‍රීතුමා කිව්වා, මේක ආදායම් වැඩි රටක් කියලා. නමුත් මම අවධානය යොමු කරනවා, අද මේ රටේ කිරි ව්‍යාපාරය විතරක් නොවෙයි, තේ වල මිල බැහැලා. රබර්වල මිල බැහැලා. ඒකට හේතුව තමයි ආණ්ඩුව පිටරටින් රබර් ගෙන්වීම. අද ආණ්ඩුවේ ලොකු ලොක්කෝ එකතු වෙලා රබර් ගෙන්නලා ඒ අයගේ මඩිය තර කර ගන්නවා. ඒ තුළින් අපේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවගේ ජන ජීවිතය අවුල් වෙලා. මේක ඉතාම අසාධාරණ ක්‍රියාදාමයක්.

මේ තුළින් අපේ ජනතාව ඉතාම අමාරුවකට පත් වෙලා තිබෙන අවස්ථාවක ගරු සභාපතිතුමනි, මම දැඩි අවධානය යොමු කරන්නේ, මීට පෙරටත් මේ ආණ්ඩුව තිබියදී මේ වැඩේ වුණා. 1999 - 2000 වර්ෂයේදී රුපියල් 100 ට රබර් මිල බැස්සුවා. ඒ වෙලාවේ රබර් වතු අත්හැරලා තිබුණේ. 2002 අපි බලයට පත් වුණු වෙලාවේ පිටරටින් රබර් ගෙන්වන එක සම්පූර්ණයෙන් නවත්වලා රබර් මිල වැඩි කළා. ඒ තුළින් අපට පුළුවන්කම ලැබුණා රුපියල් 600/- දක්වා රබර් මිල වැඩි කරන්න. මොකද, ලංකාවේ දේශීය නිෂ්පාදනය ලංකාවේ අවශ්‍යතාවයට අඩු ප්‍රමාණයක් තිබෙන්නේ. ඒ නිසා ඉල්ලුම අසීමිතව වැඩි වුණා. ලෝක වෙළඳ පොළේ, ලෝකයෙන්ම වැඩිම රබර් මිල ගෙවන රට බවට ලංකාව පත් වුණා. එහෙම පත්වීම තුළින් ජන ජීවිතය ඉතාම සාර්ථකත්වයට ගෙන එන්න පුළුවන්කම ලැබුණා. අද දේශපාලනයේ හයිය තිබෙන කිහිප දෙනෙකුගේ උවමනාවට පිටරටින් රබර් ගෙනැල්ලා ඒ අය හම්බ කරනවා. අද මේ රටේ ලක්ෂ සංඛ්‍යාත ජනතාවක් අමාරුවේ වැටිලා ඉන්නවා. මේකට කිසිම කෙනෙක් මැදිහත් වෙන්නේ නැහැ. ඒ නිසා ගරු සභාපතිතුමා මගින් මම ඉල්ලා සිටින්නේ, ඔබතුමා මේක රජයට ඉදිරිපත් කරන්න. මේ පිටරටින් රබර් ගෙන්වීම සම්පූර්ණයෙන් නැවැත්තුවේ නැත්නම් අපේ ජන ජීවිත ඉතාම අසීරු තත්ත්වයට පත් වුණා වාගේම ජීවත් වෙන්න බැරි තත්ත්වයට අද පත් වෙනවා. ඒ නිසා මම ඔබතුමාගෙන් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා මේක යෝජනාවක් හැටියට ඉදිරිපත් කරලා මහ ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරන්න. මේ රටට විදේශ රටවලින් රබර් ගෙන එන එක නතර කරලා රබර් මිල වැඩි කරලා, මේ දුක් විඳින ජනතාවටත් මේ රබර් ව්‍යාපාරය දියුණු කරන්න අවස්ථාව ලබා දෙන්න කියලා.

ඒ වාගේම පරිසරයටත් වැදගත් කාරණයක් තිබෙනවා. අද අපේ කැලෑ කපනවා. ගම්මානවල තිබෙන කැලෑ අඩු වෙලා යනවා. නමුත් රබර් වගාව තිබෙනවා නම් පරිසරය ආරක්ෂා වීමටත් ඉතාමත් වැදගත් වෙනවා. ඒ නිසා පරිසරය ආරක්ෂා කර ගන්නත් මේ රබර් වගාව වැදගත් වන නිසා ඒකත් එක්තරා පැත්තකින් අපේ ජන ජීවිතයට බලපාන බව මතක් කරනවා. ඒ නිසා මේ සියලු කරුණු කෙරෙහි අවධානය යොමු කරලා ඔබතුමාගේ මාර්ගයෙන් ඉදිරිපත් කරලා රබර් පිටරටින් ගෙන එන එක නතර කරලා රබර් මිල වැඩි කිරීමටත්, රබර් ව්‍යාපාරය ඉදිරියට ගෙන යන්න අවස්ථාවත් සලසා දෙන්න කියලාත් ගෞරවයෙන් ඉල්ලමින් මම නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, මා විසින් ඉදිරිපත් කරන කාරණය පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ මගින් ගම්පහ දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරු එස්. පනාගොඩ මහත්මියගේ හදිසියේ වැඩ තහනම් කිරීම සම්බන්ධවයි. රාජකාරී වැඩ තහනම් කිරීමේ ලිපියක් මගින් 2014.07.30 දින මෙතුමියගේ වැඩ තහනම් කරලා තිබෙනවා. වැඩ තහනම් කරන ප්‍රධාන කාරණය විධියට ඇයගේ වැඩ තහනම් කිරීමට අදාළ ලිපියේ සඳහන් කරලා තිබෙන්නේ, වැව වටා මංතීරුවක් සකස් කිරීමේ ඇස්තමේන්තු සකස් කිරීමයි. පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂ වෙත පැවරීමෙන් පසු එතුමිය කැඳවනවා,

[ ගරු අශෝක සපුමල් රන්වල]

2014.07.22 වැනිදා පළාත් වාරිමාර්ග කාර්යාලයට. මේ ආපු අවස්ථාවේදී පළාත් වාරිමාර්ග ඉංජිනේරුතුමිය, ආශා පනාගොඩ මහත්මිය නිවැරැදිව පැහැදිලි කරනවා, මේ විෂයය පළාත් වාරිමාර්ග විෂය පථයට අදාළ වෙන්නේ නැහැයි කියලා. ඒ සඳහා අදාළ චක්‍රලේඛ, අණපනත්, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පළමුවැනි උපලේඛය අනුව පැහැදිලි කරනවා. (බාධා කිරීමක්) මේ වැඩ තහනම් කිරීම සම්බන්ධව ඉතාමත් පැහැදිලිව සඳහන් වෙනවා, මේ විෂයය පථයේ නොවන කාරණයක් බලහත්කාරයෙන් පැවරීම නිසා තමයි මේ වැඩ තහනමට ලක් වෙන්නේ. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ තිබෙනවා, ඒ වාගේම ආයතන සංග්‍රහයේ තිබෙනවා, ඉහළ නිලධාරියෙක් නීත්‍යානුකූල නියෝගයක් පමණයි පහළ ඉන්න නිලධාරියෙක් ඉෂ්ට කරන්න ඕනෑ කියලා. ඉතාමත් පැහැදිලිව මේ සම්බන්ධව ආයතන සංග්‍රහයේ සඳහන් වෙලා තිබෙනවා. මෙහෙම පවතින -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට මම කාලය දුන්නා නේ? දැන් කථාව අවසන් කරන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මට පොඩි වෙලාවක් දෙන්න. ඒ වාගේම මෙතුමිය කැඳවන්නේ 07 වැනි මාසේ 30 වැනිදා. බදාදා දිනයක. ඉතාමත් පැහැදිලිව කියලා තිබෙනවා මේ බදාදා දිනයේදී,

*"ඒ අනුව කාර්යාල දිනයක් වශයෙන් නම් කර ඇති බදාදා දිනයේදී කාර්යාල වේලාව තුළ සියලුම නිලධාරීන් කාර්යාලයේ අනිවාර්යයෙන්ම රැඳී සිටිය යුතුය."*

ඊළඟට සඳහන් කරලා තිබෙනවා ගරු සභාපතිතුමනි,

*"මෙදින කිසිදු රැස්වීමක්, සාකච්ඡාවක්, සම්මන්ත්‍රණයක්, උත්සවයක් සංවිධානය නොකළ යුතුය. බාහිර ආයතන මගින් පවත්වනු ලබන එවැනි දේකට සහභාගී වන්නේද -"*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා ඔය ලිපිය සභාගත කරන්න. මට කාලය දෙන්න බැහැ.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ විධියට පවතිද්දී තමයි එතුමියගේ වැඩ තහනම් කරන්නේ. මේක නීති විරෝධී වැඩ තහනම් කිරීමක්. මේක වහාම නිවැරැදි කරන්න කියලා අපි ඉල්ලා සිටිනවා. එහෙම නැත්නම් බරපතළ අසාධාරණයක් සිද්ධ වෙලා තිබෙනවා. රජයේ නිලධාරියෙක්, පළාත් නිලධාරියෙකුට, ඉංජිනේරුවරියක් විධියට ගම්පහ දිස්ත්‍රික්කයේ වැඩ කරන ඉංජිනේරුතුමියට තමයි කැස්බෑව වැව ප්‍රතිසංස්කරණය කරන්න නොවෙයි, මේ කැස්බෑව වැව වටේ තිබෙන මංතීරුව ප්‍රතිසංස්කරණය කරන්න ඇස්තමේන්තු -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා. කරුණාකරලා වාඩි වෙන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේක බරපතළ අගතිගාමී වැඩක්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කරුණාකරලා ඔය ලිපිය සභාගත කරන්න.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

සභාගත කරනවා.[2] මේක වහාම නිවැරැදි කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මුලින්ම ඔබතුමාගේ නම කැඳවන අවස්ථාවේ ඔබතුමා සභාවේ හිටියේ නැහැ. නමුත් ඔබතුමාගේ ප්‍රමාදයට හේතුව සඳහන් කරලා මගෙන් විශේෂ ඉල්ලීමක් කළා. ඔබතුමාට විනාඩි 02 ක කාලයක් ලබා දෙනවා.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, පදවියේ සුළි සුළංවලින් අවතැන් වූ පවුල් 450 කට මේ ආණ්ඩුව දුන්නේ ලක්ෂ 20 යි. එක

[2] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

පවුලකට රුපියල් 4450/- ක් දුන්නු රටක අපි - මම හිතන්නේ රුපියල් 4450/- ක් දෙන්න ඇත්තේ රජයට දරා ගන්න පුළුවන් මුදල ඒක නිසා වෙන්න ඇති. නමුත් ගරු සභාපතිතුමනි, මේ රටේ එක්තරා රාජ්‍ය නිලධාරියෙක් තමන්ගේ නම ඇමරිකාවේ සඟරාවල පළ කර ගැනීම සඳහා මේ රටේ අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල් කෝටි 8.8 ක් වියදම් කරලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි මේ රාජ්‍ය නිලධාරියා - හොයාගෙන යනකොට මොකක්ද මේ ඒජන්සිය. ඇමරිකාවේ තිබෙන්නා වූ සමාගමක් වන Thomsen Advisory Group හෙවත් TAG නැමැති ආයතනයට මේ රටේ අහිංසක මිනිසුන්ගේ බදු මුදල් ලක්ෂ 880 ක්, කෝටි 8.8 ක් ගෙවලා තිබෙනවා. තමන්ගේ නමින්, තමන්ව ඇමරිකාවේ Promote කරගන්න, ප්‍රසිද්ධ කර ගන්න, ඇමරිකාවේ සඟරාවල ලිපි දාන්න. ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි. මේ ගණුදෙනුවට සම්බන්ධ වෙනවා ඇමරිකාවේ වොෂින්ටන් DC වල පදිංචි ටැක්සි රියදුරෙක්. ඔහුගේ නම මොහාන් සිරිවර්ධන. ඔහුට අපේ රටෙන් ඩොලර් 7500 ක පඩියක් ගෙවනවා. මේ ඇමරිකාවේ ටැක්සි රියදුරාට.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

කොහේ ඉන්න කෙනෙක්ද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ඔහු ඇමරිකාවේ පදිංචි. උපත පිළියන්දල. ගරු සභාපතිතුමනි, මේක බලාගෙන යනකොට මොකක්ද කරන්නේ? Advisary සමාගමේ සභාපතිතුමා ලිමෝසින් ටැක්සිවල යන්නේ. මේ රියදුරාගේ වාහනයෙන්. ඔහු එක්ක මේ අදාළ රාජ්‍ය සේවකයාට කප්පුකම කරන්නේ මේ ටැක්සි රියැදුරා. ඒ අනුව 2013 අවුරුද්දේ ඔහු සඳහා මාර්තු මාසේ 21 වැනිදා සිට අගෝස්තු 03 වැනිදා දක්වා ඇ.ඩො. 34,675 ක් මේ සේවකයාට ගෙවනවා. කවුද මේ රාජ්‍ය නිලධාරියා ගරු සභාපතිතුමනි? ඔහුගේ නම මේ රටේ මුදල් අමාත්‍යවරයා විසින් පත් කරන දේශපාලන පත්වීමක් වූ මහ බැංකු අධිපති නිවාඩ් කබ්රාල්. අජිත් නිවාඩ් කබ්රාල් නැමැත්තා මහ බැංකුවේ මුදල් ලක්ෂ 880 ක් රජයේ අනුමැතියකින් තොරව, කැබිනට් පත්‍රිකාවක් රහිතව සහ පාර්ලිමේන්තුව දැනුවත් නොකොට ඇමරිකාවේ විදේශ සමාගමකට ගෙවනවා. මෙවැනි පහත්, නින්දිත, මූල්‍ය ගණුදෙනු මේ රටේ සිදු වෙමින් පවතින බව මේ සභාවට මතක් කරනවා. ඒ නිසා ගරු සභාපතිතුමනි, ඔබතුමා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒවා කාගේ සල්ලිද?

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මේ රටේ ජනතාවගේ, අහිංසක මිනිස්සුන්ගේ බදු මුදල්. කොහොමද ඔහුට මෙහෙම ගෙවන්න අයිතියක් තිබෙන්නේ ගරු සභාපතිතුමනි. මේ පිළිබඳව ඇමරිකාවේ ෆාරා පනත යටතේ Foreign Agency Registered Act එක යටතේ අහනවා. හැබැයි, අවසානයේදී මේ රියදුරා කවුද කියලා ඇහුවාම මේ සමාගම උත්තර දෙන්නේ නැහැ. ඔහු ගිය සතියේත් ලංකාවට ඇවිල්ලා යනවා. ඔහුගේ විදේශ ගමන් බලපත්‍රය සහ ලංකාවේ හෝටල් ගාස්තු සියල්ල මේ රියදුරාට ගෙවන්නේ අපේ රටේ මහ බැංකුව විසින් ගරු සභාපතිතුමනි. ඒ නිසා -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථාව අවසන් කරන්න ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාගේ ලිපිය සභාගත කරන්න.

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මම මේක සභාගත කරනවා.[3]

# පළාත් සභාවේ කටයුතු
PROVINCIAL COUNCIL AFFAIRS

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය."*

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

[3] සභා ලේකම් කාර්යාලයේ තබා ඇත.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පොදු කටයුතු යටතේ පළමුවෙන්ම තිබෙන්නේ 2013 අංක ..... දරණ බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය දෙවන වර කියැවීමේ අවස්ථාව. ඒ සම්බන්ධව 2014.08.05 වන දින සභා රැස්වීමේදී සභාගත කළ 2014.07.16 දිනැති ප්‍රඥප්ති හා නීති කාරක සභා වාර්තාවේ සඳහන් නිර්දේශ පිළිබඳවත් ඔබතුමන්ලාගේ අවධානය යොමු කරනවා. තවදුරටත් සංශෝධන අවශ්‍ය නම් පූර්ණ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට හැකියාව තිබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා. උදය ප්‍රභාත් ගම්මන්පිල ගරු ඇමැතිතුමාට අවස්ථාව ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ වැඩ කටයුතු ආරම්භ කිරීමට.

# 2013 අංක ........ දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය : දෙවනවර කියැවීම
## MINOR IRRIGATION STATUTE OF WESTERN PROVINCE NO…. OF 2013: SECOND READING

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *"2013 අංක ....... දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය"* දෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

***2013 අංක ....... දරන බස්නාහිර පළාතේ සුළු වාරිමාර්ග ප්‍රඥප්ති කෙටුම්පත***

පළාත් එකකට වැඩි සංඛ්‍යාවක් හරහා දිවෙන ගංගාවලට අදාළ වාරිමාර්ග යෝජනා ක්‍රම හෝ අන්තර් පළාත් වාරිමාර්ග සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර බස්නාහිර පළාත තුළ වූ සියලු සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම සැළසුම් කිරීම, නිර්මාණය කිරීම සහ ක්‍රියාත්මක කිරීම ඇතුලුව සුළු වාරි කර්මාන්ත ඉදි කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ නඩත්තු කිරීමට අදාල නීතිය සංස්ථාපනය කිරීම පිණිසද,ඊට සම්බන්ධ වූ හෝ ආනුශාංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි.

මේ ප්‍රඥප්තියේ විධිවිධාන (453 වන අධිකාරිය වූ) වාරිමාර්ග ආඥා පනතේ විධිවිධාන සමග අනනුකූල වේ.

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ බස්නාහිර පළාතේ පළාත් සභාව විසින් මෙසේ පනවනු ලැබේ :-

| | | | |
|---|---|---|---|
| ලුහුඬු නාමය සහ බලාත්මක වීමේ දිනය | 1 | | මෙම ප්‍රඥප්තිය, 2013 අංක...... දරන බස්නාහිර පළාත් සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය යනුවෙන් හඳුන්වනු ලබන අතර බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයාගේ අනුමැතිය ලැබූ දින සිට බලාත්මක වන්නේය. |

I වන කොටස

බස්නාහිර පළාතේ වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම සහ එහි සංයුතිය

| | | | |
|---|---|---|---|
| පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව පිහිටුවීම | 2 | | පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන (මෙහි මින් මතු දෙපාර්තමේන්තුව යනුවෙන් හඳුන්වනු ලබන) දෙපාර්තමේන්තුවක් මෙයින් පිහිටවනු ලැබේ. |
| පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා | 3 | (1) | දෙපාර්තමේන්තුවේ කටයුතු පරිපාලනය කිරීමේ හා ක්‍රියාත්මක කිරීමේ කාර්යය (මෙහි මින්මතු අධ්‍යක්ෂවරයා යනුවෙන් හඳුන්වනු ලබන) පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා වෙත පැවරෙන්නේය. පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා දෙපාර්තමේන්තුවේ ප්‍රධාන විධායක නිලධාරියා වන අතර ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලැබේ. |
| | | (2) | ආණ්ඩුකාරවරයා විසින් ඉංජිනේරු සේවයේ නිලධාරියෙකු පළාත් අධ්‍යක්ෂවරයා ලෙස පත්කරනු ලැබේ. |
| | | (3) | අධ්‍යක්ෂවරයාට, පළාත් වාරිමාර්ග විෂයය භාර ලේකම්ගේ අධීක්ෂණය යටතේ ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීමට බලය ඇත්තේය. |

දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරුන් පත් කිරීම

4 (1) මෙම ප්‍රඥප්තියේ කාර්යය සඳහා, දිස්ත්‍රික් වාරිමාර්ග නිළධරයන් ලෙස කටයුතු කිරීම සඳහා නියම කරනු ලැබිය හැකි පරිදි වූ සිවිල් ඉංජිනේරුවරුන් සංඛ්‍යාවක් කලින් කල පත් කරනු ලැබිය හැකිය.

(2) එසේ පත් කරනු ලබන වාරිමාර්ග නිලධරයන්, අධ්‍යක්ෂවරයාගේ විධානවලට සහ අධීක්ෂණයට යටත්ව, යම් දිස්ත්‍රික් වාරිමාර්ග ඉංජිනේරුවරයකු වෙත පවරනු ලබන හෝ පනවනු ලබන යම් බලතල, කාර්යය හෝ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම කරනු ලැබිය යුතුය.

## II වන කොටස
## අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කර්තව්‍ය

පළාත්බද අධ්‍යක්ෂවරයාගේ බලතල සහ කර්තව්‍ය

5 අධ්‍යක්ෂවරයාට පහත සඳහන් බලතල තිබිය යුතුය :-

(අ) සියලු සුළු වාරි කර්මාන්ත සැළසුම් කිරීම, නිර්මාණය කිරීම ඉදි කිරීම, ක්‍රියාත්මක කිරීම හා අධීක්ෂණය කිරීම ;

(ආ) පළාත තුල සුළු වාරි කර්මාන්ත සංවර්ධනය කිරීම, පුනරුත්ථාපනය කිරීම සහ නඩත්තු කිරීම;

(ඇ) පළාත තුල සුළු වාරිමාර්ග වලට අදාල ගංවතුර සහ ලවණ දිය ආක්‍රාන්තිය පාලනය කිරීම සඳහා පියවර ගැනීම;

(ඈ) පළාත තුල සුළු වාරි කර්මාන්ත ආරක්ෂා කිරීම සහ නඩත්තු කිරීමට අදාළව වාරිමාර්ග විෂයය පිළිබඳ දැනුවත් කිරීම, ප්‍රවර්ධනය කිරීම සහ දිරිමත් කිරීම පිණිස අදාළ පියවර ගැනීම;

(ඉ) මෙම ප්‍රඥප්තිය යටතේ ගොවි සංවිධානවල කර්තව්‍ය සහ කාර්යය පිළිබඳව එකී සංවිධානවලට දැනුම ලබා දීම කරනු ලබාදීම.

(ඊ) මෙම සුළු වාරිමාර්ග සම්බන්ධ කටයුතු ඉටු කර ගැනීම සඳහා අවශ්‍ය ගොවි සංවිධාන තෝරා ගැනීම, වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සහ ගොවි සංවිධාන අක්‍රීය තත්වයට පත්ව ඇති අවස්ථා වල ඒවා සක්‍රීය තත්වයට පත් කිරීමට කටයුතු කිරීම;

(උ) සුළු වාරිමාර්ග කටයුතු ඉටු කර ගැනීම සඳහා ක්‍රියාත්මක කරන වැඩසටහන් වලදී ඇතිවන ගැටළු හා ප්‍රශ්න නිරාකරණය කර ගැනීම සඳහා අදාල ආයතන හා බලධාරීන් සමග සම්බන්ධීකරණය කිරීම.

| | | | |
|---|---|---|---|
| සුළු වාරි කර්මාන්ත වලට ප්‍රවේශය සඳහා ඇති බලය | 6 | (1) | අධ්‍යක්ෂවරයා විසින් බලය පවරනු ලැබූ යම් තැනැත්තකුට අධ්‍යක්ෂවරයා විසින් නියම කරනු ලබන නියමයන් පිළිපැදීමෙන් පසු යම් සුළු වාරි කර්මාන්තයකට යාව ඇති, යාබදව ඇති හෝ එයට ඍජු ප්‍රවේශය ලබා දෙන යම් පරිශ්‍රයකට අවශ්‍යතාවය මත කවර වේලාවක හෝ ඇතුළු වීමට බලය තිබිය යුතුය. |
| | | (2) | මෙවැනි ප්‍රවේශයකට ඇතුලු වීම අසාධාරණ ලෙස ප්‍රතික්ෂේප කරනු ලැබුවා වූද, බලයලත් තැනැත්තා විසින්, නියම කරනු ලැබූ නියමයන්ට අනුකූලව ක්‍රියාකොට ඇති බවට සහ එකී නියමයන් පිළිපැද ඇති බවට අධ්‍යක්ෂවරයා සෑහීමට පත්වනු ලබන්නාවූද අවස්ථාවකදී එකී සුළු වාරි කර්මාන්තයට ප්‍රවේශය සඳහා අවසර දෙමින් හෝ බලය දෙමින් මහේස්ත්‍රාත් අධිකරණයෙන් නියෝගයන් ලබා ගැනීමට අධ්‍යක්ෂවරයාට හැකිය. |
| වෙනත් සංවිධානවල සහභාගිත්වය | 7 | | අධ්‍යක්ෂවරයා විසින්, නිශ්චය කරනු ලබන උපමානවලට අනුකූලව සුළු වාරි කර්මාන්ත නඩත්තු කිරීම සහ ඉදි කිරීමෙහි ලා, වෙනත් යම් රජයේ හෝ රාජ්‍ය නොවන හෝ ස්වේච්ඡා සංවිධාන වල හෝ සහභාගිත්වය දිරිමත් කරනු ලැබිය හැකිය. |

## III වන කොටස
## වැරදි සහ දඬුවම්

අධ්‍යක්ෂවරයාගේ පූර්ව අනුමැතියකින් තොරව :-

| | | | |
|---|---|---|---|
| සුළු වාරිමාර්ග යෝජනා ක්‍රම අවහිර කිරීම, ඒවාට බාධා කිරීම හෝ අනවසරයෙන් කොටු කර ගැනීම ආදිය වරදක් බව | 8 | (අ) | යම් සුළු වාරිමාර්ගයක්, ජල මාර්ගයක්, බැම්මක්, ඉවුරක්, වේල්ලක්, සංචිත වැවක්,වාරි රක්ෂිතයක් හෝ වෙනත් යම් වාරි කර්මාන්තයකට අවහිර කරන, බාධා කරන, හෝ අනවසරයෙන් කොටු කර ගන්නා හෝ අලාභහානි පමුණුවන හෝ නැතහොත් අවහිර කිරීමට, බාධා කිරීමට, අනවසරයෙන් කොටුකර ගැනීමට හෝ අලාභහානි පැමිණවීමට හෝ සලස්වන; |
| | | (ආ) | යම් සුළු වාරි කර්මාන්තයක රැස් කොට තබා ඇති ජලය කවර හෝ ආකාරයකට ඕනෑකමින් හෝ ද්වේශසහගත ලෙස හෝ අපතේ යාමට සලසන; |
| | | (ඇ) | යම් අපද්‍රව්‍ය හෝ අපවිත්‍ර කාරක, යම් සුළු වාරි කර්මාන්තයකට මුදා හරින හෝ මුදා හැරීමට සලසන, නිකුත් කරන, තැම්පත් කරන, නිදහස් කරන හෝ නිකුත් කිරීමට. තැම්පත් කිරීමට හෝ නිදහස් කිරීමට ඉඩ සලසන ; |

(ඇ) යම් සුළු වාරි කර්මාන්තයක් හෝ යම් සුළු වාරි කර්මාන්තයක් සඳහා වෙන් කොට තිබෙන හෝ රක්ෂිත ප්‍රදේශයක යම් වගාවක් කරන හෝ වැලි හෝ පස් හෝ වෙනත් යම් ද්‍රව්‍යයක් ඉවත් කරන හෝ නැතහොත් වගාවක් කරගෙන යාමට හෝ වැලි හෝ පස් හෝ වෙනත් යම් ද්‍රව්‍යන් ඉවත් කිරීමට සලසන ;

(ඉ) රජයේ ආරක්ෂක හමුදාව විසින් ආරක්ෂාව සැපයීමේ කාර්යය සඳහා නොවන්නා වූ වෙනත් කාර්යයක් සම්බන්ධයෙන්, යම් සුළු වාරි කර්මාන්තයක, ප්‍රවාහනය සඳහා, යන්ත්‍රානුසාරයෙන් පදවන යම් යාත්‍රාවක් මෙහෙයවීම ;

(ඊ) යම් සුළු වාරිකර්මාන්තයකදී යම් වාණිජමය ක්‍රියාකාරකමක නියැලීම හෝ එවැනි වාරි කර්මාන්තයක් අනවසර ක්‍රියාකාරකම් සඳහා උපයෝගී කර ගැනීම ;

(උ) යම් වාරි කර්මාන්තයක හෝ ඉන් කොටසක යම් ව්‍යුහයකට හෝ ඉන් කොටසකට අලාභ හානි කිරීම හෝ අලාභ හානි කිරීමට සලසන හෝ එවැනි ව්‍යුහයක් ඉන් කොටසක් ඉවත් කරන හෝ ඉවත් කිරීමට සලසන යම් තැනැත්තෙකු,

මේ ප්‍රඥප්තිය ප්‍රකාරව වරදකට වරදකරු විය යුත්තේය.

පළාත්බද අධ්‍යක්ෂවරයා විසින් ලිහිල් කිරීමේ පියවර ගනු ලැබීම

9 (1) යම් තැනැත්තෙකු ඉහත 8 වන වගන්තියේ විධිවිධාන උල්ලංඝනය කරමින් යම් ක්‍රියාවක් කරන බව අධ්‍යක්ෂවරයාට පෙනී යන අවස්ථාවකදී එම වගන්තියේ නිශ්චිතව සඳහන් ක්‍රියා හෝ ක්‍රියාවන් දිගටම කරගෙන යාමෙන් වලකින ලෙස නියම කරමින් වරදකරු වෙත බාරදිය යුතු ලිඛිත නියෝගයක්, වහාම අධ්‍යක්ෂවරයා විසින් නිකුත් කල යුතුය. අලාභ හානි අඩුකර ගැනීම සඳහා එම තැනැත්තා විසින් ගත යුතු ක්‍රියාමාර්ග නියෝගයේ නිශ්චිතව සඳහන් කල යුතුය.

(2) අධ්‍යක්ෂවරයා විසින් ඉහත (1) වන උප වගන්තිය යටතේ කරන ලද නියෝගයට අනුකූලව කටයුතු කිරීම සහතික කිරීමේ කාර්යය සඳහා, එකී නියෝගය කරන ලද්දේ යම් බලය ලත් නිලධාරියෙකුගේ බල ප්‍රදේශය තුල පිහිටි යම් වාරිමාර්ගයක්, ඇළක්, ජල මාර්ගයක්, බැම්මක්, ඉවුරක්, කණ්ඩියක්, වේල්ලක් හෝ වාරි රක්ෂිතයක් සම්බන්ධයෙන් ද, එකී බලය ලත් නිලධාරියා ඉහත නියෝගය ක්‍රියාත්මක කිරීමට බැඳී සිටී.

නියෝග පිළි නොපදින විට අධිකරණ ක්‍රියා මාර්ග ගැනීම

(3) ඉහත (1) වන උප වගන්තියේ නිශ්චිතව සඳහන් තැනැත්තා විසින් වැරදි සහගත ප්‍රතිඵල අවම කිරීම සඳහා නියෝගයේ නිශ්චිතව සඳහන් පියවර ගැනීමට අපොහොසත් වූ බවද එකී නිශ්චිතව සඳහන් වැරදි සහගත ක්‍රියා දිගටම කරගෙන යන බවද පෙන්නුම් කරමින් අධ්‍යක්ෂවරයා විසින් අවසන්

නියෝගයක් නිකුත් කරනු ලැබිය යුතු අතර එහි සඳහන් කොට ඇති කරුණු බැලූ බැල්මට සාක්ෂි වන්නේය.

බලයලත් නිලධරයන් සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව

(4) ඉහත (1) වන උපවගන්තිය යටතේ කරන ලද යම් නියෝගයකට අනුකූලව කටයුතු කිරීමට අපොහොසත් වන සෑම තැනැත්තෙකුම මෙම ප්‍රඥප්තිය යටතේ වරදක් කරන අතර වරදකරු කිරීමේ දී රුපියල් එක් ලක්ෂයකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දකට නොවැඩි කාලයක් සඳහා වූ බන්ධනාගාරගත කිරීමකට හෝ එකී දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම හෝ යටත් විය යුතුය.

(5) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ ඒ යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ යම් වරදක් සිදු කරන යම් තැනැත්තෙකු යම් සුළු වාරි කර්මාන්තයක් පවත්නා ප්‍රදේශයක් ඇතුලතදී වරෙන්තුවක් නොමැතිව අත්අඩංගුවට ගැනීමටද අධිකරණ බලය ඇති මහේස්ත්‍රාත්වරයෙකු හමුවට ඒ තැනැත්තා ඉදිරිපත් කිරීමටද බලය ලත් නිලධාරියෙකුට හැකි වේ.

(6) මෙම ප්‍රඥප්තිය යටතේ හෝ එය යටතේ සාදන ලද යම් නියෝගයක් යටතේ වරදක් සිදුකරනු ලැබ ඇති අවස්ථාවකදී එකී වරද සිදු කිරීමෙහිලා භාවිත කරනු ලැබ ඇති යම් භාණ්ඩයක් තහනමට ගැනීමද මහේස්ත්‍රාත්වරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි පරිදි වූ ස්ථානයක රඳවා තැබීමද කරනු ලැබිය හැකිය.

## IV වන කොටස
## පොදු විධිවිධාන

ගොවි සංවිධාන, උපදෙස්වලට අනුකූලව කටයුතු කළ යුතු බව

10 (1) මෙම ප්‍රඥප්තිය යටතේ කටයුතු කිරීමට අවශ්‍ය ප්‍රමාණයට අධ්‍යක්ෂවරයා ගොවි සංවිධාන වලට දෙන උපදෙස් වලට අනුව ගොවි සංවිධාන කටයුතු කල යුතුය.

(2) ගොවි සංවිධාන විසින් මෙම ප්‍රඥප්තිය යටතේ කල යුතු කටයුතු නොකිරීම නිසා අධ්‍යක්ෂවරයාට තමාගේ කටයුතු ඉටු කරගැනීමට නොහැකි විට ගොවි ජන සේවා දෙපාර්තමේන්තුවේ ජනරාල්වරයාගේ එකඟතාවය සහ එම පනතට අනුව කටයුතු සිදු කරවා ගත යුතුය.

නිලධරයන්ට බාධා කිරීම

11 (1) යම් තැනැත්තකු ඇලක්, සුළු වාරි මාර්ගයක් හෝ ජල මාර්ගයක් අවහිර කරන හෝ අනවසරයෙන් කොටු කර ගන්නා හෝ එවැනි දෙයකට හානි කරන හෝ හානියක් විය හැකි ක්‍රියාවක් කරන අවස්ථාවකදී එකී තැනැත්තා වෙත භාර දෙනු ලබන ලිඛිත දැන්වීමක් මගින් එකී දැන්වීමේ නිශ්චිතව සඳහන් කරනු ලබන යම් කාලයක් ඇතුලත එකී බාධා කිරීම හෝ අනවසරයෙන් කොටු කර ගැනීම ඉවත් කරන ලෙස හෝ නතර කරන ලෙස නියම කිරීම නීත්‍යානුකූල වන්නේය.

(2) (1) වන උප වගන්තිය යටතේ දැන්වීමක් ලැබූ යම් තැනැත්තෙකු එහි නිශ්චිතව සඳහන් කාලසීමාවක් ඇතුලත එකී දැන්වීමේ නියමයන්ටඅනුකූලව කටයුතු කිරීම ප්‍රතික්ෂේප කලහොත් හෝ අතපසු කලහොත් නැතහොත් එකී දැන්වීම භාරදිය යුත්තේ කවරෙකුටද යන්න පිළිබඳ සැකයක් තිබේනම්, අධ්‍යක්ෂවරයා විසින් එකී බාධා කිරීම හෝ අනවසර කොටු කර ගැනීම වහාම ඉවත් කිරීමට හෝ නතර කිරීමට කටයුතු කිරීම නීත්‍යානුකූල වන අතර අධ්‍යක්ෂවරයා විසින් එකී කාර්යය සඳහා අවශ්‍ය විය හැකි යම් ඉඩමකට හෝ පරිශ්‍රයකට ඇතුල්වී එකී ඉවත් කිරීම හෝ නතර කිරීම සඳහා අවශ්‍ය විය හැකි සියලු දේ කිරීම හෝ කිරීමට සැලැස්වීම නීත්‍යානුකූල වන්නේය.

(3) තත්කාර්යය සඳහා අධ්‍යක්ෂවරයා විසින් ලිඛිතව නම් කරනු ලැබූ වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ නිලධරයෙකු, මේ ප්‍රඥප්තියේ 9 වන වගන්තියේ නිශ්චිතව සඳහන් කර්තව්‍ය ඉටු කිරීම සඳහා බලයලත් නිලධරයෙකු විය යුතුය.

## V වනකොටස
## නියෝග පැනවීම

අමාත්‍යවරයා විසින් නියෝග සෑදීම කළ හැකි බව

12 (1) ප්‍රඥප්තියේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිණිස අවශ්‍ය වන්නාවූ යම් කාරණාවන් සම්බන්ධයෙන් මෙම ප්‍රඥප්තියේ 5,6,7,11 යන වගන්ති යටතේ අමාත්‍යවරයා විසින් නියෝග සෑදිය හැක.

(2) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කළ යුතුය. එසේ පළ කරනු ලැබූ සෑම නියෝගයක්ම පළ කරනු ලැබූ දින සිට හෝ එහි නිශ්චිතව සඳහන් වෙනත් යම් පසු දිනක සිට බලාත්මක විය යුතුය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එම නියෝග ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු, හැකි ඉක්මනින් අනුමැතිය සඳහා පළාත් සභාවට ඉදිරිපත් කළ යුතුය. එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක් එදින සිට ඒ යටතේ කලින් කරන ලද කිසිවකට අගතියක් නොමැතිව පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතුය.

(4) නියෝගයක් එසේ පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සලකනු ලබන දිනය ගැසට් පත්‍රයේ පලකරනු ලැබිය යුතුය.

## VI වන කොටස
අර්ථ නිරූපන

අර්ථ නිරූපණය 13 මේ ප්‍රඥප්තියේ පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වන්නේ නම් මිස

"ආණ්ඩුකාරවරයා" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව ප්‍රකාර බස්නාහිර පළාතේ ආණ්ඩුකාරවරයා ලෙස තත්කාලයේ ධුරය දරන තැනැත්තා අදහස් වේ.

"අමාත්‍යවරයා" යන්නෙන්, සුළු වාරි මාර්ග ක්‍රම පිළිබඳ විෂයය භාර පළාත් අමාත්‍යවරයා අදහස් වේ.

"ලේකම්වරයා" යන්නෙන්, සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමය පිළිබඳ විෂයය පවරනු ලැබ ඇති පළාත් අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා අදහස් වේ.

"පොලිසිය සහ මහජන සාමය" යන්නෙන් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 13 වන සංශෝධනයේ නවවන උප ලේඛනයේ I වන වගන්තියේ දී ඇති අර්ථ නිරූපණයම අදහස් වේ.

"සුළු වාරිමාර්ග" යන්නෙන්, පළාත් එකකට වැඩි සංඛ්‍යාවක් හරහා දිවෙන ගංගාවලට අදාල වූ වාරි යෝජනා ක්‍රම, අන්තර් පළාත් වාරි කර්මාන්ත කටයුතු සහ ඉඩම් සංවර්ධන යෝජනා ක්‍රම හැර බස්නාහිර පළාත තුල කර ගෙන යනු ලබන වෙනත් යම් වාරි කර්මාන්ත අදහස් වේ.

"සුළු වාරි කර්මාන්ත" යන්නට -

(අ) සුළු වාරි කර්මාන්තයක් සංයුක්තය වන හෝ ඊට

අනුපාතික වන හෝ අනුයාත වන යම් වැවක්, අමුණක්, ඇළක්, වාරි මාර්ගයක් හෝ ශාඛා ජල මාර්ග;

(ආ) සුළු වාරි කර්මාන්තයක් ඉදි කිරීම හෝ නඩත්තු කිරීම සංයුක්ත වන හෝ ඊට අනුපාතික වන හෝ අනුයාත වන යම් කටයුත්තක්;

(ඇ) වගා කළ යම් ප්‍රදේශයක ලවණ ජලය බැස යාමට සැලැස්වීම හෝ ඒ ප්‍රදේශයට ලවණ ජලය ගලා ඒම හෝ ඉන් පිටතට ගලා යාම වැළැක්වීම විධිමත් කිරීම හෝ එවැනි ප්‍රදේශ ජල ගැලීම්වලින් ආරක්ෂා කිරීම සඳහා ඉදි කරන ලද යම් ඉංජිනේරු කර්මාන්තයක් සැළසුම් කිරීඹ, නිර්මාණය කිරීම,ඉදි කිරීම, නඩත්තු කිරීම, අලුත්වැඩියා කිරීම සහ පුනරුත්ථාපනය කිරීම ඇතුළත් වේ.

"සුළු වාරිමාර්ග යෝජනා ක්‍රමය" යන්නෙන්, සුළු වාරිමාර්ග කටයුතු හා සම්බන්ධ වූ සුළු වාරි මාර්ග යෝජනා ක්‍රම සහ ස්වාභාවික ජල මාර්ග අදහස් වේ.

"දූෂණය" යන්නෙන්, පරිසරයේ යම් කොටසක භෞතික, තාප, රසායනික හෝ ජීව විද්‍යාත්මක විකිරණශීලි ගුණාංග එහි යහපත් භාවිතයට අහිතකර ලෙස බලපාන ආකාරයෙන් හෝ මහජන සෞඛ්‍යට,ආරක්ෂාවට හෝ ශුභ සිද්ධියට හෝ සතුන්, පක්ෂීන් වන ජීවීන්, ජලජ ජීවීන් හෝ පරිසරයට අන්තරායකාරි හෝ අන්තරායකාරි වීමේ හැකියාව සහිත තත්වයක් ඇතිවන ආකාරයෙන් අපද්‍රව්‍ය පිට කිරීම හෝ තැන්පත් කිරීම මගින්, සෘජුව හෝ වක්‍රාකාරයෙන් වෙනස් කිරීම අදහස් වේ.

"ජල මාර්ගය" යන්නෙන්, ජලය ගලා යාම සඳහා ස්වාභාවිකව නිර්මාණය වී ඇති පළාත තුල ගංගාවක්, අතුගංගාවක්, විලක් හෝ ඇළක් අදහස් වේ.

***2014.07.16** වන දින පැවැත් වූ ප්‍රඥප්ති හා නීති කාරක සභාවේදී ඉදිරිපත් වූ සංශෝධනයන් :*

ප්‍රඥප්ති කෙටුම්පතේ නාමය ලෙස, "*බස්නාහිර පළාතේ 2014 අංක ......... දරන සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය*" ලෙස නම් කිරීම සුදුසු බවට යෝජනා කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ දීර්ඝ නාමයේ පස්වන පේළියේ "*පිණිස*" යන්න "*පිණිසද*" ලෙස සංශෝධනය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ 1 වන වගන්තියේ පළමුවන පේළියේ "*2013*" යන්න "*2014*" ලෙස සංශෝධනය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ I වන කොටසෙහි 2 වන වගන්තියේ, පළමුවන පේළියේ "*පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව*" යන්න "*බස්නාහිර පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුව*" ලෙස සංශෝධනය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ 3 (1) වගන්තියේ, තුන්වන පේළියේ "*පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා*" යන්න "*බස්නාහිර පළාත් වාරිමාර්ග අධ්‍යක්ෂවරයා*" ලෙස සංශෝධනය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ 3 (2) වගන්තියේ, පළමුවන පේළියේ "*ඉංජිනේරු සේවයේ*" යන්න "*ශ්‍රී ලංකා ඉංජිනේරු සේවයේ*" ලෙස සංශෝධනය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ II වන කොටසෙහි 5 (ඉ) වගන්තියේ, අවසාන පේළියේ ඇති "*කරනු ලබා දීම*" යන වචන ඉවත් කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ (5) වන වගන්තියෙන් මෙන්ම අනෙකුත් වගන්තිවලින් අධ්‍යක්ෂවරයාට අසීමිත බලයක් පැවරෙන බැවින් එය යම් සීමාවකට යටත් කළ යුතු බව කාරක සභාව අදහස් කරන ලදින්, කෙටුම්පතේ පවතින (5) වන වගන්තිය 5 (1) ලෙස අංකනය කර 5 (2) ලෙස පහත නව වගන්තිය ඇතුළත් කිරීම සුදුසු බව තීරණය කරන ලදී.

5 (2) නව වගන්තිය :

"*මෙම ප්‍රඥප්තියේ සඳහන් කවර වූ හෝ වගන්තියකින් වුවද අධ්‍යක්ෂවරයා වෙත ලැබී ඇති සියලුම බලතල පහත සීමාවන්ට යටත් විය යුතුය. එනම් අධ්‍යක්ෂවරයා විසින් පළාත් සුළු වාරිමාර්ගවලට අදාළ කිසිදු ස්වභාවික සම්පතක් විකිණීම, බදුදීම කවර වූ හෝ වාණිජ අරමුණකින් භාවිතා කිරීම හෝ කිරීමට ඉඩ හැරීම කිසිදු ස්වභාවික සම්පතකට වාණිජමය අරමුණක් අරඹයා මිලක් නියම කිරීම කළ නොකළ යුතුය.*"

ප්‍රඥප්ති කෙටුම්පතේ III වන කොටසෙහි 8 (ඉ) වගන්තියේ අවසානයේ ඇති "*මෙහෙයවීම*" යන්න "*මෙහෙයවන*" ලෙසත්, 8 (ඊ) වගන්තියේ අවසානයේ ඇති "*කර ගැනීම*" යන්න "*කර ගන්නා*" ලෙසත්, 8 (උ) වගන්තියේ, අවසාන පේළියේ ඇති "*යම් තැනැත්තෙකු*" යන වචන 8 වන වගන්තියේ අවසාන පේළිය වන "*මෙම ප්‍රඥප්තිය ප්‍රකාරව වරදකට වරදකරු විය යුත්තේ ය*" යන්නට මුලින් එකතු කර එම පේළිය "*යම් තැනැත්තෙකු මෙම ප්‍රඥප්තිය ප්‍රකාරව වරදකට වරදකරු විය යුත්තේ ය*" ලෙසත් සංශෝධනය කළ යුතු බව කාරක සභාව විසින් තීරණය කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ 9 (3) වගන්තියේ, අවසාන පේළියේ ඇති "*බැලූ බැල්මට*" යන වචන ඉවත් කරන ලදී.

ප්‍රඥප්ති කෙටුම්පතේ 9 (4) වගන්තියේ, ඇති පැති සටහන වන "*බලයලත් නිලධරයන් සාම නිලධරයන් ලෙස සලකනු ලැබිය යුතු බව*" 9 (5) වගන්තියේ පැති සටහන ලෙස යෙදිය යුතු බවට කාරක සභාව විසින් යෝජනා කරන ලදී.

එසේම පැති සටහන් ඊට අදාළ වගන්ති ඉදිරියේ නිවැරැදිව දැක්විය යුතු බවත්, කාරක සභාව විසින් පෙන්වා දෙන ලදී.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීට අමතරව සංශෝධන කිසිවක් ඉදිරිපත් කිරීමට තිබෙනවාද?

සංශෝධන කිසිවක් නොමැති බැවින්, 2014.07.16 දින ප්‍රඥප්ති හා නීති කාරක සභාවේ සංශෝධනයන්ට[4] යටත්ව මෙම ප්‍රඥප්ති කෙටුම්පත පිළිබඳව එකඟතාවය විමසනවා.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

## බස්නාහිර පළාතේ 2014 අංක .... දරන සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය : තෙවනවර කියැවීම
## MINOR IRRIGATION STATUTE OF WESTERN PROVINCE NO…. OF 2014: THIRD READING

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාතේ 2014 අංක ....... දරන සුළු වාරිමාර්ග ප්‍රඥප්තිය"* තෙවනවර කියැවීම සඳහා ඉදිරිපත් කරනවා.

***සංශෝධිත ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Amended, Question put and agreed to*

## ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව
## BY-LAW RELATING TO PARKING OF THREEWHEELERS: DODANGODA PRADESHIYA SABHA

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද දොඩන්ගොඩ ප්‍රාදේශීය සභාවේ - "ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව" නම් වූ අතුරු ව්‍යවස්ථාවන්,*

*1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1824 දරන හා 2013.08.16 වැනි දිනැති ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවනට අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින් එම අතුරු ව්‍යවස්ථාවන්, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නම් එම යෝජනාව විස්තරාත්මකව සලකා බැලීම සඳහා ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරන්න පුළුවන්.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, දොඩන්ගොඩ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව මීට පෙරත් ඉදිරිපත් වුණා. නැවත ආවේ කොහොමද?

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

මේක ආපහු ගන්න අවශ්‍ය නැහැ ගරු සභාපතිතුමනි. ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යන්න අවශ්‍ය නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අවශ්‍ය නැහැ නේද?

[4] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

එක තමයි මම හිතන්නේ මේක ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යන්න අවශ්‍ය නැහැ. අනු ව්‍යවස්ථාවන් හදන්නේ අදාළ පළාත් පාලන ආයතනය. ඒක නිසා අපට තිබෙන්නේ ඒක අනුමත කිරීම පිළිබඳව තීන්දුව. මම අහන්නේ මීට කලිනුත් දොඩන්ගොඩ ත්‍රීරෝද රථ නැවැත්වීම සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථාවක් අපි සම්මත කළා.

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ආවේ නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ආවා මහ ඇමැතිතුමා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ ආවේ බණ්ඩාරගම, පානදුර.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දොඩන්ගොඩ ආවා. බලන්න කෝ? කමක් නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි ඒ සම්බන්ධව බලන්නම්. පානදුර නැත්නම් බණ්ඩාරගම සම්මත වුණේ.

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

දොඩන්ගොඩ ආවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

අපි බලමු. එහෙම නම් මෙම අතුරු ව්‍යවස්ථාවට එකඟතාවය?

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරි හා අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව : මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව
BY-LAW RELATING TO OFFENSIVE TRADES, DANGEROUS TRADES AND DANGEROUS AND OFFENSIVE TRADES

**ගරු ප්‍රසන්න රණතුංග** - ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු සභාපතිතුමනි, *"1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 122 (1) වගන්තිය යටතේ මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද මීනුවන්ගොඩ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පීඩාකාරී ව්‍යාපාර, අන්තරාදායක ව්‍යාපාර හා පීඩාකාරි - අන්තරාදායක ව්‍යාපාර පිළිබඳ අතුරු ව්‍යවස්ථාව නම් වූ අතුරු ව්‍යවස්ථාව, 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 123 (1) වගන්තිය යටතේ, එවකට බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍ය, මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස් බල හා රැකීරක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති හා වෙළඳ අමාත්‍යවරයා වෙත පැවරී ඇති බලතල අනුව අනුමත කර,*

*එම අනුමැතිය පිළිබඳ නිවේදනය, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අංක 1846/13 දරන හා 2014.01.20 වැනි දිනැති අතිවිශේෂ ගැසට් පත්‍රයේ පළ කරන්නට යෙදුන අතර,*

*එකී අතුරු ව්‍යවස්ථාවන්ට, අවසර නොදීම නොකරන ලෙසට යෝජනා කරමින්ම, එම අතුරු ව්‍යවස්ථාවන් 1989 අංක 12 දරන පළාත් සභා (ආනුෂංගික විධිවිධාන) පනතේ 2 වන වගන්තිය සමග කියවිය යුතු 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 125 වන වගන්තිය යටතේ මෙම බස්නාහිර පළාතේ පළාත් සභාවට ඉදිරිපත් කරමි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු සභාපතිතුමනි, ගරු ප්‍රධාන ඇමැතිතුමාගෙන් පොඩි පැහැදිලි කර ගැනීමක් කර ගන්න අවශ්‍යයි. මේ ගැසට්

නිවේදනය ගැසට් කළාට පස්සේ තමයි ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ යෝජනාව සභාවට ගෙන එන්නේ. මේ ගැසට් නිවේදනය සම්බන්ධව යම් විවාදයක් තිබෙනවා. එහි විෂයය පථය සහ එහි අපැහැදිලිකම්, විශේෂයෙන් කර්මාන්තවල වර්ගීකරණය සම්බන්ධව අපැහැදිලිකම් තිබෙනවා. එතකොට මේ සභාව තුළ මේක විවාදයට ගන්නේ කොහොමද කියලා අපට ගැටළුවක් තිබෙනවා. අද වනකොට මේක ගැසට් නිවේදනයක් විධියට නිකුත් කරලා තිබෙනවා. ඒක තමයි ගරු ප්‍රධාන ඇමැතිතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. මේ සම්බන්ධව ඔබතුමාගෙන් පොඩි පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ව්‍යාපාර වර්ගීකරණයේ වැරැද්දක් තිබෙනවා.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ව්‍යාපාර වර්ගීකරණයේ වැරැද්දක් කියන්නේ, ව්‍යාපාර වර්ගීකරණය සම්බන්ධව අදාළ දේවල් අතහැරිලා තිබෙනවා.

**ගරු ප්‍රසන්න රණතුංග -** ප්‍රධාන අමාත්‍යතුමා
Hon. Prasanna Ranatunga - Chief Minister

ගරු මන්ත්‍රීතුමා අපට පුළුවන් ඒ පිළිබඳව ඔබතුමන්ලාගේ අදහසක් තිබෙනවා නම්, මේක ඉදිරිපත් කළාම සංශෝධන ඉදිරිපත් කරන්න. එතකොට අපට ඒ සංශෝධනත් එක්ක ඉදිරිපත් කරන්න පුළුවන්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ප්‍රධාන ඇමැතිතුමා විසින් ඉදිරිපත් කරන ලද එම යෝජනාව අනුව තවදුරටත් සාකච්ඡා කිරීමට කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරනවා. ඔබතුමා ඉදිරිපත් කළ කාරණා සම්බන්ධයෙන් අපට සභාවේදී සාකච්ඡා කරන්න පුළුවන්. මෙම අතුරු ව්‍යවස්ථාව විවාදයට ගන්න අවස්ථාවේදී ඔබතුමාට අවස්ථාව ලබා දෙන්නම්.

***කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කරන ලෙසට නියෝග කරන ලදී.***
*It was ordered to refer the draft statute to the Committee on Statutes and Laws.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී මෙම සභාව පෙරවරු තේ විවේකය සඳහා විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්හිටුවන ලදින් අ.භා. 12.04 ට යළිත් රැස් විය.***
*Sitting accordingly suspended until 12.04 p.m. and then resumed.*

## පෞද්ගලික මන්ත්‍රී යෝජනාව :
PRIVATE MEMBERS MOTION:

## පවතින නීතිරීතිවලට අනුගතව ඉඩම් අත්පත් කර ගන්නා මෙන් අදාළ නිලධාරීන් දැනුවත් කළ යුතු බව රජයට යෝජනා කිරීම
PROPOSING TO THE GOVERNMENT TO INFORM RELEVANT AUTHORITIES TO ACQUIRE LANDS ACCORDING TO THE EXISTING LAWS AND REGULATIONS

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, "*බස්නාහිර පළාත තුළ මධ්‍යම ආණ්ඩුව මගින් විවිධ සංවර්ධන යෝජනා ක්‍රමවල නාම කරන යොදා ගනිමින් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලීන් සීඝ්‍ර ලෙස සිදු කරමින් පවතී. මෙම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ ඇතැම් ස්ථාන සඳහා ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනතේ හෝ ඒ ආශ්‍රිත රෙගුලාසීන් අනුගමනය නොකිරීම නිසා පළාතේ ජනතාව මහත් අසීරුතාවයට මුහුණ පා ඇත. නෛතිකව ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ හිමි විය යුතු වන්දි මුදල් හෝ විකල්ප සහනද බොහෝ අවස්ථාවලදී හිමි නොවේ. නෛතිකව ඉඩම් අත්පත් කර ගත හැක්කේ මහජන කාර්යයන් සඳහා පමණක් වන අතර, ඉන් පරිබාහිර කරුණු සඳහා ඉඩම් අත්පත් කර ගත නොහැක. එබැවින් පවතින නීතිරීතිවලට අනුගතව පමණක් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු කරන ලෙසට ඊට අදාළ වගකිවයුතු නිලධාරීන් මෙන්ම මැති ඇමැතිවරුන්ද වහා දැනුවත් කළ යුතු යැයි මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව රජය වෙත යෝජනා කර සිටියි.*"

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

***[විසින් ස්ථිර කරන ලදී. ]***
*[Seconded]*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

[අ.භා. 12..05]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මෙම යෝජනාව මේ සභාව වෙත රැගෙන ඒමට පාදක වුණේ, ඔබතුමා දන්නවා, මේ මොහොත වනකොට සීඝ්‍ර ලෙස ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියක නාගරික සංවර්ධන අධිකාරිය නියැලෙමින් සිටින බව. විශේෂයෙන්ම කොළඹ නගර සභා බල ප්‍රදේශය තුළ බහුලවත් ඊට පරිබාහිරව ගම්පහ සහ කළුතර දිස්ත්‍රික්කවලත් මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය සිදු වෙමින් පවතිනවා. ගරු සභාපතිතුමනි, මෙම ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ සාමාන්‍ය ජනතාවට, මාධ්‍යම පාන්තික ජනතාවට විශාල හානියක්, කරදරයක් සිද්ධ වෙනවා. මම මූලිකවම කියන්න ඕනෑ, මෙම අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය බහුල වශයෙන් ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීමේ ආඥා පනත, නාගරික සංවර්ධන අධිකාරී පනත අමු අමුවේ උල්ලංඝණය කරලා තමයි සිද්ධ වෙන්නේ. ගරු සභාපතිතුමනි, මේක නාගරික සංවර්ධන අධිකාරියේ හයියට, ඇගේ හයියට, හමුදාවේ හයියට සිද්ධ වන දෙයක්. මේ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ මේ රටේ නීතිය අනුගමනය කරන්නේ නැහැ. මෑත කාලීන ඉතිහාසය ගත්තොත් අපි දැක්කා මේක පටන් ගත්තේ කොම්පඤ්ඤවීදියෙන්. හිටපු ගමන් ගියා. බැකෝ යන්ත්‍රවලින් ගියා. කඩලා දැම්මා. ඊට පස්සේ තමයි වන්දි ක්‍රියාවලිය, එහෙම නැත්නම් ඒ මිනිස්සුන්ගේ අඥානාව පිළිබඳව සවන් දෙන්න පටන් ගත්තේ. ඊට පස්සේ බ්ලූමැන්ඩල්වලට ගියා. ඊට පස්සේ දෙමටගොඩට ගියා. මේ ක්‍රියාවලිය තුළ අපි දැක්කා, බොරැල්ල ආසනයේ වනාතමුල්ලට ගියාට පස්සේ කිසියම් සංධිස්ථානයකට මේක ආවා. අපි මේ රටේ යන්න පුළුවන් මහජන ආයතනවලට ගිහිල්ලා, පාර්ලිමේන්තුවට ගිහිල්ලා, මානව හිමිකම් කොමිසමට ගිහිල්ලා, හෙට දවසේ අභියාචනාධිකරණයට පෙත්සමක් ගොනු වෙනවා. එතකොට මේ සියලු කාරණා හරහා තමයි නාගරික සංවර්ධන අධිකාරිය පියවරක් පස්සට අරගෙන බැලුවේ, ඇත්ත තමයි මේ රටේ නීතියක් තිබෙනවා කියලා. ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ, ඉඩම් අත්පත් කර ගැනීමේ ආඥා පනත, රජයේ ඉඩම් සන්තකය ආපසු පවරා ගැනීම සහ අඩුම තරමින් තමන්ගේ මව් පනත වන නාගරික සංවර්ධන අධිකාරී පනත දිහා ඇහැ ඇරලා බැලුවේ මේවායින් පස්සේ. ගරු සභාපතිතුමනි, මම දන්නවා මෙන්න මේ කරුණු කාරණාවලදී ඉතාමත් ලැජ්ජාශීලී ලෙස නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරී මහත්වරු, හමුදාවේ උදවිය හැසිරෙන්න පටන් ගත්තා. ඔබතුමාට මම සභාගත කරනවා HRC 1816/13 දරන නඩුවේ වාර්තාවක්. ඒ වාර්තාවට අනුව කියනවා, බොරැල්ල ආසනයේ වනාතමුල්ලේ 45 වත්ත, 34 වත්ත, 49 වත්ත සහ ටී 20 වත්ත, සරණපාල හිමි මාවත, සීවලී පටුමග මේ පටුමගවල් අත්පත් කර ගන්නේ නැහැයි කියලා. ඒක කිව්වේ ඡන්දය කාලයේ. මේ තිබෙන්නේ, මානව හිමිකම් කොමිෂන් සභාවෙන් දීපු වාර්තාවක්. ඒ වාර්තාවේ තීන්දුවක් හැටියටම ආවා නාගරික සංවර්ධන අධිකාරිය පුනර්ජීවන ක්‍රියාවලියෙන් ඉවත් වෙනවා කියලා. හැබැයි, ඡන්දය ඉවර වුණා විතරයි අන්න දැන් 43 වත්ත ඩෝසර් කරලා. 34 වත්තේ මිනිස්සු හෙට අභියාචනාධිකරණයට යනවා මෙන්න මේ තීන්දුවට අපහාසයක් කළා කියලා කියන්න. එතකොට ගරු සභාපතිතුමනි, මොකක්ද මේ ක්‍රියාවලිය. එතකොට ඡන්දය කාලෙට එකක්. ඊට පස්සේ තව එකක්.

ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මේගොල්ලෝ ගියා කොටා රෝඩ් එකේ 188 වත්තට. ඩෝසර් කළා. ඊට පස්සේ ගියා නාරාහෙන්පිට බේකරි වත්තට. ඩෝසර් කළා. එතකොට මේ පවරා ගත්තු කොම්පඤ්ඤවීදියේ ඉඩම, ඊට පස්සේ නාරාහේන්පිට ඉඩම්, මොකක්ද මේගොල්ලෝ ඉඩම් අත්පත් කර ගැනීමෙන් බලාපොරොත්තු වෙන්නේ. ගරු සභාපතිතුමනි, වගකීමෙන් කියන්නේ Island පුවත්පතේ, පුවත්පත් දැන්වීමක් දාලා තිබුණා. නාරාහේන්පිට හන්දියේ බෝගහ යට තිබෙන ඉඩම පර්චස් 117 යි, අන්න 99 අවුරුදු බද්දට විකුණන්න දාලා. අපි කියන්නේ ඒවා බදු නොවෙයි, විකුණනවා කියලා. අවුරුදු 99 කට නාගරික සංවර්ධන අධිකාරිය වෙළෙන්දෙක් හොයනවා. අන්න විකුණන්න දාලා. හැබැයි -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

දැන් 99 ට බැහැ. දැන් 33 ට තියෙන්නේ මන්ත්‍රීතුමා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි දන්නේ නැහැ පුවත්පත් දැන්වීමේ එහෙම තිබුණේ. එතකොට ගරු සභාපතිතුමනි, මම කියන්නේ -

**ගරු උපාලි කොඩිකාර** (විදුලිබල හා බලශක්ති, පළාත් මාර්ග, නිවාස හා ඉදි කිරීම්, ජල සම්පාදන හා ජලාපවාහන, සමාජ සුභසාධන සහ නාගරික හා වතු යටිතල පහසුකම් අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

මොකක්ද පත්තරේ?

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඔබතුමා කරුණු දැනගෙන කථා කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

Island පුවත්පතේ. වගකීමෙන් මා ඒ -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කෝ පත්තරේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

දැන්වීම දාලා තිබෙනවා, මම -

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පත්තරේ සභාගත කරන්න. දෙන්න පුළුවන් 35 යි.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

එහෙම එකක් තිබෙනවා. ඔබතුමා අභියෝගය භාර ගන්නවා නම්, මම ලබන සභා වාරයට සභාගත කරනවා. මම මගේ මන්ත්‍රී ධූරයෙන් අස් වෙනවා එහෙම දැන්වීමක් නැත්නම්. වගකීමෙන් කියන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

කොහේද කියලා තිබෙන්නේ, අවුරුදු 35 යි කියලා. මොන නීතියේද කියලා තිබෙන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට බාධා කිරීම් කරන්න එපා. ඔබතුමා කථා කරන්න. අනවශ්‍ය විවාදවලට ඔබතුමා යන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මේක අස්සේ තවත් කථාවක් තිබෙනවා. ඊට පස්සේ ගරු සභාපතිතුමනි, මේවායෙන් හානි වෙන්නේ කාටද? එතකොට අපි දන්නවා, තමන්ගේ ඉඩම තුළ සිටින තැනැත්තන්ට යෝජනා කරනවා කිසියම් නිවාසයක් දෙනවා කියලා. හැබැයි අපි දන්නවා ඒ නිවාසවල තිබෙන ප්‍රමිතිය මොකක්ද කියලා. ඒ විතරක් නොවෙයි. වෙළඳ සැල්වලටත් අද මේ තත්ත්වය උදා වෙලා. අවාසනාවට ගරු සභාපතිතුමනි, සමහර තැන්වල විශේෂයෙන්ම කොළඹ නගරයේ එක්සත් ජාතික පක්ෂයේ නගර සභාවක් තිබෙන්නේ. හැබැයි මේ එක්සත් ජාතික පක්ෂයේ නගර සභාව, මේ බල ප්‍රදේශය තුළ සිද්ධ වන කටයුතුවලට - කනගාටුයි කියන්න නගර සභාවේ නගරාධිපතිවරයා ඊනියා ඉවත් කිරීම වෙනුවෙන් පෙනී හිටින්නේ නැහැ. හැබැයි, ඡන්දය ගන්න කාලේ කිව්වේ මේ කොළඹ නගරයේ තිබෙන කඩයකට, ගෙයකට අත තිබ්බොත් එහෙම, එයාට ඒ අත තියන්න වෙන්නේ මුසම්මිල්ගේ මළ කඳ උඩින් කියලා. එහෙම තමයි කිව්වේ. ඒ විතරක් නොවෙයි. කළුතර පසුගිය සතියේ කඩ 91 ක් ඉවත් කළා. කළුතර නගර සභාව එක්සත් ජාතික පක්ෂ නගර සභාවක්.

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

ඒවා අනවසර.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මයික්‍රෆෝන් පාවිච්චි කරලා බාධා කිරීම් කරන්න එපා. ඔබතුමාට කථා කරන්න අවස්ථාවක් දෙන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, කඩ කාමර 91 ක් ඉවත් කිරීමේ කටයුත්තකට ගියා පසුගිය 07 වැනි මාසේ 07 වැනිදා ලිපියක් මගින්. 2014.07.11 දිනට පෙර ඉවත් වෙන්න

[ ගරු සුනිල් වටගල ]

කියලා කළුතර නගර සභාව ආශ්‍රිතව තිබුණු වෙළඳ සැල් 91 කට දැන්වීම දීලා දවසයි දුන්නේ. ඊට පස්සේ මානව හිමිකම් කොමිෂන් සභාවේ පැමිණිල්ලක් කළා. ඒ පැමිණිල්ල පිළිබඳව ආරංචි වුණු ගමන්ම දැන්වීමක් නැතුව කඩ 91 ම ඩෝසර් කළා ගරු සභාපතිතුමනි. මේ නගරාධිපතිවරයා ඒ වෙළෙන්දන්ට මොකක්ද කියලා තිබෙන්නේ? ඒ වෙළඳ මහතුන්ට ලිපියක් එවලා තිබෙනවා, විකල්ප ස්ථානයක් සොයා ගැනීමට පියවර ගන්න කියලා. අවුරුදු 20 ක් 25 ක් තිස්සේ වෙළඳාම් කරපු මිනිස්සු. හිටපු ගමන් නගර සභාවේ සභාපතිවරයා ලිපියක් එවනවා, නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒ අයට දැනුම් දුන්නා කියලා විකල්ප ස්ථාන සොයා ගන්න කියලා. ගරු සභාපතිතුමනි, මෙහෙම සභාපතිවරුන්ගෙන් ඇති වැඩක් තියෙනවාද? මුසම්මිල් මහත්මයා කියනවා -

**ගරු සුමිත් ලාල් මෙන්ඩිස්**
Hon. Sumith Lal Mendis

නගරාධිපතිවරු සපෝර්ට් කරනවා සංවර්ධනයට. UNP එකේ මොකෝ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා මම ඔබතුමාට මතක් කළා මයික්‍රෆෝනය On කරගෙන බාධා කිරීම් කරන්න එපාය කියලා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ විතරක් නොවෙයි ගරු සභාපතිතුමනි,

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට කාලය දෙන්නම්.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, ඕල්කට් මාවතේ -

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රජයේ ඉඩම්වලින්ද අයින් කරන්නේ?

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

පෞද්ගලික ඉඩම් සහ රජයේ ඉඩම්.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කථා කරන්න. බාධා කිරීම්වලට යන්න එපා. විවාදවලට යන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, තමුන්නාන්සේ පසුගිය දවස්වල දැක්කා ඉතාම බලහත්කාරී ලෙස - ඕල්කට් මාවතේ කඩ කාමර ඉවත් කරන්න එපාය කියලා ඊට දවස් දෙකකට කලින් මානව හිමිකම් කොමිෂන් සභාවේ එකඟතාවයක් ඇති වුණා. හැබැයි ඒ කොමිෂන් සභාවේ තීරණය පැත්තකට දාලා, තමුන්නාන්සේලා දකින්න ඇති මීට දවස් දෙකකට ඉස්සෙල්ලා කඩ කාමර ටික ඩෝසර් කළා. ගරු සභාපතිතුමනි, ඒ වෙළෙන්දෝ ඉල්ලා සිටින්නේ, එක දෙයයි. නාගරික සංවර්ධනයක් තිබෙනවා නම්, අත උත්සලා ඒකට සහයෝගය දෙනවා. හැබැයි, ඔවුන්ට හොඳ විකල්ප ස්ථානයකුයි ගරු සභාපතිතුමනි ඉල්ලා සිටින්නේ. ඔවුන්ට කියනවා, අර පිටකොටුවේ තිබෙන පාවෙන වෙළඳසැල්වලට යන්න කියලා. ගරු සභාපතිතුමනි, පිටකොටුවේ වෙළඳාම කියන්නේ අමුතු එකක්. ඒ කියන්නේ වේගයෙන් බස් එකට යන, වේගයෙන් කෝච්චියට දුවන පාරිභෝගිකයාට, මගියාට තමයි මේ භාණ්ඩ විකුණන්නේ. එතකොට ඊට වඩා වෙනත් පරිබාහිර ස්ථානයක කඩ කාමර ඉදි කළාට පස්සේ ඔවුන්ට අදාළ වෙළඳාමක් එතැන කර ගන්න බැහැ. එහෙම නම් ගරු සභාපතිතුමනි, මෙන්න මේ තත්ත්වය මත අද සිද්ධ වෙලා තිබෙන්නේ, නාගරික සංවර්ධන අධිකාරී පනත අනුව එහෙම නැත්නම් ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලියකට අනුගතව මේ ඉවත් කිරීම් සිද්ධ වෙනවා නම් ගරු සභාපතිතුමනි, ඔවුන්ට විකල්ප ස්ථාන තිබෙනවා. මේ ගරු ඇමැතිතුමා දන්නවා ඇති, මාර්ගයකට ඉඩමක් අත්පත් කර ගන්නකොට ඒක අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය තුළ ඒකේ ලාෆ් කමිටුව කියලා එකක් තිබෙනවා. සුපර් ලාෆ් කියලා තිබෙනවා. එතකොට ඒ ලාෆ් කමිටුවලට, සුපර් ලාෆ් කමිටුවලට අනුව ගරු සභාපතිතුමනි, ඔවුන්ට කිසියම් වන්දි මුදලක් හිමි වෙනවා. හැබැයි මේ ක්‍රියාවලිය තුළ අද නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරන්නේ, තනිකර හමුදා අනුකණ්ඩයක් හැටියට. මම දැක්කා, මේ සභාවේ මන්ත්‍රීවරු ඔය වචනය අවස්ථා ගණනාවකදීම පාවිච්චි කළා. ඒක නිසා මේ සියල්ල ඩෝසර් කරලා, රටේ නීතියත් ඩෝසර් කරලා මේ තිබෙන නිවාස ටික,

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ 89 කාලේ කරපුවා ඔය කියන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ව්‍යාපාරික ස්ථාන ටික ඩෝසර් කරමින් යනවා. ඒ අනුව ගරු සභාපතිතුමනි, අපි කියනවා පළාත් පාලන ආයතනවලට, විශේෂයෙන් මේ නාගරික සංවර්ධන අධිකාරියේ අනීතික අණසකට යට වෙන්න එපා. ගරු සභාපතිතුමනි, කනගාටුයි කියන්න. කළුතර නගරාධිපතිවරයා පඹයෙක්. පඹයෙක්, ඒ වාගේම තමයි මුසම්මිල් මහත්තයා. කොළඹ නගර සභාවේ නගරාධිපතිවරයා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා දිගින් දිගටම බාධා කිරීම් කරන්න එපා.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

කොළඹ නගර සභාවේ නගරාධිපතිවරයා මේ සියල්ල බලාගෙන ඇස් කන් පියාගෙන ඉන්නවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එතුමාට කථා කරන්න අවස්ථාව දෙන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු සභාපතිතුමනි, මුසම්මිල් මහත්තයා මොකක්ද කියන්නේ? ගෝඨාභය කියනවා නම් කඩේ නොවෙයි සුපර් මාර්කට් වුණත් යන්න ලැහැස්තියි කියලා අද එතුමා කියන්නේ. ගරු සභාපතිතුමනි, අපි කියනවා මේ පළාත් පාලන ආයතනවල -

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමාගේ කාලය අවසන් ගරු මන්ත්‍රීතුමා. කථාව අවසන් කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අද පළාත් පාලන ආයතන මේ නාගරික සංවර්ධන අධිකාරියේ යකඩ සපත්තුවට යට වෙලා මේ රටේ අණපනත් ටික, නීතිය ඩෝසර් කරලා තිබෙනවා. ඒක අතිශය වැරැද්දක්. ඒ අනුව කරුණාකරලා අපි යෝජනා කර සිටින්නේ, මේ කියන ඉඩම් අත්පත් කර ගැනීමේ ක්‍රියාවලිය නීතියට අනුගතව සිද්ධ කරන්න කියලා.

[අ.භා. 12..16]

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

ගරු සභාපතිතුමනි, අපේ රටේ අනවසර ඉදි කිරීම් ඉවත් කරනවා, කඩ කඩනවා කියලා ලොකු ආන්දෝලනයකට පත් කරලා තිබෙනවා. විශේෂයෙන්ම ජනතා විමුක්ති පෙරමුණ. විශේෂයෙන්ම මම කළුතර නගරය තමයි දේශපාලන අධිකාරිය හැටියට සම්බන්ධීකරණය කරන්නේ. කළුතර නගරයේ නගර සභාව දැනුවත්ව මීට පෙර හිටපු නගරාධිපතිවරු යටතේ ඉදි කිරීම් රාශියක් ඉදි කරලා තිබුණා. මෙතුමා කිව්වේ, කඩ 91 ක් කියලා. කඩ 152 ක් තිබුණා. මා ළඟ ලිඛිතව තිබෙනවා. 2004 නගර සභාව මේ ගිවිසුම අත්සන් කරලා -

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ ඔක්කෝම කැඩුවාද?

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

භූමියේ අයිතිය තිබෙන්නේ PRD එකට. පාරක Reservation. අනෙක් පැත්තෙන් Post Office එකේ නිවාස

[ ගරු පී.ආර්.පී. අබේගුණවර්ධන ]

සංකීර්ණය තිබුණු එකේ Reservation. මෙපමණ කාලයක් මහජනතාව කෝච්චියෙන් බැහැලා තමන්ගේ බස් නැවතුම් පොළට ආවේ පාර දිගේ. එන්න අපහසුතාවයකට පත් වෙලා. අනවසර ඉදි කිරීම්. නමුත් අනවසර ඉදි කිරීම් වුණත් එක්සත් ජාතික පක්ෂ පාලනයක් තියෙන කොට තමයි නගර සභාව මේක දීලා තිබෙන්නේ. අවශ්‍ය වූ ඕනෑම විටක ඉවත් කර ගන්න බවට කොන්දේසි අත්සන් කරලා. මේ කොන්දේසි සියල්ලටම ඉඩ දෙනවා. නගර සැලසුම් කරනකොට, නගර සැලැස්මට අවශ්‍ය වූ ඕනෑම විටක ඉවත් වෙනවා කියලා කොන්දේසි දාලා තිබෙනවා. නමුත් ඒ සියලුම කොන්දේසි උල්ලංඝණය කරලා තිබෙනවා. මේ කොන්දේසිවල තිබෙනවා, දැල් කඩ පමණයි. ගලෙන් ඉදි කිරීම තහනම්. අතුරු බදු දීම තහනම්. මේ සියළු කොන්දේසි උල්ලංඝණය කරලා දැනට වෙළඳාම කරන අය ලක්ෂ 07 ගණනේ දීලා, මේ දැල් කඩ කැල්ලක් ඒ පළමුවැනි අයිතිකරුවන්ගෙන් අරගෙන තිබෙනවා. ඒක නිසා නාගරික සංවර්ධන අධිකාරියේ කළුතර නගර සැලැස්මට, නගරයේ තිබෙන අනවසර ඉදි කිරීම් සහ අවශ්‍ය දේවල් සාකච්ඡා කරගෙන යනකොට මේ කඩ පේළිය ඉවත් කරලා වෙළඳ සංකීර්ණයක් ඉදි කිරීමට අවශ්‍යතාවය තිබුණා. ඒ අවශ්‍යතාවය උඩ නගර සභාවට දැනුම් දීමක් කළා.

නගර සභාවට ලිඛිතව දුන්නා, මේ කඩ පේළිය ඉවත් කරලා දෙන්න කියලා. නමුත් නගර සභාවෙන් ඒ අය දැනුවත් කළත් ඒ අය අයින් වුණේ නැහැ. නාගරික සංවර්ධන අධිකාරිය ඒ අයට දැනුම් දීලා දවස් තුනක් ඇතුළතදී ගරු සභාපතිතුමනි, ඒ කඩවල විදුලිය විසන්ධි කරලා, ඒගොල්ලෝ බඩු ඇද ගත්තාට පසුව තමයි ඒ කඩ ටික කඩලා ඉවත් කළේ. කඩන්න හම්බ වුණෙත් නැහැ. ඒ සියලුම දෙනා තමන්ට අයිති දොර, යකඩ කැල්ල, වහල ඒ සියලු දේවල් ගලවාගෙන ඒ අය ඉවත් වුණා. ඉතුරු වුණු කොන්ක්‍රීට් ටිකයි, අනවශ්‍ය කැලි ටිකයි තමයි නාගරික සංවර්ධන අධිකාරිය හරහා අපට ඉවත් කරන්න සිද්ධ වුණේ. ඒකට අල්ලපු එක ඒ කාලේ Land Registry එක තිබුණේ. ඒ භූමියේ තිබුණු ගොඩනැගිල්ල පාවිච්චි නොවන නිසා කළුතර නගර සභාවෙන් එවකට අපේ නීතිඥ මහත්වරුන්ට ඒක පාවිච්චි කරන්න දීලා තිබුණා. ඒ නීතිඥ මහත්වරුත් රටේ සංවර්ධනය වෙනුවෙන් උසාවියට යන්න පුළුවන්කම තිබියදීත් උසාවියට නොගිහිල්ලා නගරය සංවර්ධනය වෙනවා නම් අපි ඉවත් වෙනවා කියලා තමන්ගේ කැමැත්තෙන් ඒ සියලු දෙනා ඉවත් වුණා. අපි ඒ සියලු දෙනාට විකල්ප මාර්ග සලස්වලා තිබෙනවා. අපි ඉදිරියේදී ඉදි කරන ගොඩනැගිල්ලේ උඩු මහල ඒ නීතිඥ මහත්වරුන්ට දෙන්න සකස් කරලා තිබෙනවා. කළුතර නගර සභාව එක්සත් ජාතික පක්ෂ නගර සභාවක්. කළුතර ආසන සංවිධායක ලක්ෂ්මන් විජේමාන්න මැතිතුමා. ඒ දොගොල්ලොත් මේකට හරස් වුණේ නැහැ. අපි සාකච්ඡා කළා. එක්සත් ජාතික පක්ෂයේ නගර සභාවක් වුණත් නගරය සංවර්ධනය වෙනවා නම් අපි එතැන ඉන්නවා කියන දේ ඒගොල්ලෝ අපට ප්‍රකාශ කළා. අපි ඉතා සතුටුයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොළඹත් එහෙමයි.

**ගරු පී. ආර්. පී. අබේගුණවර්ධන**
Hon. P. R. P. Abegunawardana

කොළඹ මහ නගර සභාවේ නගරාධිපතිතුමාත් අද අත්වැල් බැඳගෙන ඒ ගමන යන්නේ නගර සංවර්ධනය වන නිසා. අපට අවශ්‍යතාවය තිබෙන්නේ ගරු සභාපතිතුමනි, වෙළඳාම් කරන කෙනෙකුව පාරට දාන්න නොවෙයි. කඩ 152 ක් තිබුණත්, අපි ඒ කඩ ඉවත් කරන්න පෙර ලිඛිතව කඩවලින් විස්තර ගන්නකොට වෙළඳාම් කරන අය හිටියේ 87 යි. ඒ කඩ කැලි තුනක් එකට අරගෙන සම්බන්ධ කරලා තිබුණු නිසා. දෙකක් එකට සම්බන්ධ කරලා තිබෙන නිසා. අපි තීන්දුවක් ගත්තා ඉදි කරන කඩවලදී ඒ අයට ප්‍රමුඛතාවයක් දිය යුතුයි කියලා. ඒ අයට ස්ථානයක් දිය යුතුයි කියලා. නමුත් ජනතා විමුක්ති පෙරමුණ තමන්ගේ දේශපාලන වාසි තකා බෝඩ් ලෑල්ලක් අල්ලගෙන කළුතර බස් නැවතුම් පොළ ඉදිරිපිට පිකටිං එකක් කළා. ඒ පිකටිං එක නිසා තමයි අපි තීන්දු කළේ, අපි හදන ඒවායෙන් කඩ දෙන්නේ නැහැයි කියලා. මේක තමයි ඇත්ත. පළි ගැනීමක් නොවෙයි. රට සංවර්ධනය වනකොට ඒකට හරස් කපනවා නම්, ඒ වාගේ කුහක ගතිගුණ තිබෙනවා නම් අපි ඒවාට සලකන්නේ නැහැ. අපි තීන්දුවක් ගත්තා. නමුත් නගරාධිපතිතුමාත් එක්ක සාකච්ඡා කරලා අද වනකොට කළුතර නගරයේ මාර්කට් එක ඉදි කිරීමට තිබෙන ගොඩනැගිල්ලේ තාවකාලික ස්ථාන ස්ථාපිත කරන්න අපි දීලා තිබෙනවා. ඔබතුමා පඹයෙක් කිව්වත්, මම නගරාධිපතිතුමාට ස්තූතිවන්ත වෙනවා. එතුමා එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන්නේ. පඹයෙක් නොවෙයි. අවශ්‍ය තැනට, සුදුසු තැනට වැඩ කරන

දේශපාලන නායකයෙක්. එතුමා අපත් එක්ක අත්වැල් බැඳගෙන නගර සැලැස්මේදී ඉදිරියෙන්ම ඉන්නවා කියන එක මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා. ඒක නිසා අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙන්නේ, ඒ ඉදි කිරීම් අයින් කරපු ස්ථානයේ නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක විශාල ගොඩනැගිල්ලක් ඉදි කරලා අර හිටපු අයට ප්‍රමුඛතාවය දෙන ගමන් අලුතෙනුත් තව කඩ කාමර කිහිපයක් වෙළඳාම් කරන අයට දීලා කළුතර නගරය නිර්මාණය කිරීමටයි.

දේශපාලන වාසි තකා තමන්ගේ ඡන්දයක් නිසා අර සංවර්ධන වන නගරය, සංවර්ධනය වෙමින් පවතින රට විනාශ කරන්න එපා කියලා, මම ඔබ සියලු දෙනාගෙන් ඉල්ලීමක් කරනවා. ඒක තමයි අපේ අනාගතය. අද ඔබ සියලු දෙනාම දන්නවා, අපේ අතිගරු ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා මේ රට සංවර්ධනය වෙමින් පවතින රටක් බවට නිර්මාණය කරලා තිබෙනවා. අද සංවර්ධනය වෙමින් පවතින රටක්. හෘද සාක්ෂියට එකඟව කවුරු හරි පුළුවන් නම් අත තියලා කියන්න නොවෙනවයි කියලා. හෘද සාක්ෂියට එකඟව සංවර්ධනය වෙමින් පවතින රටක්. ඒක නිසා ඒ සංවර්ධනය වන රටක දේශපාලන පළිගැනීම්වලින් තොරව අපි සියල්ල එකතු වෙලා වැඩ කළොත් තමයි ඉදිරි අනාගතයේදී මේ රටේ ජීවත් වන දරුවන්ට සංවර්ධනය වූ රටක අභිමානයක් ඇතිව ජීවත් වෙන්න ලැබෙන්නේ කියන එක අපි මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්න ඕනෑ.

කොළඹ ඉදි කිරීම් ගැන කථා කරනකොට, මේකෙන් බහුතරයක් රජය සතු ඉඩම්. රජය සතු ඉඩම්වල අනවසර ඉදි කිරීම් ඉවත් කිරීමේදී නාගරික සංවර්ධන අධිකාරියට බලතල පැවරිලා තිබෙනවා. ප්‍රාදේශීය සභාවටත්, නගර සභාවටත් ඉහළින් තිබෙන ව්‍යවස්ථාවක් තමයි නාගරික සංවර්ධන අධිකාරිය. ඒවා එක්සත් ජාතික පක්ෂයේ රණසිංහ ප්‍රේමදාස මහත්මයා සංශෝධනය කරපුවා. ඒ සංශෝධනය තමයි අද රට සංවර්ධනය කරන්න ඉහවල් වුණේ. නැත්නම් අද රට හදන්න බැහැ. ඔබතුමා නාගරික සංවර්ධන අධිකාරියට ඇඟිල්ල දික් කළත් අද කොළඹ නගරය නාගරික සංවර්ධන අධිකාරියට පිං සිද්ධ වෙන්න තමයි, අපි කුණු කැල්ලක් නැතුව ලස්සන නගරයක් බවට පරිවර්තනය කරලා තිබෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරියට අපි ස්තුතිවන්ත වෙනවා, නගර සභාවත් එක්ක එකතු වෙලා මේ කොළඹ නගරය සංවර්ධනය කරන්න ශක්තියක් දීම වෙනුවෙන්. ඒ වාගේම අපි ඉදිරියේදී බලාපොරොත්තු වෙනවා, කළුතර නගරයේ, මෙතැනින් අපි අවසන් කරන්නේ නැහැ. කාගේවත් පිකටිංවලට සැලෙන්නෙත් නැහැ ගරු සභාපතිතුමනි. අපි අවශ්‍ය දේ ජනතාවට අහිතකර විධියට නොවෙයි, ජනතාවට සුහදායී විධියට, ජනතාව පාරට නොදා ජනතාවත් එක්ක අත්වැල් බැඳගෙන නගරය දියුණු කරන්න ඉදිරියේදී - රෝහිත අබේගුණවර්ධන ගරු අමාත්‍යතුමා මගේ සහෝදරයා. එතුමාත් එකතු වෙලා වැඩ කරනවා. ඒ වාගේම කළුතර නගර සභාවත් එක්සත් ජාතික පක්ෂය නියෝජනය කරන ආසන සංවිධායක ලක්ෂ්මන් විජේමාන්න මැතිතුමාත් එක්කත් එකතු වෙලා නගරය සංවර්ධනය කරනවා කියමින් මම නිහඬ වෙනවා. ගරු සභාපතිතුමනි, මේ අවස්ථාව ලබා දීම සම්බන්ධව ඔබතුමාට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

[අ.භා. 12..25]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ස්තුතියි ගරු සභාපතිතුමනි. විශේෂයෙන්ම අපේ හිතවත් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මේ ඉදිරිපත් කරපු යෝජනාව මම හිතනවා ඉතාම කාලෝචිත යෝජනාවක්. මොකද, කොළඹ නගරයේ අද විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරිය හා ආරක්ෂක අමාත්‍යාංශය යටතේ තිබෙන නාගරික සංවර්ධන අධිකාරිය කොළඹ නගරයම තමන්ගේ යටතට අත්පත් කර ගැනීමට හා කොළඹ නගරයේ ඉඩකඩම් තමන්ට අවශ්‍ය හිතුමතේ පවරාගෙන මේ නගරයේ ජීවත් වන ජනතාව නගරයෙන් පිටමං කිරීම හා ඒ ජනතාවගේ ඉඩම් කිසිදු මානුෂික හැඟීමක් නැතුව, කිසිම නීති රීතියකට යටත් වෙන්නේ නැතුව පවරා ගෙන ඉන්න වෙලාවක තමයි මේ යෝජනාව ආවේ. ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 2009 අවුරුද්දේ යුද්ධය අවසන් වීමෙන් පස්සේ ආරක්ෂක අමාත්‍යාංශය යටතේ නාගරික සංවර්ධන අධිකාරිය මේ කොළඹ නගරය සංවර්ධනය කරනවා කියන මුවාවෙන්, ඒ වාගේම කොළඹ නගරය දියුණු කරනවා කියන කථාව උඩ විශාල ඉඩම් ප්‍රමාණයක් ගැනීම නිසා විශාල ජන කොට්ඨාශයක් අද අනාථයන් බවට පත් වෙලා තිබෙනවා. අද මේ නාගරික සංවර්ධන අධිකාරියේ ක්‍රියා පිළිවෙත උඩ මේ නගරය තුළ ජීවත් වන ජන කොටස්වලට යම් සැකයක් මතු වෙලා තිබෙනවා, මේක Demography of City එහෙම නැත්නම් මේ කොළඹ නගරයේ ජන විකාශනය වෙනස් කිරීමේ උත්සාහයක් දරනවා කියන මතය. එය අද කොළඹ නගරයේ ජනතාව අතරේ තිබෙනවා. ඒ විතරක් නොවෙයි.

අද මේ එක්සත් ජාතික පක්ෂයේ ඡන්ද බලය ඒ වාගේම එක්සත් ජාතික පක්ෂයේ බල කොටුවක් වන කොළඹ නගරය දිගින් දිගටම ආණ්ඩුව ජයග්‍රහණය නොකිරීම උඩ, පරාජය වීම උඩ මේකේ තිබෙන ඡන්ද බලය හා එක්සත් ජාතික පක්ෂයේ බලය කැඩීමටත් යම් ආකාරයක උත්සාහයක් මේ තුළ තිබෙනවා කියන මතය අද කොළඹ නගරය ඇතුළේ ජනතාව තුළ තිබෙනවා.

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම 2007 සාක් සමුළුව ආවා. ඒ 2007 සාක් සමුළුවේදී කොම්පඤ්ඤවීදියේ ග්ලැනී වීදිය කියලා පාරක් තිබෙනවා. සාක් සමුළුවේ ආරක්ෂක කටයුතු කියලා ඒ ග්ලැනී වීදියේ ගෙවල් 300 ක් අයින් කළා. අවුරුදු 50 ක් 60 ක් ජීවත් වන ජනතාව. ගෙවල් 300 අයින් කරලා ඒ අයව මට්ටක්කුලියේ වැලිගොඩ කියන ප්‍රදේශයට දැම්මා. තවම ඒ ජනතාව ඒ ප්‍රදේශයේ ජීවත් වෙනවා. දැන් අවුරුදු 08 ක වැඩි කාලයක් ඒ ප්‍රදේශයේ ජීවත් වෙනවා. ඊළඟට 2010 මැයි මාසේ කොම්පඤ්ඤයේ මිව්ස් වීදිය කියන ප්‍රදේශයේ ගෙවල් 21 තිබුණා. ඒ ගෙවල් 21 ම අනවසර ගෙවල් නොවෙයි. ඒක නිවාස අමාත්‍යාංශය මගින් 1988 ඔප්පු ලබා දීපු ගෙවල්. එක රැයකින්, පැය 24 කින් ඒ ගෙවල් 21 ම බිමට සමතලා කරලා දැම්මා. ඒගොල්ලන්ට පොරොන්දුවක් දුන්නා. ඒ විතරක් නොවෙයි. 2011 දී මේගොල්ලෝ ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් දානවා. තමන්ගේ මූලික අයිතිවාසිකම් නාගරික සංවර්ධන අධිකාරිය කඩ කළාය කියලා. ඒ නඩුවේ අංක FR 349/2010. මෙන්න මේ නඩුවේදී 2011 මැයි මාසේ 11 වැනිදා නියෝජ්‍ය සොලිසිටර් ජෙනරාල්තුමා ඇවිල්ලා ශ්‍රේෂ්ඨාධිකරණයේදී පවසනවා, මොකක්ද එතුමා කියන්නේ? බේස්ලයින් පාරේ, මිහිඳු පුර හදන ගෙවල් මේ මිනිස්සුන්ට අපි දෙනවා කියලා. ඒ නිසා උසාවියට ඇවිල්ලා නියෝජ්‍ය සොලිසිටර් ජනරාල්තුමා පොරොන්දුවක් දෙනවා මොවුන්ට නිවාස ලබා දෙනවා කියලා. නමුත් ගරු සභාපතිතුමනි, 2014 ජනවාරි මාසේ ඒ ගෙවල් බෙදනකොට මේ මිනිස්සුන්ට ගෙවල් දුන්නේ නැහැ. මේ මිනිස්සු නාගරික සංවර්ධන අධිකාරියට ගිහිල්ලා ගෙවල් ඉලුවාම කිව්වා, මේ ගෙවල් ඔයගොල්ලන්ට දෙන්න බැහැ. මේ ගෙවල්වලට අපට ඉඩකඩ නැහැ. තව අවුරුදු දෙකක් බලාගෙන ඉන්න කියලා. ඒ මිනිස්සු තවම කුලී ගෙවල්වල තව අවුරුදු දෙකක් ජීවත් වෙනවා. ගරු සභාපතිතුමනි, මෙන්න මේ විධියට තමයි නාගරික සංවර්ධන අධිකාරිය වැඩ කළේ. අද වනකොට ඒ ගෙවල් කාටද දුන්නේ? ඒ ගෙවල් දුන්නා, බේස්ලයින් පාරේ දෙමටගොඩ පොලීසිය ඉස්සරහා අක්කර 2 ½ ක රේල්වේ ඉඩමේ සිටිය දුම්රිය සේවක පවුල්වලට. එය දුම්රිය සේවා දෙපාර්තමේන්තුවට අයිතියි. ඒ ඉඩමේ ජීවත් වෙන්නේ දුම්රිය සේවකයෝ. හදිසි අවස්ථාවකදී උවමනා වුණාම දුම්රිය සේවය සඳහා කැඳවන්න, ඒ ජීවත් වුණු පවුල් 237 කගේ ඒ ගෙවල් ටික කඩලා ඒ අයව ගිහිල්ලා දානවා මිහිඳු පුර නිවාස සංකීර්ණයට. ඒ අය ගෙවල් ඉල්លුවේ නැහැ. ඇයි මොකටද? ඒ අක්කර 2 ½ කාල්ටන් කොම්පැණියට ගන්න එතැනින් මිනිස්සු ටික අයින් කළා. කාල්ටන් කොම්පැණිය කාගේද කියලා තමුන්නාන්සේලා දන්නවා. ඒක ගැන මම කියන්න ඕනෑ නැහැ.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කාගේද?

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ඒ ගැන තමුන්නාන්සේලා දන්නවා. ඒකේ වගතුග මම වෙන දවසක කියන්නම්. එතකොට කාල්ටන් කොම්පැණියට ගන්න අක්කර 2 ½ ක ඉඩමෙන් ඒ මිනිස්සු අයින් කළා. ඒ ජනතාව නිවාස ඉල්ලුවේ නැහැ. දුම්රිය දෙපාර්තමේන්තුවට අයිති ඉඩම. ඒ ඉඩමේ හිටපු දුම්රිය සේවකයන්ව අයින් කරලා ඒගොල්ලන්ව මිහිඳු පුරට දාලා ඒ ඉඩම කාල්ටන් කොම්පැණියට ගන්න නාගරික සංවර්ධන අධිකාරිය ඒක පවරා ගත්තා ගරු සභාපතිතුමනි. එතකොට මේ කොළඹ නගරය කියලා කියන්නේ 70% ක් අඩු ආදායම්ලාභීන් ජීවත් වන නගරයක්. මේකේ ජනතාව බහුතරයක් එක්කෝ කුලී වැඩක් කරලා ජීවත් වෙන්නේ. එහෙම නැත්නම් ත්‍රිවීලර් එකක් එලවලා ජීවත් වෙනවා. එහෙම නැත්නම් ස්වයං රැකියාවක් කරලා ජීවත් වෙනවා. ඒ නගරයේ 70% ක් මිනිස්සු ජීවත් වෙන්නේ එහෙමයි. කොළඹ නගරය කියලා කියන්නේ කුරුඳුවත්තවත්, වැල්ලවත්තවත් නොවෙයි. කොළඹ නගරය කියලා කියන්නේ මැද කොළඹ, උතුරු කොළඹ, බොරැල්ල අන්න ඒ ආසනවල බහුතර ජනතාව සිටින ප්‍රදේශ තමයි කොළඹ නගරය කියලා කියන්නේ. කොළඹ නගරයේ අඩු ආදායම්ලාභීන් අවුරුදු පනස් ගණන්, හැට ගණන් ජීවත් වන ඔවුන්ගේ ගෙවල් ටික බලහත්කාරයෙන් හමුදාව දාලා, බය කරලා ඔවුන්ව නිවාසවලින් එළියට දැම්මා. නාගරික සංවර්ධන අධිකාරිය

ඉස්සරහට අද ඇමැතිවරු යන්නෙත් නැහැ. මම ඇමැතිවරුන්ගේ නම් කියන්න කැමැති නැහැ. ඇමැතිවරු කිහිප දෙනෙක්ට මේ කොම්පඤ්ඤවීදියේ ජනතාව දුක කියන්න ගියා. කා ළඟටද ගියේ? දිනේෂ් ගුණවර්ධන ඇමැතිතුමා ළඟට ගියා. ෆවුසි ඇමැතිතුමා ළඟට ගිහිල්ලා දුක කිව්වා. කිව්වාම මොකක්ද ඒ ඇමැතිවරු කිව්වේ? ආරක්ෂක ලේකම්තුමාත් එක්ක අපට කථා කරන්න බැහැ. ඒකයි දීපු උත්තරේ. අඩගහලා ඒ මිනිස්සුන්ගෙන් අහලා බලන්න. (බාධා කිරීම්) ආරක්ෂක ලේකම් එක්ක කථා කරන්න බැහැ කිව්වා. ආරක්ෂක ලේකම්තුමාත් එක්ක කථා කරන්න බැරි ඇයි? එතුමා අමාත්‍යාංශ ලේකම්වරයෙක්. ඒක නොවෙයි ජනාධිපතිතුමාගේ සහෝදරයා. එතුමා ජනාධිපතිතුමාගේ සහෝදරයා වුණු පළියට මේ රටේ නීතිය අතට අරගෙන, මේ රටේ කිසිම නීතියකට අවනත වෙන්නේ නැතුව එතුමාට ඕනෑ ඕනෑ විධියට වැඩ කරන්න පුළුවන් තත්ත්වයක් මේ රටේ හදලා තිබෙනවා. ගරු සභාපතිතුමනි, ඔබතුමන්ලා හිතා ගන්න තමුන්නාන්සේලාත් මහජන නියෝජිතයෝ. අපිත් මහජන නියෝජිතයෝ. එහෙම නම් අද මම කියන දේ කවදා හරි තමුන්නාන්සේලාට කැරකිලා එන්න පුළුවන්. එතකොට තමුන්නාන්සේලා මෙතැන ඇවිල්ලා කෑගහන්න එපා. ඒක හොඳට මතක තියාගන්න.

ඒ නිසා ගරු සභාපතිතුමනි, අද මම කියනවා නාගරික සංවර්ධන අධිකාරියේ මහත්වරුන්ට අඩුම ගාණේ ඉඩම් සංවර්ධන අමාත්‍යාංශය මගින් පොතක් හදලා තිබෙනවා, *"සිය කැමැත්තෙන් තොරව නැවත පදිංචි කිරීමේ ජාතික ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම හා ඉඩම් අත්පත් කර ගැනීම"* කියලා. මේකේ නීති රෙගුලාසි. කොහොමද ඉඩම් අත්පත් කර ගන්නේ කියලා. මේකේ තිබෙනවා කොහොමද ජනතාවට වන්දි ගෙවන්නේ කියලා. නමුත් මේ පොතවත් නාගරික සංවර්ධන අධිකාරියේ නිලධාරීන් කියවලා නැහැයි කියලා මට විශ්වාසයි. මොකද, මේකේ තිබෙන එකම දෙයක්වත් ඔවුන් ක්‍රියාවට නංවන්නේ නැහැ. මේවා ගණන් ගන්නේ නැහැ. මේවා බලන්නේ නැහැ. උදේට හමුදාව එවනවා. දවස් දෙකකින් නෝටිස් එක දෙනවා. ජනතාවට යන්න කියලා කියනවා. ගරු සභාපතිතුමනි, අද ඒ තත්ත්වයට මේ රට පත් වෙලා තිබෙනවා. ඉතාම කනගාටුදායකයි. ඒ විතරක් නොවෙයි. අපි දන්නවා ජාත්‍යන්තර නීති තිබෙනවා. එක්සත් ජාතීන්ගේ සංවිධානයේ නීති රීති තිබෙනවා. ප්‍රදේශයක සංවර්ධනයක් වෙනුවෙන් ජනතාව ඉවත් කරනවා නම් ජනතාවගේ ඉඩකඩම් ලබා ගන්නවා නම් ජාත්‍යන්තර නීති තිබෙනවා. ඒ නීතිවත් පිළිපදින්නේ නැහැ. අඩුම ගණනේ අපේ ජනාධිපතිතුමා නොවැම්බර් මාසයේ, දෙසැම්බර් මාසයේ පොදුරාජ්‍ය මණ්ඩලවල සභාපති හැටියට පත් වුණා. ඒ පොදු රාජ්‍ය මණ්ඩලවල නීති රීති තිබෙනවා. මේ රටේ රාජ්‍ය නායකයා හැටියට, ඔහු අද පොදු රාජ්‍ය මණ්ඩලවල සභාපතිවරයා හැටියට ඉඳගෙනත්, අඩුම ගණනේ ඒ රටවල් පිළිගත්ත නීති රීතිවත් මේ ආරක්ෂක අමාත්‍යාංශය හා නාගරික සංවර්ධන අධිකාරිය පිළිගන්නේ නැහැයි කියන එක මම කියන්න ඕනෑ. ඔවුන් අද හිතුමතේ වැඩ කරනවා. ඒ විතරක් නොවෙයි. අද උතුරු කොළඹ, අපේ ෆායිස් ගරු මන්ත්‍රීතුමා නියෝජනය කරන ප්‍රදේශය. ඒ ප්‍රදේශයෙත් අද ක්‍රීඩාංගණයක් තිබෙනවා ගරු සභාපතිතුමනි. ඒ උතුරු කොළඹ කොට්ඨාශයේ කිසිම පාසලකට ක්‍රීඩාංගණයක් නැහැ. එකම ක්‍රීඩාංගණයයි තිබෙන්නේ. ඒක තිබෙන්නේ, ෆායිස් ගරු මන්ත්‍රීතුමාගේ නිවස ඉදිරිපිට. උතුරු කොළඹ සියලුම පාසල් අද ඒ ක්‍රීඩාංගණය ක්‍රීඩා කරන්න පාවිච්චි කරනවා. ඒ අවට තිබෙන නිවාසවල ඉන්න දූ දරුවන් පාවිච්චි කරන්නෙත් ඒ ක්‍රීඩාංගණය. නාගරික සංවර්ධන අධිකාරිය තමන්ගේ ව්‍යාපෘති කරන්න කියලා අද ඒ ඉඩමත් පවරාගෙන තිබෙනවා. ඒක වරාය අධිකාරියට අයිති වෙලා තිබුණු ඉඩමක්.

ගරු සභාපතිතුමනි, අද අපි කොළඹ අලංකාරය ගැන කථා කරනවා. කොළඹ අලංකාරය හැම ආණ්ඩුවක්ම කළා. ඒක අමුතුවෙන් කවුරුවත් කළේ නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව, අපි 77 න් පස්සේ කොළඹ අලංකාරය කළා. හැම ආණ්ඩුවක්ම ආවාම කොළඹ අලංකාරය කළා. ඒක ගැන නොවෙයි ප්‍රශ්නය. මේ කොළඹ අලංකාරය කරන්නේ කාටද? කොළඹ නගරයේ ජීවත්වන දුගී දුප්පත් ජනතාව වෙනුවෙන්ද? නැහැ. මේ අලංකාරය කරන්නේ, කුරුඳුවත්තේ කොළඹ හතේ ජීවත්වන කුඩුකාරයන්ට. කුඩු මුදලාලිලාට. මේ ආණ්ඩුවේ කොන්ත්‍රාත් ගන්න හෙන්චයියන්ට. මේකට තමයි මේ කොළඹ නගරය අලංකාරය කරන්නේ. කොළඹ නගරයේ ජීවත්වන ජනතාවට මේ කරන අලංකාරයකින් ශත පහකින්වත් වැඩක් නැහැ. මොකද, ඒ නගරයේ ඒ ජනතාවට අවශ්‍ය කරන එක දෙයක්වත් මේ අලංකාරයෙන් කෙරෙන්නේ නැහැ. මොකක්ද කරන්නේ? මුළු නගරයේම Walking park හදලා තිබෙනවා. Walking park තිබෙනවා. දැන් ඇවිදින්න මිනිස්සු නැහැ. Walking park හැම තැනම තිබෙනවා. ඇවිදින්න මිනිස්සු නැහැ. Walking park කාටද? අපටද? නැහැ. ගරු සභාපතිතුමනි, Walking park හැදුවේ,

[ ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන් ]

අර කොළඹ හතේ ඉහළ පැලැන්තියේ රට Night Club ගිහිල්ලා උදේට තමන්ගේ බල්ලාව අරගෙන ඇවිදින නෝනා මහත්වරුන්ට සීනි ටික බස්සවා ගන්න, කොලෙස්ටරෝල් බස්සවා ගන්න තමයි Walking park හදලා තිබෙන්නේ. එහෙම නැතිව මේ කොළඹ නගරයේ ජීවත්වන, පැල්පත්වල ජීවත්වන ජනතාවට නොවෙයි. ගරු සභාපතිතුමනි, ඒ ජනතාවට විහාර මහා දේවි උද්‍යානයේ සතුටු උයන තිබුණා. අඩු ආදායම් ලාභී පවුල්වල ළමයින් ඇවිල්ලා මැරිගෝ රවුන්ඩ් එක සෙල්ලම් කරන්න. ඔන්චිල්ලාව සෙල්ලම් කරන්න. ඒකේ රුපියල් 10/- ටිකට් එක තිබුණේ. නාගරික සංවර්ධන අධිකාරිය මොකද කළේ? සතුටු උයන අයින් කරලා දැම්මා. දැන් සතුටු උයන නැහැ. නමුත් කොළඹ නගරයේ රට රේස් පදිනවා. බේබිලාට රේස් දුවන්න පුළුවන්. රට කොළඹ නගරයේ වැලිගොඩ දාලා, ගෝනි දාලා බේබිලාට රේස් දුවන්න පුළුවන්. ගරු සභාපතිතුමනි, ඒ නිසා මතක තියාගන්න. කොළඹ නගරයේ ජනතාවගේ -

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

සතුටු උයනට නිකන් යන්න පුළුවන්. මුදල් අය කරන්නේ නැහැ.

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

සීමා සහිතයි. ඒ නිසා ඒ නැගෙන ජනතා විරෝධය වැඩි ඈතක නැහැයි කියන එක මතක් කරමින් මම නිශ්ශබ්ද වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය සභාපතිතුමා මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේරත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය සභාපතිතුමා [යසපාල කෝරලගේ මහතා ] මූලාසනාරූඪ විය.***

*Accordingly Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Deputy Chairman [Mr. Yasapala Koralage] took the Chair.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඊළඟට එම යෝජනාව සඳහා අදහස් දැක්වීමට උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩි 10 ක කාලයක් තිබෙනවා.

[අ.භා. 12..36]

**ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ**
Hon. Upul Mahendra Rajapaksa

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අදාළ මාතෘකාවට අනුව අපි දන්නවා, යම් යම් අවශ්‍යතා අනුව රජය මේ රටේ ඉඩම් අත්පත් කර ගැනීම් සිද්ධ කරනවා. ඒ ඉඩම් අත්පත් කර ගැනීමේදී ඒ අවශ්‍යතාවයන් අනුව කරන ක්‍රමවේදයන් අනුගමනය කරමින් ඉඩම් අත්පත් කර ගැනීම වෙන්න ඕනෑ. ඉතින් රජය යම් යම් අවස්ථාවලදී ඉඩම් අත්පත් කරගෙන ඒ අවශ්‍ය කාර්යයන් කරනවා වාගේම මේ නාගරික ප්‍රදේශවල ජීවත්වන ජනතාව යම් යම් අනවශ්‍ය ඉදි කිරීම් කරන කොට මේවා ඉවත් කරන්න පළාත් පාලන ආයතනයක් වශයෙනුත්, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරිය වශයෙනුත් ඊට යම් බලතල තිබෙනවා.

ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියේ අභිනියෝජන බලයක් පළාත් පාලන ආයතන ප්‍රධානියාට ලැබෙනවා. ඒ අභිනියෝජන බලය පාවිච්චි කරලා ඒවා ඉවත් කරන්න ඔහුටත්, ඒ පනතට අනුවත්, ඒ අදාළ පළාත් පාලන ආයතනයේ පනතට අනුවත් ක්‍රියා කරන්න ඔහුට හැකියාව තිබෙනවා. ඉතින් අපි දකින්නේ, හැම තිස්සේම රජයක් හෝ ඒ අදාළ ආයතන හෝ හිතුමතේට ඒවා කඩා බිඳ දමන්නේ නැහැ. එහෙම කඩා බිඳ දමනවා නම් ජනතාවට පුළුවන් අධිකරණයට යන්න. ඉතින් අධිකරණයට යන්නේ නැතිව ජනතාව යම් යම් සහන ඉල්ලනවා. ඉතින් රජයක් නැත්නම් ඒ ආයතන කරන්නේ විකල්ප ස්ථාන ඉස්සෙල්ලා හඳුන්වලා දෙනවා. මේ විකල්ප ස්ථාන හඳුන්වලා දීලා තමයි මේ කාරණයට ඒ අය අනුගත වෙන්නේ. නාගරික සංවර්ධන අධිකාරිය ගත්තාම 1978 පනතට අනුව ඔවුන් ගරු විෂයයභාර අමාත්‍යතුමාගේ අනුමැතියෙන් උසාවියට ගිහිල්ලා තීන්දුවක් ගන්නවා, මේවා ඉවත් කරන්න. ඉවත් කරන්න ගිහිල්ලා ඒ අය දැනුවත් කරනවා. මේ අනවසර ඉදි කිරීම් සම්බන්ධයෙන් එන ගැටලුව තමයි, මේ අනවසර ඉදිකිරීම් ඉවත් කරන්න යන ඕනෑම අවස්ථාවක ඒ කොටසේ ජනතාව ඉතාමත් සංවිධාන වෙලා ඉතාමත් ආවේගයෙන් කෑකෝ ගහනවා. ඉතින් අදාළ පළාත් පාලන ආයතනවල කටයුතු කරපු පුද්ගලයන් වශයෙන් අපි මේවා දන්නවා. මෙතැනින් ඉවත් වෙන්න ඒ අය සතුටු වෙන්නේ නැහැ. නමුත් ඉවත් කරන්න යැමේදී ඒවාට නායකත්වය ලබා දුන්නා - අපි රූපවාහිනියේ දැක්කා, අපේ ගරු මන්ත්‍රීතුමන්ලා නායකත්වය ලබා දීලා ගැටීම් බවට පත් වෙනවා. ඒ නායකත්වය ලබා දීමත් එක්ක තමයි මේ ප්‍රශ්න

වඩා උච්ච තත්ත්වයට පත් වෙන්නේ. එහෙමනම් මේ ඉවත් කරන අයට විකල්ප ස්ථාන ලබා දෙන්න ඕනෑ. හැබැයි, මේ විකල්ප ස්ථාන ලබා ගන්නා වූ ඒ වෙළඳ ප්‍රජාව හෝ වෙනත් පුද්ගලයා කරන්නේ, ඒ ස්ථානය ලබාගෙන තව කාට හරි පවරලා නැවත ඔහු රාජකාරී කරන්න එනවා, නගරයේ ඒ ආසන්න ස්ථානයට. එහෙම නැති වුණොත් ඔහු ඒ ස්ථානය වෙනුවට, තව කොටසකට ඇවිල්ලා, පේව්මන්ට් එක ආදී ප්‍රදේශවල වෙළඳාම පටන් ගන්නවා. මේක නිම වෙන්නේ නැති යම් ක්‍රියාවලියක්. මේක අපි හොඳටම දන්නවා. පළාත් පාලන ආයතනවල රාජකාරී කළ නිසා. නමුත් පළාත් පාලන ආයතනයේ ප්‍රධානියාට පුළුවන් දින 14 ක් ඇතුළත ඔහුව දැනුවත් කරලා සම්පූර්ණයෙන් ඉවත් කරන්න. දේපළ හඳුනා ගැනීමේ ගැටලුවත් අපට තිබෙනවා. ඒ දේපළ හඳුනා ගැනීමේ ගැටලුවත් එක්ක තමයි යම් අවස්ථාවල අධිකරණයට යන්න සිද්ධ වෙන්නේ. එහෙම නැත්නම් පෞද්ගලික දේපළක් නම් අධිකරණ තීන්දුවක් අරගෙන මෙය ඉවත් කරන්නට ඕනෑ.

ඒ වාගේම අපි දන්නවා, මේ රජය පළාත් පාලන ආයතන වශයෙන් කටයුතු කරනකොට බැම්මක් ඉදි කරනවා නම්, යම්කිසි මොනවා හරි දෙයක් ඉදි කරනවා නම් ඒ ආයතනය වන්දි රහිත ගිවිසුම් අත්සන් කරනවා. ඔබ අපි දැනුම් දුන් සැනින් මේවා ඉවත් කරන්නට ඕනෑ. ඉවත් නොකරන කොට ඉවත් කිරීමේ බලය පළාත් පාලන ආයතනය සතු කර ගන්නවා. ඒ අනුව තමයි මේ කාර්යයන් සිදු කරනු ලබන්නේ. එම නිසා අපි බලන්නට ඕනෑ, මේ ප්‍රදේශයේ ජන කොටසක් ගැන, ව්‍යාපාරිකයා ගැන විතරක් නොවෙයි. අපේ නගරයට එන ප්‍රදේශයේ ජනතාවට පේව්මන්ට් එක පාවිච්චි කරලා ඔහුට යන්න පුළුවන්කම තිබෙනවාද? ඔහුට අවහිරයක් නැතිව මහමඟ ගමන් කරන්න පුළුවන්ද? අපි මගී ජනතාව ගැනත් බලන්නට ඕනෑ. ඒ ප්‍රදේශයේ ජීවත්වන ජනතාවගේ අවශ්‍යතාවයන් ගැන අපි සොයා බලන්න ඕනෑ. ඉතින් ඒ අනුව මේවා ඉවත් කරන්න යම්කිසි ආකාරයේ ප්‍රතිපත්තිමය තීන්දුවක් ගන්නවා නම් ඒ තීන්දුව අනුව කළ හැකි වෙනවා. එතකොට මෙසේ ක්‍රියා කරන කොට යම්කිසි කණ්ඩායමකට අසාධාරණයක් - ඇත්ත වශයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කියනවා වාගේ අපි ඒ ජනතාව වෙනුවෙනුත් ඉන්නට ඕනෑ. අපි ඒ ජනතාවට විකල්ප ස්ථාන ලබා දීමේදී අපි ඔවුන් එක්ක එකඟතාවයක් ඇති කරගන්නට ඕනෑ. දරුමල්ලෝ ටික මහ පාරට ඇදලා, අධ්‍යාපනය කරන ළමයින් ටික මහ පාරට ඇදලා දාන්න අපට අයිතියක් නැහැ. නමුත් හැම තිස්සේම ඔවුන්ට දෙන්න පුළුවන් සහනය මොකක්ද කියලා එකඟතාවය ගන්නට ඕනෑ. ඒ අනුව තමයි කටයුතු කරන්නට ඕනෑ.

අපේ ඕනෑම පළාත් පාලන ආයතනයක බලාපොරොත්තුව සුන්දර නගරයක් ඇති කරන්නයි. එතකොට මේ ඉතාමත් අවලස්සන ඒවා ඇති කරලා, එහෙම නැත්නම් මේ අනවශ්‍ය අනවසර ඉදි කිරීම් ඇති කරලා, එහෙම නැත්නම් අලංකාරයෙන් තොර ඉදි කිරීම් කළාම මේ නගරයකට ඇති වෙන්නා වූ අවලස්සනය - අපි දන්නවා මේවා ඉවත් කිරිම හරහා මේවාට කැමැති පිරිස් ඕනෑ තරම් ඉන්නවා. ප්‍රජාවගෙන් ඇහුවාම කියයි කොච්චර හොඳද මේවා ඉවත් කළාම කියලා. ඒ වාගේ අපි හැම තිස්සේම දෙපැත්ත බලලා කටයුතු කරන්න ඕනෑ. කොයිම අවස්ථාවකදීවත් රජය මේ නීතිය දඬමීමා කරගෙන ඕනෑ විධියට කටයුතු කරන්නේ නැහැ. අපි එහෙම කරන්න උත්සාහ කරන්නේ අපට අසාධාරණයක් වනකොට. කොළඹ නගරාධිපතිතුමාට උසාවියට යන්න පුළුවන්. කළුතර නගරාධිපතිතුමාට යන්න පුළුවන්. ඒ අය නොයන්නේ ඒ අයගේ වගකීමක් තමයි නගරය තුළ අනවසර ඉදි කිරීම් පාලනය කරන්න කටයුතු කිරීම. ඒ පාලනය කරන්න සමහරවිට මහජන නියෝජිතයන් වශයෙන් අපට බැරිකමක් ඇති වෙනවා. යම්කිසි ජනතාවක් ඉවත් කරනකොට මුවන් පැලැස්සේ කදිරාවාගේ ගිහිල්ලා මේවා කඩලා බිඳලා දමන්න මහජන නියොජිතයන් වශයෙන් අපි අකැමැත්තක් දක්වනවා. නමුත් මේ නාගරික සංවර්ධන අධිකාරියේ පනතත්, ඔවුන්ගේ තිබෙන බලයත් ඒකරාශී කරගෙන එකඟතාවයෙන් තමයි මේවා ඉවත් කරනු ලබන්නේ. ඒ නිසා එතැනදී ජනතාවට යම්කිසි අසාධාරණයක් වෙලා තිබෙනවා නම්, අපි ඒ ජනතාව කෙරෙහි වඩා අවධානය යොමු කරලා බලන්න ඕනෑ. ඉතින් අපි කියන්නේ, මේ රජයට අවශ්‍යතාවයක් නැහැ මේ අය, එක්සත් ජාතික පක්ෂයද, ජනතා විමුක්ති පෙරමුණද, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයද කියලා බලන්න. එහෙම උවමනාවක් නැහැ. එහෙම බලන්නේ නැතිව මේ තමන්ගේ රාජකාරිය ඉටු කරලා සාධාරණය ජනතාවට ලබා දීලා, එහෙම අසාධාරණයක් වුණු කොටසක් ඉන්නවා නම් මේ මන්ත්‍රීවරයෙකුට හරි, මානව හිමිකම් කොමිසමට හරි, අදාළ පළාත් පාලන ආයතනයේ ප්‍රධානියා හරි හම්බ වෙලා තමන්ට තිබෙන අභියාචනයක් ඉදිරිපත් කරලා ඒ දේ කරගන්න පුළුවන්කමක් ඔවුන්ට තිබෙනවා. නමුත් විපක්ෂයේ අය හිතනවා නම් මේ එන්නේ මැතිවරණයේදී එක්සත් ජාතික පක්ෂය දඬමීමා කරගෙන කටයුතු කරන්න

[ ගරු උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ ]

කියලා. ඔබ ගිහිල්ලා රූපවාහිනිය බලන්න. අපි නිල් පවුර කියලා වැඩ සටහනක් කරනවා. අපි අවස්ථා තුනකදී මේ නිල් පවුර ක්‍රියාත්මක කරනවා. අද නිල් පවුර කියලා බලපුවාම අතිවිශාල ජනතාවක් ඉන්නවා. කාන්තා වැඩ සටහන් තිබෙනවා. තරුණ වැඩ සටහන් තිබෙනවා. එතකොට පක්ෂයක් වශයෙන් ගන්නකොට අපට එහෙම මේ කාටවත් හානි කරලා අපේ පක්ෂය උදුම්මවා ගන්න අවශ්‍යතාවයක් නැහැ. නමුත් ඒ හැම ආයතනයකටම වගකීමක් තිබෙනවා. යම්කිසි ආකාරයකට ගෝඨාභය රාජපක්ෂ මහත්මයා මැදිහත් වනකොට යම් යම් අයට ඒ පිළිබඳව ගැටලු තිබෙනවා. හමුදාව මැදිහත් වනකොට ඒ ගැන ගැටලු තිබෙනවා. නමුත් නාගරික සංවර්ධන අධිකාරිය පවරලා තිබෙන්නේ, භාරකාරිත්වය තිබෙන්නේ ආරක්ෂක අමාත්‍යාංශයට. දිනේෂ් ගුණවර්ධන ඇමතිතුමා ඉන්න කාලයේ අපිත් එතුමාට කියලා අපේ ප්‍රදේශයේ අනවසර ඉදි කිරීම් ඉවත් කරලා තිබෙනවා. ඒ අනුව රජයක් ගත්තාම අදාළ කාර්යය ගත්තාම කවුරු හරි ක්‍රියාත්මක වන කොට අර ඇමතිතුමායි, මේ ඇමතිතුමයි අපියි කථා කරන හැම ඕනෑකමක්ම කරන්න පුළුවන්කමක් ලැබෙන්නේ නැහැ. ගත්ත තීන්දුව ක්‍රියාත්මක කරන්නට ඕනෑ. ක්‍රියාත්මක කිරීමෙන් ඇති වෙන්නා වූ ප්‍රතිඵලය බලලා ඒ අයට යම්කිසි අසාධාරණයක් වෙලා තිබෙනවා නම් එය ඉටු කළ යුතුයි කියලයි මම විශ්වාස කරන්නේ. එහෙමනම් කිසිම අවස්ථාවක රජයවත්, කවුරුවත් නීතිය දඩමීමා කරගෙන කටයුතු කරන්නේ නැහැ. අදාළ අණපනත්, නීති රීති තිබෙනවා. අදාළ පළාත් පාලන ආයතන නිති තිබෙනවා. නාගරික සංවර්ධන අධිකාරියේ නීති තිබෙනවා. මේ සියල්ලේ එකඟතා ඇතිව උසාවි තීන්දු අරගෙන තමයි මේ සියල්ල කරන්නේ. එහෙම අසාධාරණයක් වෙලා තිබෙනවා නම් ඕනෑම පුද්ගලයෙකුට පුළුවන් මේ රටේ අධිකරණයට ගිහිල්ලා තමන්ට වුණු අසාධාරණය කියලා තමන්ට සාධාරණය ඉෂ්ට කරගන්න. එම නිසා මේ සම්බන්ධයෙන් අද මේ සභාවේ කථා කරන්න අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමාට මගේ ප්‍රණාමය පුද කරමින් නිහඬ වෙනවා.

[අ.භා. 12..46]

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ස්තුතියි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරලා තිබෙන මේ යෝජනාව ඉතා වැදගත් යෝජනාවක්. ඉතා කෙටියෙන් වචන ස්වල්පයක් කියන්නට බලාපොරොත්තු වෙනවා. රජයකට සංවර්ධන කටයුතු කිරීම සඳහා බොහෝ අවස්ථාවලදී පෞද්ගලික දේපළ අයත් කර ගැනීමට සිද්ධ වෙනවා. ඒක ජාත්‍යන්තර වශයෙන් හැම රටකම පිළිගත්ත දෙයක්. ගමක පාරක් හදන්න තිබෙනවා නම්, නගරයක පොදු යහපත සඳහා පාරක් හදන්න තිබෙනවා නම් ඒ සඳහා පෞද්ගලික දේපළ හරි රජයට අත්පත් කරගෙන පොදු යහපත සඳහා පෞද්ගලික පුද්ගලයෙකුගේ අයිතිවාසිකම් යටපත් කරමින් ඒ ක්‍රියාදාමය කිරීමට සිද්ධ වෙනවා. හොඳ රටක් සංවර්ධනය කිරීමේදී ඒක කළ යුත්තක්. ඒ කාර්යය කිරීම සඳහා ලංකාවේ නීති, ව්‍යවස්ථාදායකය මඟින් සම්පාදනය කර තිබෙනවා. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ මහජන කාර්යයන් සඳහා අවශ්‍ය වන අවස්ථාවකදී ඕනෑම පුද්ගලයෙකුට අයිති දේපළ අයත් කර ගැනීමට නීතිය යටතේ අයිතිවාසිකම් ලබා දීලා තිබෙනවා. ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ පෞද්ගලික දේපළක් අත්පත් කරගන්නා අවස්ථාවකදී ඒ දේපළ හිමිකරුට වන්දි ගෙවීමට නීතියෙන් රජය බැඳිලා ඉන්නවා. ඒ විතරක් නොවෙයි. කිසිම දේපළක් දැනුම් දීමකින් තොරව කඩා බිඳ දැමීම හෝ ඒ දේපළක යම් කෙනෙක් නේවාසිකව ඉන්නවා නම් දැනුම් දීමකින් තොරව (බාධා කිරීමක්) කරුණාකරලා අපට කථා කරන්න දීලා සද්ද කරන්නේ නැතිව සිටියා නම් හොඳයි.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

වන්දි ගෙවනවා නේ.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න. වන්දිය ගැන මම කියන්නම්. නේවාසිකව ඉන්න පුද්ගලයෙක් ඉන්නවා නම් ඒ පුද්ගලයා ඉවත් කරන්න ඉස්සෙල්ලා නෛතික වශයෙන් ගත යුතු පියවර ඉඩම් අත්පත් කර ගැනීමේ පනත යටතේ සඳහන් කරලා තිබෙනවා. නමුත් මේ පනතේ තිබෙන විධිවිධාන තඹ දොයිතුවකටවත් ගණන් ගන්නේ නැතිව හමුදාකරණය කරලා තිබෙන නාගරික සංවර්ධන අධිකාරිය මඟින් අද කිසිම ලැජ්ජා භයකින් තොරව මේ රටේ පෞද්ගලික පුද්ගලයින්ට අයිති පෞද්ගලික දේපළ තමන්ගේ අම්මාගේ, තාත්තාගේ, අප්පොච්චිගේ බූදලය හැටියට සලකාගෙන බලහත්කාරයෙන් ගන්න අවස්ථා ඕනෑ තරම් අපි දවසින් දවස දකිනවා. මම හිතනවා මේ සභා ගර්භයේදී සඳහන්

වුණා, වනාතමුල්ල, කොම්පඤ්ඤ වීදිය වාගේ තැන්. නමුත් මම පෞද්ගලිකව දන්න එක කාරණාවක් මේ අවස්ථාවේදී සනිටුහන් කරන්නට කැමැතියි. මීට අවුරුද්දකට ඉස්සෙල්ලා මේ පාර්ලිමේන්තුවට යන පාරේ මගේ මිත්‍රයෙක් ඉන්නවා. එතුමාට අයිති දේපළක් තිබෙනවා. KFC එකට ඉඳලා එන. උදේ හතට හමුදාවෙන් එනවා. පොලීසියෙන් එනවා. කිසිම දැන්වීමක් නොකර ඩෝසර් කරගෙන යනවා, පාරක් හදන්න ඕනෑය කියලා. මේ මිනිස්සු ගිහිල්ලා පොලීසියට කියනවා. අපට කිසි දැනුම් දීමක් නැතිව -මෙන්න ඉස්සෙල්ලා ගිහිල්ලා ඩෝසර් කරන මිනිස්සුන්ගෙන් ඇහුවා, මොනවද මේ කරන්නේ කියලා. අපට ඉහළ බලවතුන්ගෙන් නියෝග ලැබිලා තිබෙනවා. ඒ නියෝග තමයි අපි ක්‍රියාත්මක කරන්නේ කියලා කියනවා. කරකියාගන්න දෙයක් නැති නිසා මේ මිනිස්සු ගිහිල්ලා, රාජගිරිය පොලීසියට දැනුම් දෙනවා. පොලීසියේ නිලධාරීන් ඒ ඩෝසර් කරන තැන ඇවිල්ලා ඉන්නවා. පොලීසිය කියනවා, අපි දන්නේ නැහැ ඩෝසර් කිරීමක් ගැන.

එහෙමනම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ පෞද්ගලික දේපළ අයිති මනුෂ්‍යයින්ට. නීතියට පරිබාහිරව, නීතිය ගැන කිසිඳු අබ මල් රේණුවක, තැකීමකින් තොරව මේ හමුදාකරණය කරලා තිබෙන නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරනවා කියන එක අපට බොහොම පැහැදිලියි. මේකේ භයානක කමක් තිබෙනවා. මම දන්නේ නැහැ. රජය නියෝජනය කරන මහජන නියෝජිතයින් කටින් ඒක ප්‍රකාශ නොකළාට, හිත ඇතුළෙන් මම කියන දේ තේරුම් ගන්නවා ඇති. පිළිගන්නවා ඇති. තමුන්නාන්සේලා කවුරුත් මම හිතන්නේ මාත් එක්ක එකඟ වෙයි. රටක නීතියක් තිබෙන්න ඕනෑ. ඒ නීතිය ක්‍රියාත්මක වුණොත් විතරයි රජයේ ඉන්න අයටයි, රජයට විපක්ෂ අයටයි යම්කිසි හෝ ප්‍රජාතාන්ත්‍රවාදී අයිතිවාසිකම් ආරක්ෂා කර ගැනීමේ හැකියාවක්, පදනමක් ඇති වෙන්නේ. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ඔබතුමා මාර්ගයෙන් එම නිසා මම ආයාචනය කරනවා. මේ රටේ ශිෂ්ට සම්පන්න සමාජයක් ගැන අපි කථා කරනවා නම්, නීති ගරුක සමාජයක් ගැන අපි කථා කරනවා නම් අඩු තරමින් දැන් ඉඳලාවත් මේ හමුදාකරණය කරපු නාගරික සංවර්ධන අධිකාරියට තමන්ට ඕනෑ විධියට නීතිය ක්‍රියාත්මක කරන්න දෙන්නේ නැතිව මේ රටේ ව්‍යවස්ථාදායකය විසින් සම්පාදනය කරලා තිබෙන නීතිය ඒ ආකාරයෙන් ක්‍රියාත්මක කරන තැනකට ගේන්න උත්සාහ ගන්න තමන්ට පුළුවන් දේ කරන්නය කියලා මම ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියනවා මේ රටේ අද නීතිය දෙයාකාරයකට ක්‍රියාත්මක වෙනවා. මම භය නැතිව මේ සභාවේ කියනවා. 1978 ව්‍යවස්ථාවේ අපි කරපු ලොකු වැරැද්දක් තිබෙනවා. නීතියට සියලු දෙනා යටයි කියලා පිළිගත්ත මූල ධර්මය අපි කඩ කරමින් එක පුද්ගලයෙක්ව පත් කළා. නීතියට ඉහළින් ඉන්න පුද්ගලයෙක්ව අපි ව්‍යවස්ථාව යටතේ ඇති කළා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ඒ ජේ.ආර්. ජයවර්ධන -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

පොඩ්ඩක් ඉන්න. අපි තමුන්නාන්ස්ලා වාගේ පැති අරගෙන කථාකරන්නේ නැහැ. කියන්න තිබෙන දේ රටේ ජනතාව වෙනුවෙන් භය නැතිව කියනවා.

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ඒ කාලයේ කියන්න එපැයි. දැන්ද කියන්නේ?

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

අපට කියන්න තිබෙන දේ කියන්න දෙන්න. එක පුද්ගලයෙක්ව ඇති කළා. අද ඒ පුද්ගලයා සම්බන්ධ වුණු එක පුද්ගලයෙක් නොවෙයි, කුලකයක්ම අද මේ රටේ නීතියට පරිබාහිරව ගිහිල්ලා, නීතියට උඩින් ගිහිල්ලා මේ රට තමන්ගේ අප්පොච්චිගේ, බාප්පාගේ, නැන්දාගේ, සහෝදරයාගේ, පුතාගේ දේපළ හැටියට සලකගෙන අද නීතිය තමන්ට ඕනෑ ආකාරයට ක්‍රියා කරනවා. ඒ නිසා මේ ක්‍රමවේදය අපි වෙනස් කරන්නට ඕනෑ. 1978 ව්‍යවස්ථාවෙන් අපි ඒ කරපු වරදෙන් අද මම හිතනවා, මේ රටේ සියලු දෙනාම පව් ගෙවනවා. ඒක වෙනස් කරන්න නම් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉල්ලීමක් කරනවා. මේ සභා ගර්භය තුළ නීති ගරුක මහජන නියෝජිතයින් ඉන්නවා නම් මම ඉල්ලීමක් කරනවා. කරුණාකර දැන්වත් නීතියට අනුකූලව අඩු තරමින් වෙන කොහෙවත් බැරි නම් බස්නාහිර පළාත් සභා ප්‍රදේශය තුළවත් නීතිය ක්‍රියාත්මක කරන තැනකට ගෙනෙන්න උත්සාහ ගන්නය කියලා ඉතාමත්ම යටහත් ඉල්ලීමක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

[අ.භා. 12..54]

**ගරු සුසාර දිනාල් සිල්වා**
Hon. Susara Dinal Silva

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමන්ගේ යෝජනාව පිළිබඳව අදහස් ප්‍රකාශ කරන්නට අවස්ථාව ලබා දීම පිළිබඳව ස්තුතිවන්ත වෙනවා. මේ යෝජනාව දිහා බැලුවාම මේ පිළිබඳව අදහස් ප්‍රකාශ කළ යුතුයි කියලා මට සිතුන විශේෂ කාරණාවක් තිබෙනවා, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මම පාසල් අධ්‍යාපනය ලැබුවේ කොල්ලුපිටිය ප්‍රදේශයේ. මගේ පාසලේ විශාල සිසු පිරිසක් සිටියා, කොල්ලුපිටිය ආශ්‍රිතව මේ අනවසර ඉදි කිරීම් සහ මුඩුක්කු පරිසරවලින් පැමිණෙන පාසල් සිසුන්. මේ අයත් එක්ක ඉගෙන ගන්නකොට හයේ, හතේ, අටේ, නවයේ, දහයේ පන්තිවලදී අපි අවබෝධ කරගත්තු එක කාරණයක් තිබුණා. දෙමව්පියන් අපට කිව්වා. ගුරුවරුන් සමහර වේලාවට අපට පෙන්නලා දුන්නා. සමහර දරුවන් එක්ක උවමනාවට වඩා ඇහැලුම්පාන්න යන්න එපා කියලා. මේකට හේතුවක් තිබුණා. මේ පරිසරයෙන් පැමිණෙන දරුවන්ගේ අධ්‍යාපන පසුබිම දුර්වල වෙනවා පමණක් නොවෙයි. ඒ අය ජීවත්වන පරිසරය තුළ ඔවුන්ට එල්ල වන්නා වූ විවිධ බලපෑම් හේතුවෙන් අසභ්‍ය ප්‍රකාශන, බාල අපචාර, මත්ද්‍රව්‍ය, ගංජා වැනි දේවල් කෙරෙහි නැඹුරු වීමේ ප්‍රවනතාවයක් මෙවැනි පරිසරවල ජීවත්වන දරුවන් තුළ එදා දකින්නට ලැබුණා.

ඊට පස්සේ අපි උසස් අධ්‍යාපනයට ආපුවාම නැවත වාරයක් අපි කොළඹ නගරයේ ජීවත් වෙන්න පටන් ගත්තා. අපි කොළඹ නගරයේ ගනුදෙනු කළා. අපි පිටකොටුවෙන් බස් එකේ බැහැලා යනකොට සෙරප්පු දෙකක් දාගෙන ගියොත් කකුලේ ඇඟිලි අතරින් මඩ එළියට එන ගණනට මේක අපවිත්‍ර වෙලා තිබුණේ. ඒ වාගේම තමයි පාරේ ඇවිදගෙන යන්න පේව්මන්ට් එකක් නැහැ. අපට මතකයි, ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග මැතිනියගේ කාලයේදී මේ අනවසර ඉදි කිරීම්, මේ පේව්මන්ට් කඩ ඉවත් කිරීමට කිසියම් යෝජනාවක් ඒ කාලයේ ගෙනාවා. නමුත් ඒක විශාල අර්බුදයක් බවට පත් වෙලා ඒ කාලයේ ඒක නිමාවට පත් වුණා. ඊට කලින් යුගයේදී ලබා දීලා තිබුණු මේ අනවසර ඉදි කිරීම් හේතුකොටගෙන කොළඹ නගරයේ ඉතාම ව්‍යාකූල තත්ත්වයක් පසුගිය වසර ගණනාව පුරාම අපට දක්නට ලැබුණා. මේ තත්ත්වය ඇතුළේ වර්ධනය වන්නා වූ නොයෙකුත් සමාජ ව්‍යාධීන් තිබෙන බව අපි තේරුම්ගත යුතු වෙනවා. ගණිකා වෘත්තිය, මත්ද්‍රව්‍ය ව්‍යාපාරය, බාලඅපචාර, ඒ වාගේම අනිසි වැඩ කටයුතු සමාජය තුළ ව්‍යාප්තවීම සඳහා නාගරික පරිසරයක් ඇතුළේ සිදු වන්නා වූ මෙවැනි අනවසර ඉදි කිරීම් සහ කිසිම පාලනයකින් තොර ඉදි කිරීම් හේතුවන බව අපි හැම කෙනෙක්ම පිළිගන්නා වූ කාරණාවක්. මෙවැනි තත්ත්වයක් යටතේ කොළඹ නගරය දිනෙන් දිනම පත් වුණේ මේ රටේ තිබෙන විනාශකාරී, මේ රට අගතියකට ගෙන යන තැනකටයි. නමුත් යුද්ධය පැවැති කාලයේදී මේ කොළඹ නගරය සංවර්ධනය කිරීමේ කටයුතු නිසි පරිදි කරන්නට කිසිම රජයකට අවස්ථාවක් තිබුණේ නැහැ. රටේ මූලික priorities වෙලා තිබුණේ, ප්‍රමුඛතාවයන් වෙලා තිබුණේ වෙනත් කාරණාවන් ගණනාවක් උදෙසායි. නමුත් 2010 න් පස්සේ නාගරික සංවර්ධන අධිකාරියේ මූලිකත්වයෙන් කොළඹ නගරය වැනි බස්නාහිර පළාතේ තෝරාගත්ත විවිධ නගර සංවර්ධනය කිරීමේ, දියුණු කිරීමේ විවිධ ව්‍යාපෘතීන් ඉදිරියට පැමිණුනා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා සඳහන් කරනු ලැබුවා කොළඹ තිබෙන්නේ වෙනම ව්‍යාපාරික ආකෘතියක්. බොහොම වේගයෙන් බස් එකට දුවගෙන යන කෙනා, දුම්රියට දුවගෙන යන කෙනා වෙනුවෙන් ව්‍යාපාරික කටයුතු කරගෙන යන ව්‍යාපාරික ආකෘතියක් කියලා. සත්‍ය වශයෙන්ම එවැන්නක් තමයි තිබෙන්නේ. නමුත් ඒක වැරැදියි. ඒක නිවැරැදි විය යුතුයි. වඩාත් සාධාරණ වූ, වඩාත් අර්ථ සම්පන්න වූ ව්‍යාපෘතීන්, වඩා අර්ථ සම්පන්න වූ ව්‍යාපාරික ක්‍රමයක් කොළඹ නගරයේ ව්‍යාපාරිකයන් තුළ තිබිය යුතුයි. ඒ සඳහා ක්‍රියාත්මක වන වැඩ පිළිවෙළක් තිබිය යුතුයි. අපි දන්නවා, ගමෙන් කොළඹ නගරයට පැමිණ ව්‍යාපාරික කටයුතුවලට, එහෙ නැත්නම් තමන්ගේ ව්‍යාපාරයට අවශ්‍ය බඩු භාණ්ඩ අරගෙන යන වෙළඳ මහතෙකුට කොළඹ නගරයේ ගනුදෙනු කරගෙන යන්න සුදුසු වාතාරණයක් පසුගිය කාලයේ තිබුණේ නැහැ. ගැට කපන්නෝ සිටියා. වංචාකාරයෝ සිටියා. එහෙම නැත්නම් බඩුවක්, භාණ්ඩයක් මිලයට ගත්තාම ගෙදර ගිහිල්ලා බලද්දී තිබෙන්නේ වෙනත් භාණ්ඩයක්. පළතුරක් ගත්තොත්, කුණු කාණුවෙන්, පණුවෝ ගහන කාණුවෙන් තමයි මේ භාණ්ඩ මිලදී ගන්නට අවස්ථාව තිබුණේ. එළවළු ගත්තත් එහෙමයි. ඒක අරගෙන ගෙදර ගියාට පස්සේ ඇපල් ගෙඩිය කුණු වෙලා. කෙසෙල් ගෙඩිය කුණු වෙලා. ඒ වාගේ පණුවෝ ගහලා. මෙන්න මේ වාගේ වාතාවරණයක් කොළඹ නගරය තුළ තිබුණා. මේ තත්ත්වය නිවැරැදි කරලා, මේ අනවසර

ඉදි කිරීම් ඉවත් කරලා, මේ අනවසර ඉදි කිරීම් වෙනුවට වඩාත් අර්ථ සම්පන්න වූ අර්ථ ක්‍රමයක් තුළින් ආර්ථිකමය වශයෙන් මේ වෙළෙඳුන්ට නියමිත ආකාරයෙන් තමන්ගේ වෙළඳ ව්‍යාපාරික කටයුතු කරගෙන යා හැකි ආකාරයේ වැඩ පිළිවෙළක් සකසා දීම පසුගිය කාලය පුරා ක්‍රියාත්මක වෙලා තිබෙනවා.

අපි ඉතිහාසය පුරා නොයෙකුත් අවස්ථාවල කථා කළා. අපේ රට සංවර්ධනය විය යුතුයි. එදා හැට ගණන්වල, හැත්තෑ ගණන්වල සිංගප්පූරුව අපව උදාහරණයට ගත්තාට අද සිංගප්පූරුව අපව පසු කරගෙන ගිහිල්ලා තිබෙනවා. අපි ආපස්සට හැරිලා බැලුවොත් ලෝකයේ දියුණු වුණු නගර සිංගප්පූරුව, දකුණු කොරියාවේ සෝල් නුවර, ඒ වාගේම වියට්නාමයේ හෝචිං, එහෙම නැත්නම් හනෝයි නුවර මේ හැම නගරයක්ම සංවර්ධනය කළේ, මේ වාගේ ශක්තිමත් නායකත්වයක් උපයෝගී කරගෙන. මිනිස්සුන් ඒ සඳහා නැඹුරු කරගැනීම තුළින්. එහෙම නැතිව මේ කොන්ද පණ නැති රාජ්‍ය නිලධාරීන්ට මේ වාගේ කටයුත්තක් කරන්න බැහැ. ඒ නිසා අපි තේරුම්ගත යුතුයි. අරමුණක් හඳුනාගෙන ඒ අරමුණ වෙනුවෙන් ක්‍රියාත්මක වන්නා වූ දේශපාලන නායකයින්, ඒ වාගේම රාජ්‍ය නිලධාරීන් සිටිය යුතු වෙනවා. මේ රටේ මෙවැනි සංවර්ධන ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කිරීම සඳහා ඉතිහාසය පුරාවටම තිබුණු බාධාව වුණේ මේ මැතිවරණ ක්‍රමය තුළ තිබෙන්නා වූ මේ මනාප ක්‍රමයට, එහෙම නැත්නම් ඡන්දවලට තිබෙන්නා වූ ලෝභී භාවයයි. නමුත් ගරු ජනාධිපතිතුමන් මේ තත්ත්වයෙන් එළියට ගිහිල්ලා, ඡන්ද ගැන හිතන්නේ නැතිව රටේ සංවර්ධනය වෙනුවෙන්, රටේ සංවර්ධන අනාගතය වෙනුවෙන් තීරණ අරගන්න ජනාධිපතිවරයෙක් සහ ඒ ජනාධිපතිවරයා වටේට ඉන්න අමාත්‍ය මණ්ඩලයක් සහ රාජ්‍ය නිලධාරීන් පිරිසක් නිසා අද ඡන්ද ගැන හිතන්නේ නැතිව රටේ අනාගතය ගැන හිතලා, රටේ දියුණුව ගැන හිතලා තීරණ ගන්න තත්ත්වයකට ඇවිල්ලා තිබෙනවා. සමහර වේලාවට මෙවැනි කටයුතු සමහර දේශපාලන පක්ෂවලට දරාගෙන ඉන්න බැහැ. මිනිස්සු එකතු කරලා, මිනිස්සු රැස් කරලා මේ මිනිස්සුන්ව උසිගන්වන්න බලනවා. මොකද මේ යන ක්‍රමය ඇතුළේ අනාගතයේ මිනිස්සු ඉතාමත් සදාචාර සම්පන්න සමාජයක, දියුණු සමාජයක ජීවත්වන අවස්ථාවක් උදා වෙනවා. එවැනි තත්ත්වයක් ඇතුළේ සමහර දේශපාලන ව්‍යාපාරවලට ක්‍රියාත්මක වීමේ අපහසුතාවය තිබෙන නිසා ඒ තත්ත්වය වැළැක්වීම සඳහා ක්‍රියාත්මක වන බව අපට මේ වනකොට පෙනීගෙන යනවා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි මේ විවාදය ඇතුළේ යම් යම් අවස්ථාවලදී කියැවුණා, කොළඹ නගරයේ තිබෙන්නා වූ මේ Walking park පිළිබඳව. ඒවාට කට්ටිය එන්නේ නැහැයිලු. අපි තේරුම් ගන්න ඕනෑ. මේ වන කොට ඒ ගරු මන්ත්‍රීතුමා සභාවේ නැහැ. නමුත් අපි තේරුම්ගත යුතු වෙනවා. මේ Walking park හදලා කරන්නේ මිනිස්සු ඇවිදින එක විතරක් නොවෙයි. මේ තිබෙන තරගකාරී ආර්ථික රටාව ඇතුළේ විශේෂයෙන්ම අවුරුදු 25 ත්, 45 ත් අතර විවාහක පවුල්වල අද ඕනෑ තරම් අභ්‍යන්තර ගැටලු තිබෙනවා. ඔවුන්ගේ රැකී රක්ෂාව පැය 08 ක්, 09 ක් කරලා ගෙදර ගියාට පස්සේ දරුවන් එක්ක විනෝද වෙන්න මේ දෙමව්පියන්ට කාලයක් නැහැ. මේ අයට විනෝද චාරිකා යන්න වෙලාවක් නැහැ. නමුත් මේ අයට පොඩ්ඩක් ගෙදරින් එළියට ඇවිල්ලා පවුලේ තිබෙන පීඩනය, මානසික ආතතිය පිට කරගන්නට මෙවැනි Walking park, එහෙම නැත්නම් විනෝදාස්වාදය සඳහා මෙවැනි ස්ථාන ඇති කිරීම ඉතාමත් වැදගත් වෙනවා. ගරු මන්ත්‍රීතුමා සඳහන් කරනු ලැබුවා, අද මේවා තුළ සෙනඟ නැහැයි කියලා.

මම දන්නවා, තලවතුගොඩ ප්‍රදේශයේ, පැලවත්ත ප්‍රදේශයේ, බත්තරමුල්ල ප්‍රදේශයේ, කෝට්ටේ ප්‍රදේශයේ හැන්දෑවට මිනිස්සු පිරිලා ඉන්නේ. මේ දවස්වල හැමෝම හැන්දෑවට සරුංගල් අරිනවා. කවදාවත් ගෙයින් එළියට බැස්සේ නැති මිනිස්සු අද දරුවන් වෙනුවෙන් එළියට බැහැලා ඉන්නවා. මේක තුළ තිබෙන්නා වූ සමාජ විද්‍යාත්මක යථාර්ථය අපි තේරුම්ගත යුතුයි. මිනිස්සු ගෙවල් ඇතුළේ ඉන්නකොට ගෘහස්ථ ප්‍රචණ්ඩත්වය වැඩි වෙනවා. බාල අපචාර වැඩි වෙනවා. ගෙවල්වල ප්‍රශ්න වැඩි වෙනවා. දික්කසාද වැඩි වෙනවා. නමුත් මිනිස්සු එළියට ආපුවාම මේ පීඩනය පිට කරලා, මිනිස්සු බොහොම සාමකාමී විධියට සමාජය ඇතුළේ තමන්ගේ පීඩනය පිටත් කරලා ජීවත් වෙන්නට පුරුදු වෙනවා. ඒ විතරක් නොවෙයි. මෙවැනි කාරණා පිළිබඳව ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි පුළුල් ඇහැකින් බලන්නට ඕනෑ වෙනවා. අපි දන්නවා, මේ මුඩුක්කු පරිසරයන්වල - මෙතැන නාරාහේන්පිට ගැන, කොම්පඤ්ඤ වීදිය ගැන කථා කළා. ඒ වාගේම කොළඹ නගරයේ අනිකුත් ප්‍රදේශයන් පිළිබඳව කථා කළා. පුංචි දරුවන් එළියට බහින්නේ කුණු කාණුවට. අසූචි ගලාගෙන යන, මළ මූත්‍ර ගලාගෙන යන කුණු කාණුවට මේ අය එළියට බහින්නේ. නමුත් මේ තත්ත්වය වැළැක්විය යුතු වෙනවා. ඒ සඳහා ශක්තිමත් ක්‍රියා පිළිවෙතක් තිබෙන්නට ඕනෑ. ඒ ක්‍රියා පිළිවෙත ඇතුළේ මේ අයට යහපතක් සිද්ධ වෙනවා.

[ ගරු සුසාර දිනාල් සිල්වා ]

නමුත් අද දවසේ සිද්ධ වෙලා තිබෙන්නේ ඡන්ද 1000ක්, 2000 ක් වෙනුවෙන් හිතන්නේ නැතිව, රජය මේ වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරද්දී ඡන්ද 10 ක්, 15 ක් වෙනුවෙන් ක්‍රියාත්මක වන සමහර දේශපාලඥයින් විසින් මේ තත්ත්වය තමන්ගේ දේශපාලන උවමනා එපාකම්වලට ඉදිරියට දාන්න උත්සාහ කරවා.

ඒ වාගේම තමයි ගරු මන්ත්‍රීතුමන් සතුටු උයන පිළිබඳව සඳහන් කළා. සතුටු උයන පිළිබඳව මීට අවුරුදු දෙකකට, තුනකට, හතරකට පස්සට ගිහිල්ලා බැලුවාම මෙහි තිබුණු යන්ත්‍රසූත්‍ර මළකඩ කාලා ඒවා කඩා වැටෙන තත්ත්වයට පත් වෙලා තිබුණේ. මට මතකයි, ඒ කාලයේ ඔය සතුටු උයනට පොඩි ළමයෙක්ව විනෝදයට ගෙනියන්න බැහැ. මොකද එහා පැත්තේ විහාර මහා දේවි උද්‍යානයේ ක්‍රියාත්මක වන නොයෙකුත් අකටයුතුකම් නිසා. අද විහාර මහා දේවි උද්‍යානයේ මේ රටේ ඕනෑම ප්‍රදේශයක ඉන්න සංචාරකයෙක්ට ඇවිල්ලා, පුංචි දරුවෙක්ට දුර පළාතකින් ඇවිල්ලා, ඇවිදලා ගිහිල්ලා දෙමව්පියන් එක් විනෝද වෙන්න පුළුවන් විධියට වඩාත් අලංකාර විධියට හදලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි ඕනෑම කෙනෙකුට ගිහිල්ලා එහි විනෝද වෙන්න පුළුවන්. ඉස්සර ඒක වෙන් වෙලා තිබුණේ පෙම්වතුන්ට විතරයි. එතැන නොයෙකුත් අකටයුතුකම් සිද්ධ වුණා. අපචාරයන් සිද්ධ වුණා. නමුත් අද ඒ තත්ත්වය වෙනස් වෙලා තිබෙනවා. ඒක නිසා අපි තේරුම්ගත යුතුයි. මේ ලෝකයේ ක්‍රියාත්මක වන්නේ ආර්ථික යුද්ධයක්. ඒ ආර්ථික යුද්ධය ඇතුළේ ශ්‍රී ලංකාව රටක් විධියට පැවැතීමට නම්, ශ්‍රී ලංකාව ඉදිරියට යාමට නම් මේ රටේ මෙවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කළ යුතු වෙනවා. එවැනි ව්‍යාපෘතීන් ක්‍රියාත්මක කරන්න පවතින නීති රීති රාමුවේ තිබෙන්නා වූ අඩුපාඩුකම් තිබේ නම්, එහෙමත් නැත්නම් පවතින නීතිරීති රාමුව තුළ යම් යම් පසුබෑම් තිබේ නම් ඒවා ජයගෙන ඉදිරියට යෑමේ විකල්ප මාර්ග සොයා ගැනීමේ වගකීම රාජ්‍ය නිලධාරීන් සතු වෙනවා. ඒ විකල්ප ව්‍යාපෘතීන් හරහා යම්කිසි සිවිල් වැසියෙකුට බාධාවක් සිදු වෙනවා නම්, නීතිය කඩවීමක් සිද්ධ වෙනවා නම් ඒ අයට හැකියාව තිබෙනවා, අධිකරණයට ගිහිල්ලා තමන්ගේ මූලික අයිතීන් රැක ගන්න කටයුතු කරන්න.

ගරු ජ්‍යෙෂ්ඨ නීතිඥතුමන් සඳහන් කළා නීතිය අතට අරගෙන තිබෙනවා කියලා. නීතිය වල් වැදිලා තිබෙනවා කියලා. ගරු ජ්‍යෙෂ්ඨ නීතිඥතුමනි, එවැනි කාලයක අපි ජීවත් වුණා. කළු බළල්ලුන්ගේ අතට, තුණ්ඩු කැල්ලක අතට මේ රටේ නීතිය පත් වුණු යුගයක් තිබුණා. අද එහෙම තත්ත්වයක් නැහැ. අද මිනිස්සුන්ට උසාවියට යන්න පුළුවන්. මිනිස්සුන්ට ගිහිල්ලා තමන්ගේ ප්‍රශ්න විසඳගන්න පුළුවන්. ඒක නිසා අපි තේරුම්ගත යුතු වන්නේ, මේ පවතින ක්‍රියාදාමය ඇතුළේ මේ රට සංවර්ධනය සඳහා ගෙන යාමට තිබෙන්නා වූ අවස්ථාවන් හඳුනා ගැනීමයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පිළිබඳව අදහස් දැක්වීමට අවස්ථාව ලබා දීම පිළිබඳව බොහොමත්ම ස්තුතියි.

[අ.භා. 01.03]

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාගේ යෝජනාවේ ප්‍රධාන කරුණු තුනක් ගැන සඳහන් වෙනවා. ඒ කාරණා තුන වන්නේ, සංවර්ධන යෝජනා ක්‍රම සඳහා සංවර්ධන යෝජනාවල නම් යොදාගෙන මේ කටයුතුවලට යෙදෙන බවත්, ඒ වාගේම නීති රීති අනුගමනය නොකරමින් මේ කාර්යයන්හි යෙදෙන බවත්, ඒ වාගේම වන්දි හෝ විකල්ප සහන ලබා නොදී මේ කාරණා සඳහා ඉඩම් අත්පත් කරගන්නා බවත්. මේ ප්‍රධාන කාරණා තුන මත පදනම් වෙලා මේ දේපළ අත්පත් කර ගැනීම, ඉඩම් අත්පත් කර ගැනීම, අනවසර ඉඩම් වේවා, රජය සතු ඉඩම් වේවා, පෞද්ගලික පුද්ගලයන්ට අයත් ඉඩම් වේවා. මේ අංශ තුනේ කොයි ආකාරයක වර්ගීකරණය වී තිබෙන ඉඩම්වල සිටින පදිංචි උදවිය ඒවායින් ඉවත් කිරීම සිද්ධ කළ යුතු වන්නේ, මේ රටේ පවතින නීතිරීති පද්ධතියට අනුකූලවයි. ඒ නිසා මේ රටේ පවතින නීතිරීති පද්ධතීන්ට අනුකූලව කටයුතු කිරීමට තරම් ප්‍රමාණවත් නීතියක් නැත්නම්, ඒ නීති සම්පාදනය කිරීමේ වගකීම ව්‍යවස්ථාදායකයට තිබෙනවා. නමුත් අද තිබෙන ප්‍රශ්නය ප්‍රමාණවත් නීති පද්ධතිය උවමනාවටත් වඩා එපිට ගිහිල්ලා තිබෙන වේලාවක ඒ නීතිය නොසලකා හැරලා, ඒ නීතියේ තිබෙන ප්‍රතිපාදනයන් අනුගමනය කරන්නේ නැතිව මේ ඇගේ හයියට, සහෝදරයාගේ හයියට, තමන්ගේ පවුලේ බල පුළුවන්කාරකමට, තමන්ගේ පොලීසිය සහ හමුදාව යොදා ගනිමින් මේ අනීතික ක්‍රියා කරන එකයි අද තිබෙන වැරැද්ද. මේ සභාවේ කථා කරපු කිසිම මන්ත්‍රීවරයෙක්, ආණ්ඩු පක්ෂයේ වේවා. කොළඹ නගරයේ වේවා. කළුතර වේවා. වෙන කිසිම තැනක් සංවර්ධනය වීම නුසුදුසු, නොකළ යුතු අනවශ්‍ය ක්‍රියාවක් බව විපක්ෂයේ කිසි කෙනෙක් කිව්වේ

නැහැ. අපි හැමදෙනාම පිළිගන්නවා, රටක් විධියට මේ රට ඉදිරියට යනකොට විවිධ අංග සංවර්ධනය විය යුතුයි. විවිධ අංග අලුතින් එකතු විය යුතුයි. හැබැයි, ඒ සඳහා ක්‍රමවේද සකස් කිරීමේදී රටේ පවත්නා මූලික නීතිය අනුගමනය නොකර බලපුළුවන්කාරකමට, හිතුවක්කාරකමට නීතිය තමන්ගේ අතට අරගෙන, පොලීසිය හමුදාව යොදවලා, එක රැයක් එළිවනකොට පුද්ගලයන් ඉන්න නිවසින් ඇදලා දාලා ඩෝසර් කරලා මේ කටුයුතු කිරීම විතරයි වැරැද්ද තිබෙන්නේ. ඒ හැරුණු කොට මේ සභාවට මේ යෝජනාව ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයාගේ ඉඳලා අදහස් ප්‍රකාශ කරන අපි දක්වා සංවර්ධනය වේවා, ලස්සන කිරීම වේවා, එය වැදගත් කොට නොසලකන කාරණයක් වෙන්නේ නැහැ.

හැබැයි, මට හිතෙනවා සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා තවමත් කොල්ලුපිටිය ඉස්කෝලෙද ඉන්නේ කියලා. අර කිච්ච කොල්ලුපිටිය ඉස්කෝලෙද තවම ඉන්නේ කියලා. දැන් සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා කියන්නේ, ට්‍රිප් යන්න වෙලාවක් නැති කොළඹ නගරයේ මිනිස්සුන්ට ට්‍රිප් එකක් යනවා වෙනුවට එළියට බැහැලා ඇවිදින්න හදපු ඒවා කියලා. ඒකට, පවුල් පිටින් ජීවත් වුණු, තමන්ගේ අනාගත ජීවිතය බවට පත් කරගත්ත බිම තමයි බිලි දීලා තිබෙන්නේ. සුසාර දිනාල් ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීතුමා කියන විධියට අර ට්‍රිප් එකක් යන්න වෙලාවක් නැතිව ගෙදරින් එළියට බැස්සාට පස්සේ Walking park එකේ යන්න හදලා දීපු එක තමයි මේ ආණ්ඩුවෙන් මේ කරලා දීලා තිබෙන දේ. මම ඊට වඩා දෙයක් කියන්නේ නැහැ.

සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ කථාවත් එක්ක 1950 අංක 09 ඉඩම් අත්පත් කර ගැනීමේ පනතේ. මේ නීතිරීති හදද්දී, මේ පනත පැහැදිලිව කියනවා, ඒ පනතේ 5.2 වගන්තියේ පැහැදිලිව සඳහන් කරනවා, පොදු කාර්යයන් සඳහා උවමනා බවට - මෙය පොදු කාර්යයන් බවට පත් වෙන්න ඕනෑ. ඒ නිසා ට්‍රිප් යන්න බැරි මිනිහාට තෙල බස්ස ගන්න එළියට බැස්සාම Walking park එක හදන එක පොදු කාර්යයන් බවට පත් වෙන්නේ නැහැ. ඒ වාගේම මේ රටේ නීතිය ඇති පදමට තිබෙනවා. මේ කාරණා සම්බන්ධයෙන් මංමාවත් පනත තිබෙනවා. ගංවතුර පාලනය කිරීමේ පනත තිබෙනවා. Town and Country Plan පනත තිබෙනවා. මාර්ග සංවර්ධන අධිකාරී පනත තිබෙනවා. කොළඹ විශේෂිත පෙදෙස් සංවර්ධනය කිරීමේ ආඥා පනත තිබෙනවා. ඉඩම් ප්‍රතිසංස්කරණ හා සංවර්ධන සංස්ථා පනත තිබෙනවා. පහත් බිම් ප්‍රදේශවලට අදාළව. ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරී පනත තිබෙනවා. අවශ්‍ය තරමට නීතිය තිබෙන මේ රටේ ඒ නීතිය යොදා ගන්නේ නැතිව අර වනාතමුල්ලට ගිහිල්ලා වනාතමුල්ලේ මිනිස්සුන්ව පාරට ඇදලා දාන්න හදන වෙලාවේ ඒකට විරුද්ධ හඬ නඟපු සුනිල් කියන පුද්ගලයාව උස්සාගෙන ගිහිල්ලා, කොළඹ භාර රටේ ජ්‍යෙෂ්ඨ පොලිස්පති එතැනට ඇවිල්ලා මොකක්ද කියන්නේ? පැය 24 ක් යන්න කලින් මිනිහා ආපසු එනවා, හිටියාට වඩා නිරුපද්‍රිතව. එහෙමනම් මේකෙන්ම පැහැදිලි වෙනවා. මේක සිද්ධ වෙන්නේ අනීතිකව බලය යොදවලා, මිනිස්සු භය කරලා, සුදු වෑන් ගෙනැල්ලා, උස්සන් ගිහිල්ලා කියන කාරණය පැහැදිලිව වෙනවා. මේකට විරුද්ධව කොහෙටද යන්න තිබෙන්නේ. අධිකරණයට යන්නද? අධිකරණයට යන්න පුළුවන්කම අද ලංකාවේ නීතිය තුළ - පැය 24 ක් ඇතුළත ලංකාවේ අග්‍රවිනිශ්චයකාරතුමියව ඉවත් කරපු රටක, නීතියේ සහන පතන්න යන මිනිස්සුන්ට අත්වන ඉරණම පිළිබඳව පැහැදිලි චිත්‍රය තමයි පැය 24 න් නඩු අහලා අග්‍රවිනිශ්චයකාරතුමියව ගෙදර යැව්වේ. ඒ නිසා නීතිය පිළිබඳ විශ්වාසය ජන සමාජයෙන් බිඳ වැටිලා තිබෙනවා. ඒක අග්‍රවිනිශ්චයකාරතුමියට නැත්නම් රටේ ජීවත්වන සාමාන්‍ය සිරිපාලයියට, බණ්ඩයියට, ජේන් අක්කාටත් ඒක නැහැ. ඒක නැති නිසා තමයි අද මේ රටේ මේ විධියට නිලධාරීන් නීතිය අතට අරන් තිබෙන්නේ.

මෙය පැහැදිලිවම සඳහන් වෙනවා, ඉඩම් අත්පත් කර ගැනීමේ පනතට අදාළව ඉඩම් අමාත්‍යාංශයෙන් චක්‍රලේඛන 02 ක් නිකුත් කරලා තිබෙනවා. මේ චක්‍රලේඛ දෙක, LD 05 D 08/2012.10.07 චක්‍රලේඛය සහ LD 05 D 08/2012.10.06 චක්‍රලේඛ යයි. මේ චක්‍රලේඛ දෙක ඉඩම් අමාත්‍යාංශයේ ලේකම් විසින් යවනවා, සියලුම අමාත්‍යාංශ ලේකම්වරුන්ට, හදිසි අවශ්‍යතා කරුණක් සඳහා රජයට ඉඩම් අත්පත් කර ගැනීම සඳහා අදාළ වන අවස්ථාවලදී මොකද කරන්න ඕනෑ කියලා. ඒ වාගේම සිය කැමැත්තෙන් තොරව අවතැන් වූවන් නැවත පදිංචි කිරීම පිළිබඳව ජාතික ප්‍රතිපත්තියේ සිට කටයුතු කරන්නය කියලා යවනවා. එතකොට ඉඩම් අමාත්‍යාංශයේ ලේකම්ට ඒ දක්වන මේ ලිපිය යන ලේකම් ගොන්නයට අයිති වෙන්නේ නැද්ද? ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයා. එයා වෙන අමාත්‍යාංශයක ලේකම් කෙනෙක්ද? එයා වෙන රටක ලේකම් කෙනෙක්ද? එයාට මේ නීති පද්ධතිය බලපාන්නේ නැද්ද? ඒ නිසා මේ කරන සියලු කාර්යයන් තුළ සිද්ධ වන්නේ, රටේ සාමාන්‍ය මිනිස්සුන්ගේ නීතියේ

[ ගරු කේ.ඩී. අරුණ දීපාල් ]

යහ පාලනයට තිබෙන ඉඩකඩ අහුරලා, වහලා රටේ අයියලා, මල්ලිලා, සහෝදරයෝ පවුල් පරම්පරාවක් එකතු වෙලා බලය අයුතු ලෙස යොදා ගනිමින් මිනිස්සු මත පීඩනය ඇති කරලා තමන්ගේ වර්ගයාට, තමන්ගේ පවුලේ ඥාති වර්ගයාට, පවුලේ හිතවතුන්ට මේ දේපළ නැවත බදු දීමයි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොන්ද පණ තිබෙන රාජ්‍ය නායකයෙක් ගැන කිව්වා. එහෙමනම් කොන්ද පණ තිබෙන රාජ්‍ය නායකයා ආරක්ෂක ලේකම් විතරද? ඒ කොන්දට පණ ආවේ පොලීසියයි, හමුදාවයි වටේ ඉන්න හින්දාද? අයියා ජනාධිපති හින්දාද? ඒ අය නිසාද කොන්ද පණ තිබෙන රාජ්‍ය නිලධාරියෙක් බවට පත් වෙලා තිබෙන්නේ? ඒ කොන්ද පණ තිබෙන එක නිලධාරියෙක් නොවෙයි. සියලුම රාජ්‍ය සේවයේ නිලධාරීන්ගේ කොන්ද පණ නැති කරලා එක්කෙනෙක්ගේ පණ ඇති කොන්දක් හැදීමට විරුද්ධව මේ යෝජනාව සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ගෙන ඒම පිළිබඳව ස්තූතිවන්ත වෙමින් නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

[අ.භා. 01.11]

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මට මේ සම්බන්ධව කථා කරන්න අවස්ථාව ලබා දීම පිළිබඳව මම ස්තූතිවන්ත වෙනවා. මම පළමුව අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා මේ ගෙන එන ලද යෝජනාව පිළිබඳව ඇත්තටම එක පැත්තකින් සතුටුත් වෙනවා. මොකද, මේ රටේ සංවර්ධනය ගැන කථා කරන්න අවස්ථාවක් ලැබීම පිළිබඳව. මම යෝජනාවට විරුද්ධ වෙනවා. අපි මේ රෙගුලාසිවලට පටහැනිව අපි මේ ලංකාවේ කොහෙවත් ඉඩම් අත්පත් කරගෙන නැහැ. මේ රටේ පළාත් පාලන ආයතනවල සභාපතිවරු ලෙස හිටපු අය හැටියට අපි දන්නවා. එහෙම අත්පත් කර ගන්නවා නම්, රටේ නීතියක් තිබෙනවා. එලෙස නීත්‍යානුකූල අත්පත්පත් කර ගත්තේ නැත්නම් උසාවිය තිබෙනවා. උසාවි යන්න පුළුවන්. අද එහෙම උසාවි යන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙපමණ වෙලා කිව්වේ ඒ ගැන තමයි. නැහැයි කියලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද එක්සත් ජාතික පක්ෂ ආණ්ඩු කාලය වාගේ උසාවි යන්න බැරිකමක් නැහැ. 89, 90 භීෂණ කාලයේ තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ රටේ නීතියක් තිබුණේ නැත්තේ. ඒ කාලයේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මෙතුමාට 89, 90 න් තොර ලෝකයක් නැහැ නේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඒ කාලයේ මේ අය නිදාගෙන සිටියේ නැහැ. අද ජනතා විමුක්ති පෙරමුණ දන්නවා, ජනතා විමුක්ති පෙරමුණයි, එක්සත් ජාතික පක්ෂයයි එදා තරගයට මිනී මරලා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

71 මැරුවේ කවුද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද රටේ මානව හිමිකම් කඩ කරනවා කියලා කථා කරනවා. අද ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කොහේවත් මානව හිමිකම් කැඩෙන්නේ නැහැ. අද මුළු ලංකාවම දන්නවා, කොළඹට ආවට පස්සේ එදා කොළඹ තිබුණේ කොහොමද? අද කොළඹ තිබෙන්නේ කොහොමද? කියලා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමා රාජිත සේනාරත්න ඇමැතිතුමාගේ පැත්තේද? බොදුබල සේනාවේ පැත්තේද?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

කොළඹ නගර සභාවේ නගරාධිපතිතුමා ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාත් එක්ක අතින් අල්ලාගෙන ඒ සංවර්ධනයට දායක වෙන්නේ, ඒ හොඳ නරක දන්නා නිසා තමයි. මම කියන්නේ හොඳ නරක දැනගන්න ඕනෑ. හොඳ නරක දැනගෙන කථා කරන්න ඕනෑ. අද මුළු රටම කථා කරනවා. අද මම ගරු මන්ත්‍රීතුමාට කියන්න කැමැතියි. අද කොළඹ නගරයේ ඉන්න ජනතාවට මේක අදාළ නැහැයිලු. කොළඹ නගරයේ ඉන්න ජනතාවට විතරක් නොවෙයි. අද කොළඹ නගරය කියන්නේ, අපි සියලු දෙනාගේම නගරය. එදා විදේශිකයෝ ඇවිත් කොළඹට බැස්සාට පස්සේ රට මොන තත්ත්වයේද කියලා තේරුම් ගන්නවා. අදත් කොළඹට බැස්සාට පස්සේ රට මොන තත්ත්වයේද තිබෙන්නේ කියලා තේරුම් ගන්නවා. ගරු මන්ත්‍රීතුමා අද ඒ විධියට රට තිබෙන්නේ. ඒ නිසා තමුන්නාන්සේලාට කියන්න දෙයක් නැහැ. අද මම නම් කැමැතියි. මම හෙටත් කැමැතියි. කොළඹ දිස්ත්‍රික්කය නොවෙයි. අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා කළුතරටත් ඇවිල්ලා ඔය සංවර්ධනය කරනවා නම්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඇයි කළුතර කළේ?

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

භය තිබෙන්නේ වෙන මොකකටවත් නොවෙයි. මේ අය තුළ භය තිබෙන්නේ සංවර්ධනය කරනකොට මේ අයගේ ඡන්ද ටික නැති වෙන නිසයි. ජනතා විමුක්ති පෙරමුණට බොරුවෙන් මේ ඡන්ද ගන්න බැරි වෙනවා. අද තමුන්නාන්සේලාගේ හදවතට කථා කරලා අහන්න. 89, 90 කාලයේ තමුන්නාන්සේලාට නීතියක් තිබුණාද? අද ඒ නිසා නේද ජනතා විමුක්ති පෙරමුණට, එක්සත් ජාතික පක්ෂයට, තමුන්නාන්සේලාට තරගයට මිනී මරන්න වුණේ? ඒ මිනී මැරුවා කියලා තමුන්නාන්සේලාට පුළුවන් වුණාද -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

මේ වෙන වචන 10 ක් කථා කරන්න පුළුවන් කාට හරි දෙන්න කෝ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව ලබා දෙන්න.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

උසාවි යන්න පුළුවන් වුණාද? එදා එහෙම උසාවි යන්න පුළුවන් තත්ත්වයක් තිබුණේ නැහැ. ඊට පස්සේ කථා කරනවා විධායක ජනාධිපතිකම් ගැන. විධායක ජනාධිපතිකම ඇති කළේ කවුද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

තුනෙන් දෙක ඔබතුමන්ලාට තිබෙනවා නේ. නැති කරන්න කෝ.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

අද ඒ නිසා තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මුළු රටම එක විධියට සංවර්ධනය වෙන්නේ. මම නාගරික සංවර්ධන අධිකාරිය භාරව ඉන්න විශේෂයෙන්ම අපේ ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාට මගේ ගෞරවනීය ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා,

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කඩේ යනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

රට වෙනුවෙන් කරන්නා වූ සංවර්ධනය පිළිබඳව. ඒ නිසා එක්සත් ජාතික පක්ෂයට, ජනතා විමුක්ති පෙරමුණට -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

එහෙම නැත්නම් උස්සනවා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

ඔහොම සංවර්ධනයට විරුද්ධ වෙන්න ගියොත් තමුන්නාන්සේලාට තව තවත් තමුන්නාන්සේලාගේ අනාගතය නැති වෙනවා. ජනතාව තව තවත් තමුන්නාන්සේලාව අපහසුතාවයට පත් කරලා තමුන්නාන්සේලා සියලු දෙනා ගෙදර යවනවා කියන එක මතක් කරමින් මම නිහඬ වෙනවා.

[අ.භා. 01.15]

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ අවස්ථාව මට ලබා දීම පිළිබඳව බොහොම ස්තූතියි. ඒ වාගේම අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා ගෙනෙන ලද ඉතාම වැදගත් යෝජනාව පිළිබඳව කොළඹ නගර සභාව නියෝජනය කරපු මන්ත්‍රීවරයෙක් හැටියට මමත් වචන කිහිපයක් කථා කරන්න ඕනෑ. එතුමා මේ ගෙනෙන ලද යෝජනාවට මම ඉතාම සතුටු වෙනවා. ඉතාම කාලෝචිත යෝජනාවක්. නමුත් මේ වචන සෙට් එකේ පොඩි ප්‍රශ්නයක් තිබෙනවා. මේකේ තිබෙනවා, ඉඩම් අත්පත් කර ගැනීම කියලා. ගරු මන්ත්‍රීතුමනි, ඉඩම් අත්පත් කර ගැනීමක් සිදු වන්නේ නැහැ. ඉඩම් මංකොල්ලයක් වෙන්නේ. සංවර්ධනයට කියලා ගන්නවා. මිනිස්සුන්ට ගෙවල් දෙන්න කියලා ඉඩම් ගන්නවා. ගෙයක් දීලා නැහැ. මිනිස්සුන්ට කොළඹ නගරයේ ගෙවල් දීලා නැහැ. අඩු ප්‍රමිතියෙන් යුතු ගෙවල් විකුණලා තිබෙනවා. රුපියල් 50,000/- ක් ඉස්සෙල්ලා ගන්නවා. රුපියල් 50,000/- ක් පස්සේ ආයේ ගන්නවා. විදුලිය ගන්න වෙනම මුදල් ගෙවන්න ඕනෑ. අවුරුදු 20 ක් රුපියල් තුන්දහස් ගණනක් ද කොහෙද ගෙවාගෙන යන්න ඕනෑ. ඒ දීපු ඉඩමක් නොවෙයි. ගෙවල් දීපු එක ගැන අපෙන් අහන්න. යූ.ඇන්.පී.ආණ්ඩුව කාලයේ ඉඩම් කෑල්ලක් දුන්නා. ගේ හදා ගන්න මුදලුත් දුන්නා. අන්න එහෙමයි ගෙවල් දෙන්නේ. මම දන්නේ නැහැ, මේක මොකක්ද කියලා. එතකොට මේ මානව හිමිකම් කමිටු, අධිකරණය ගැන මම කථා කරන්න යන්නේ නැහැ. මොකද, රටේ ජනතාවට ඒ පිළිබඳ විශ්වාසයක් නැති වෙලා තිබෙනවා. මොකද, ජනාධිපතිවරයාගේ හිටපු උපදේශකවරයෙක් අගවිනිසුරු කළාම මම දන්නේ නැහැ, ඒක කොයිතරම් සදාචාරාත්මකද කියලා. මගේ කාලය පොඩි නිසා මම තව එහාට යන්නම්.

රෝහණ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා, මම ගරු කරන මන්ත්‍රීවරයෙක්. එතුමාගේ අයියටත් අපි ගරු කරනවා. නමුත් එතුමා කිව්වා, මේ කොන්දේසිවලට අනුව තමයි මේ ගෙවල් කඩන්නේ. මේවා නීතියේ තිබෙනවාලු. හරි. නීතියේ තිබෙන්න පුළුවන් ගරු මන්ත්‍රීතුමනි. ඒ වුණාට මනුස්සකම කෝ? මනුස්සකම ගැන හිතන්න එපැයි නේ. සංවේදී නායකයෙක් නේ ඉන්නේ. එතකොට ඔය කඩ ටික කඩලා ඉවර වෙලා ඔබතුමා කිව්වා, ඉදිරියේදී කඩ දෙනවා කියලා. ඒ කඩ දෙන තුරු ඒ දරුවන්ට කන්න දෙන්නේ කවුද? අර බබාව වඩා ගන්න ගමන් කිරි පැකට් එකේ බද්ද වැඩි කරන ආඩම්බරකාර තාත්තාද? එහෙම නැත්නම් ආච්චිව, සීයාව බදා ගන්න ගමන් බෙහෙත් ටික නැති කරන සංවේදී නායකයාද කන්න දෙන්නේ. එහෙම නැත්නම් අපේ රෝහණ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමාගේ අයියද? මම ඒක දැනගන්න ඇත්තටම හරි කැමැතියි. එතකොට තව දෙයක් ගැන කථා කළා. මම තව දෙයක් කියන්න ඕනෑ. මේ රොඩ්නි ෆ්‍රේසර් ගරු මන්ත්‍රීතුමා ඉතාම සංවේදීව කථා කරන දෙයක්. මේ පාර්ලිමේන්තුව ළඟ මාදිවෙල තිබෙන - ගරු මන්ත්‍රීතුමා මේවා කියන්න ඕනෑ. පාර්ලිමේන්තුව ළඟ තිබෙන කුඹුරු ටික අද අත්පත් කරගන්න යනවා. වගා කරන්න දෙන්නේ නැහැ. හැබැයි කියන්නේ අපි වවමු - රට නහමු. ඕකයි කියන්නේ. ඒ ඉඩම් ටික පුරෝලා විකුණන්න තමයි යන්නේ. මේකද සංවර්ධනය? මෙහෙමද අපි වවන්නේ? ඒකත් කියන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මේ සැරේ බලාගන්න පුළුවන්. කොටියට වෙච්ච දේ තමයි වෙන්නේ.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ඒ වාගේම තව දෙයක් තිබෙනවා. මම ඉතාම ගරු කරන මන්ත්‍රීවරයෙක්. එතුමාගේ පළමුවැනි කථාව මම අහගෙන සිටියා. මම සතුටු වුණා. අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා. හැබැයි, අද කරපු කථාව ගැන නම් මට ලැජ්ජයි. මොකද, ඔබතුමා කිව්වා, ඔබතුමා කොල්ලුපිටියේ පාසලකට තමයි ගියේ කියලා. ගරු මන්ත්‍රීතුමා මම ගියෙත් කොල්ලුපිටියේ පාසලකට. හර්ෂණ රාජකාරුණා විපක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායකතුමා එක්ක මම එකට පන්තියේ සිටියේ. මෙතුමා කිව්වා, ඒ වටේ ඉන්නේ කුඩුකාරයෝ, ගංජාකාරයෝ, කථා කරන්න දන්නේ නැති මිනිස්සු කියලා. හරිම කැතයි. ඒ වාගේ Stereotype කරන්න එපා. මොනවා වුණත් අපිත් එක පාසල්වල හිටපු මිත්‍රයෝ. හර්ෂණ රාජකාරුණා ගරු විපක්ෂයේ සංවිධායකතුමා, මම දන්නේ නැහැ. මම ඔබතුමාත් එක්ක පන්තියේ සිටියා. අපි එකට ඉස්කෝලේ ගියේ. හැබැයි මේකයි. අපේ අම්මලා, තාත්තලා නම් කියලා නැහැ ජාතිය, ජන්මය, එන තැන, මිනිහෙකුට සල්ලි තිබෙනවාද නැද්ද කියලා බලලා ආශ්‍රය කරන්න කියලා. ඒ දරුවන් ප්‍රසිද්ධ පාසල්වලට පැමිණි නිසා

තමයි අද ඒ දරුවන්ට හොඳ රැකියා හම්බ වෙලා තිබෙන්නේ. ඔය ළමයින්ව ගිහිල්ලා පිටට දැම්මාම ඒ ප්‍රසිද්ධ පාසලට යන්න තිබෙන අවස්ථාවත් අද ඇහිරෙනවා. කොළඹ රාජකීය විද්‍යාලයට, මහානාමයට අද දුප්පත් අම්මා කෙනෙකුගේ ළමයෙක්ව දාගන්න බැහැ. ඒකටත් අකුල් හෙලලා තිබෙන්නේ. මේ ආණ්ඩුවෙන් කරන්නේ මොනවාද? තිබෙන එකාට සැප දෙනවා. නැති එකාව නැත්තටම නැති කරනවා. දුප්පත්කමට විරුද්ධ සටහනක් නොවෙයි රජයේ තිබෙන්නේ. දුප්පතාට විරුද්ධ සටනක් කියලා මම වගකීමෙන් කියනවා.

ඒ විතරක් නොවෙයි - සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා එහෙම කථා කරන්න එපා. ඔබතුමාගේ කථාවත් අර සිරස ඩිබේට් එකේ පොඩි දරුවෝ කථා කරනවා වාගේ කථා කිරීමක් ඔබතුමා කළේ. ඒ විතරක් නොවෙයි. තව එක දෙයක්. දැන් ඔබතුමන්ලා මට කිව්වා, මේ 21 වැනිදාට බලාගන්න පුළුවන් වෙයි. එතකොට අර රෝහණ අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා අපට කිව්වා, ජනතාව සංවර්ධනය වෙලා නැද්ද කියලා පපුවට තට්ටු කරලා බලන්න කියලා, ජනතාවට මේ සංවර්ධනය තේරිලා නැද්ද කියලා පපුවට තට්ටු කරලා අහන්න කිව්වා. එතකොට තේරෙයි කිව්වා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම ඉවර කරන්නම්. එහෙමනම් මට කියන්න ජනතාවට ඒක තේරිලා තිබෙනවා නම් කොහොමද මේ පළාත් සභාවේ මන්ත්‍රී ආසන 12 ක් අඩු වුණේ. ජනතාවට තේරිලා නම් මේ සංවර්ධනය, 12 ක් අඩු වෙලා.

**ගරු ලලිත් එල්ලාවල**
Hon. Lalith Ellawala

තමන් පැරදුනේ ඇයි කියලා අහගන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

තමන්ගේ අඩුව වහගන්න ගරු මන්ත්‍රීතුමා, වෙන කාටවත් ඇඟිල්ල දික් කරන්න එපා. ඔබතුමන්ලාට 12 ක් නැති වෙලා තිබෙන්නේ. ඒ විතරක් නොවෙයි. බලන් ඉන්න හැමෝටම මෙය තේරෙන්න ඕනෑ. අද ඔබතුමන්ලාගේ පැත්තෙන් කොළඹ දිස්ත්‍රික්කයේ එක මන්ත්‍රීවරයෙක් මේකට කථා කළේ නැහැ. අද කොළඹ දිස්ත්‍රික්කයේ ඔබතුමන්ලාගේ මන්ත්‍රීවරු සභාවට ඇවිල්ලත් නැහැ. ඉන්න කට්ටිය කට වහගෙන ඉන්නවා. මොකද, එතුමන්ලාට බැහැ මේක ගැන කථා කරන්න. කොළඹ දිස්ත්‍රික්කයේ මන්ත්‍රීවරුන්ට මේක තේරෙනවා. තව දෙයක් තිබෙනවා. නගරාධිපතිතුමා ගැන කිව්වා. නගරාධිපතිතුමා හයේ වැඩ කරනවා නොවෙයි. ගෝඨාභය රාජපක්ෂ මහත්මයා කොහොමත් කරනවා කියලා දන්නවා. ඒක නින්දා ජනතාවට ලබා දෙන්න පුළුවන් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

ටික දේ හරි ලබා දෙන්න එතුමා උත්සාහ කරනවා. එතුමා ජනතාවට ආදරේ හින්දා. තව දෙයක් තිබෙනවා. චන්ද්‍රිකා බණ්ඩාරනායක කුමාරණතුංග මැතිනියගේ ආණ්ඩුව කාලයේ මංගල සමරවීර ඇමැතිතුමා කොළඹ සංවර්ධනය කරන්න යනකොට ෆවුසි ගරු ඇමැතිතුමා කිව්වා, ඕවා කරන්න ඕනෑ අපේ මිනී උඩින් කියලා. අද ෆවුසි ඇමැතිතුමාත් කට වහගෙන. මේකයි, කොන්දේසි තිබෙන්න පුළුවන්. නීති තිබෙන්න පුළුවන්. ජනතාව ගැන සංවේදී වෙන්න. දුප්පතාගේ අමාරුකම් ගැන හිතන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු අනුරාධ විමලරත්න**
Hon. Anuradha Vimalarathne

මම අවසන් කරන්නම්. සැමදෙනාටම බොහොම ස්තූතියි. මගෙන් වැරැද්දක් වුණා නම්, කාගේ හරි හිත රිදුනා නම් සමාවෙන්න. බොහොම ස්තූතියි.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සුසාර දිනාල් -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමා මොකක් යටතේද කථා කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක්. සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ කථාව තුළ අර පසුගිය දවසක මර්වින් සිල්වා ගරු ඇමැතිතුමා කිව්වා, ප්‍රේත වස්තුවේ කියැවෙනවා කියලා නරක කථා කියපු, අසභ්‍ය කථා කියපු, මේ වාගේ කථා කියපු පුද්ගලයෙක් කටට පණුවෝ ගහලා-

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාට ඒක බලපාන්නේ කොහොමද?

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

වරප්‍රසාදය මොකක්ද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

කටෙන් පණුවෝ ගහලා කට ගඳ ගගහා ඇවිදිනවා කියලා. ඒක නිසා සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාගේ කථාව තුළ ඒ මර්වින් සිල්වා ගරු ඇමැතිතුමාගේ,

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ වරප්‍රසාද කඩ වෙන්නේ කොහොමද?

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු මන්ත්‍රීතුමාගේ වරප්‍රසාද කඩවෙන කථාවක් තමයි එදා කියලා තිබෙන්නේ කියලා මට හිතෙනවා, මේ වරප්‍රසාද ප්‍රශ්න යටතේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමාට ඔක්කෝටම පොදුවේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට උපාලි කොඩිකාර ගරු ඇමැතිතුමාට, විනාඩි 10 ක කාලයක් ලබා දෙනවා.

[සභාවේ සෝෂා]

[අ.භා. 01.24]

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම VI වන පළාත් සභාවේ -

[සභාවේ සෝෂා]

නිවාස අමාත්‍යවරයා හැටියට ප්‍රථමයෙන්ම මම මහරගම ජනතාවට මගේ ස්තුතිය පුද කර සිටිනවා, හය වතාවක් මාව පළමුවැනියා බවට පත් කිරීම පිළිබඳව. ඒ වාගේම කොළඹ දිස්ත්‍රික්කයෙන් තුන්වැනියා කරලා, පළාත් සභාවට කොළඹ දිස්ත්‍රික්කයේ ජනතාව පත්කිරීම සම්බන්ධවත් ස්තුති කරනවා. ඒ වාගේම අපේ සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා අද මේ ගෙනෙන ලද යෝජනාව සම්බන්ධව කථිකයෝ රාශියක් විවිධ අදහස් ප්‍රකාශ කළා. මම ප්‍රථමයෙන්ම එක්සත් ජාතික පක්ෂයේ ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා යම් කරදර ජරමර තැනක ඉපදිලා ඉන්නවා නම් මේ කථාවලින් එතුමාට ලැබෙන පිනෙන් එතුමාට හොඳ තැනකට යන්න වාසනාව ලැබෙන්න කියලා තමයි ඉස්සෙල්ලාම මම ප්‍රාර්ථනා කරන්නේ.

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

වරප්‍රසාද ප්‍රශ්නයක්. භාෂා පරිවර්තකයෙක් ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා කොළඹ සංවර්ධනය කරන්න ඕනෑය කියලා තමයි, නාගරික සංවර්ධන ආඥා පනත ගෙනාවේ. විශේෂයෙන්ම රටේ නාගරික කලාප සංවර්ධනය කරන්න ඕනෑය කියලා තමයි ආර්. ප්‍රේමදාස ජනාධිපතිතුමා මේ නාගරික සංවර්ධන අධිකාරිය පිහිටුවන කොට අපේ උගත්, බුද්ධිමත් නීතිඥ මහත්මයා මේ පනත හදන්න ඒ කමිටුවේ වාඩි වුණු කෙනෙක් කියන එක මම මතක් කරනවා.

[සභාවේ සෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

78 වාඩි වුණාද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් මේ කොළඹ නගරය හදාගෙන හදාගෙන යන කොට අපේ කවුද මේ -

[සභාවේ ඝෝෂා]

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

නම හොයනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

කවුද?

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ අත්පත් කර ගැනීම්. ගෙවල්වල පදිංචි කිරීම්. Walking park මේවා ගැන කථා කරනකොට මෙතුමාගේ නෝනා මෙතුමන්ලාගේ ආගම අනුව පර්දාව පැළඳගෙන බාබාලා දෙන්නත් එක්ක අර අතන ටොරින්ටන් එකේ ඇවිදිනවා මම දැක්කා. දැන් මෙහේ ඇවිල්ලා මෙහෙම කථා කරනවා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ෆවුසි ඇමැතිතුමාගේ බල මණ්ඩලයේ නියෝජ්‍ය ලේකම්වරයා හැටියට ආර්. ප්‍රේමදාස මැතිතුමා මේ පනත ගෙනැල්ලා කොළඹ අනවසර ඉදි කිරීම් ඉවත් කරනකොට මෙතුමා පෙළපාලි ගියා, එදා ෆවුසි ඇමැතිතුමා එක්ක. රහුමාන් මන්ත්‍රීතුමා. මෙතුමා එදා සිටියේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ. මෙහෙම අය තමයි අද මේ පනත ගැන කථා කරන්නේ. මේ පනත ශක්තිමත් කරන්න ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමාට මේ සියලුම අය පිං දෙන්න ඕනෑ, රාජපක්ෂ පවුලේ මෙහෙම දරුවෝ ටික හැදුවාට. ආරක්ෂක ලේකම්තුමා යුද්ධය නතර කරලා මේ රට තුළ තිස් අවුරුද්දක් තිස්සේ තිබුණු ශාපය නැති කළා.

[සභාවේ ඝෝෂා]

ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම් වෙලා -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මෙතුමා ජිනදාස වීරපාල මන්ත්‍රීතුමාගේ -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

මහ ඇමැතිකම හම්බ වෙන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අද හදන ලස්සන. තමුන්නාන්සේලාට -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

උප ලේකම්. ආරම්භය එක්සත් ජාතික පක්ෂයේ. ජිනදාස වීරපාල මන්ත්‍රීතුමාගේ තරුණ පෙරමුණේ ලේකම්.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මෙතුමාට මාව එක්සත් ජාතික පක්ෂයට ගන්න ඕනෑ නම් මගේ අර වික්ක දේපළ වස්තු ඔක්කෝම දුන්නත් යන්නේ නැහැ. මෙතුමාට ආශාවක් තිබෙනවා, අපව එක්සත් ජාතික පක්ෂයට හරවා ගන්න.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඔබතුමාට එක්සත් ජාතික පක්ෂයත් එක්ක තරහක් තිබෙනවාද? අපේ පැත්තට එන්න හදන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

[සභාවේ ඝෝෂා]

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

විනීත විධියට හැසිරෙන්න. පෞද්ගලික දේවල් කියවන්නේ නැතිව.

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

මම නම කියලා නැහැ නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමා. ඇයි මේ අය තොණ්ඩුව දා ගන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා විනාඩියක් ඉන්න.

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

හරි නම් තොප්පිය දාගන්න. අපි නමක් කියලා නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා,

[සභාවේ ඝෝෂා]

**ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා**
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ -

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

විනාඩියක් වාඩි වෙන්න.

[සභාවේ ඝෝෂා]

ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමා -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ඒ කාරණය හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න. බරපතළ කාරණයක් ඒක.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

ඔබතුමාට ඇමැතිකම් දුන්නු හැටිත් කියනවා. ඔබතුමාගේත් අඩුපාඩු තිබෙනවා. ගරු ඇමැතිතුමා, ඒ තත්ත්වයට වැටෙන්න එපා.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මයික් ඕෆ් කරගන්න.

[සභාවේ ඝෝෂා]

ගරු විපක්ෂ නායකතුමා විතරක් නැඟී සිටින්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

වහාම හැන්සාඩ් එකෙන් ඒක ඉවත් කරන්න කියන්න.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හැන්සාඩ් එකෙන් ඉවත් කරන්න කියන්න. එතුමාගේ කථාව ඇමැතිවරයෙකුට වටින්නේ නැති කථාවක්. පහත් මට්ටමේ කථා මේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඇහුම්කන් දෙන්න.

[සභාවේ ඝෝෂා]

මූලාසනයට ඇහුම්කන් දෙන්න.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

අපි වැදගත් විධියට මෙතැන ඉන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඒක තමයි නිවැරදි කරන්න යන්නේ.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා**
Hon. U. George Perera

එතුමාගේ අඩුපාඩු හදාගන්න කියන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

හරි. ඒක තමයි නිවැරැදි කරන්න මම නිශ්ශබ්ද කළේ. ඇමැතිතුමා අතින් යම් වචනයක් කියැවුණා නම් ඒක හැන්සාඩ් එකෙන් අපි අයින් කරනවා. ඒ පිළිබඳව කනගාටුව ප්‍රකාශ කරනවා. කාලය දීර්ඝ කරන ලෙස සභා නායකතුමාගෙන් ඉල්ලා සිටිනවා.

# රීති අංක 30 යටතේ යෝජනාව
MOTION UNDER RULE NO: 30

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, "*සභාවේ වැඩ කටයුතු අවසන් වනතුරු කාලය දීර්ඝ කළ යුතු යැයි*" මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමාට, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කනගාටු වෙනවා. මම කාගෙවත් නමක් කිව්වේ නැහැ. මම නමක් කිව්වේ නැහැ. එතකොට ඒ තොප්පිය දාගෙන තොප්පිය ඕනෑ විදියට කරකෝන එක මගේ ප්‍රශ්නයක් නොවෙයි. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද විශේෂයෙන්ම කොළඹ නගරයට ගියාම අද බලන්න - අර මහරගම ගහලා තිබෙන තට්ටු නිවාස ක්‍රමය ගැන. චීනයට ගියා. චීනයට ගිහිල්ලා මේ ගොල්ලෝ බැලුවා ගහලා තිබෙන නිවාස කොහොමද දියුණු වෙලා තිබෙන්නේ කියලා. අද (බාධා කිරීමක්) සිංගප්පූරුවේ බැලුවා කොහොමද දියුණු වෙලා තිබෙන්නේ කියලා. අතිගරු ජනාධිපතිතුමා අද මේ කොළඹ නගරය ආරක්ෂක ලේකම්තුමාත් එක්ක ඒකරාශි වෙලා නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක එකතු වෙලා ගෙවල් 20,000 ක් මේ අවුරුද්දේ හදන්න කටයුතු කරනවා.

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

චීනයේ ගිහිලා ඉන්දියාව ගැන කථා කළේ.

**ගරු මෙරිල් පෙරේරා**
Hon. Meril Perera

එතුමා සාමාන්‍යයෙන් ගිය රට ගැන කථා කරන්නේ නැහැ.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගෙවල් 20,000 ක් හදලා අර මුඩුක්කුවල හිටපු අපේ සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ගංජා ගහපු, කුඩු ගහපු, කුඩු විකුණපු, හොරකම් කරපු, මංකොල්ල කාපු මේ දූෂණ ක්‍රියාවන් කරපු මිනිස්සු -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

ආ... දූප්පතුන්ගේ ඡන්ද හම්බ වෙයි.

**ගරු උපාලි කොඩිකාර** - අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

කොළඹ ආනන්ද, නාලන්ද, රෝයල් එකට දරුවන් ඇතුළත් කරන්න තමාට -

[සභාවේ ඝෝෂා]

හැට පන් ලක්ෂයක් වටින ගෙයක් රුපියල් 3400/- ගණනේ දෙන්නේ. මාසයකට රුපියල් 3400/- යි. අවුරුදු 20 කින් ගෙය අයිති වෙනවා. එක ගෙයක් හැටපන් ලක්ෂයක් වටිනවා. රජයෙන් දෙන්නේ. එතකොට මේ වාගේ අද කොළඹ නගරය විශාල සංවර්ධන ව්‍යාපෘති රාශියක්. එදා සුද්දෝ හදපු ගොඩනැගිලි ටික අද නැවත සකස් කරලා, Paint කරලා එක එක වෙළඳ පොළවල් දාලා තියෙනවා. අද හවසට බලන්න. කොළඹ ජනතාව ජීවත්වන ආකාරය. දැන් ඒවායින් ගිහිල්ලා කාලා තමයි මේකට ඇවිල්ලා බණින්නේ. මෙතුමා ගිහිල්ලා එහෙන් රැට කනවා. කාල ඇවිල්ලා මෙතැන බණිනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අද විශේෂයෙන්ම මේ කොළඹ විතරක් නොවෙයි, මුළු රට පුරාම එක වාගේ

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

නගර සංවර්ධනයක් තිබෙන්නේ. අද කොට්ටාවට ගියාම බලන්න. මංජු අපේ ගරු මන්ත්‍රීතුමාගේ හෝමාගම ආසනයේ Border එක. අද බලන්න කොට්ටාව නගරය හදන හැටි. බලන්න මහරගම නගරය. අද කුරුවිටට ගිහිල්ලා බලන්න. ඇහැලියගොඩ බලන්න. ගම්පහට ගිහිල්ලා බලන්න. අද මේ රට වටේම මහ යෝධ සංවර්ධනයක් යනවා. සංවර්ධනය කරනකොට තමයි රට තුළ -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගම්පහ කොහෙද තිබෙන්නේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ආර්ථික සංවර්ධනයක් ඇති වෙන්නේ. එහෙම නැතිව මේ කැඩිච්ච පාරේ යනකොට ගියර් එක මාරු කරන කොට, මේවාට කෑ ගහන්නේ නැහැ. එතකොට කෑගහනවා පාර හදලා නැහැ. පාරේ යන්න බැහැ. ඩීසල් ටික පිච්චෙනවා. Spare Parts ටික නරක් වෙනවා. පාර හදලා කාපට් එකේ යන කොට කියනවා අම්මෝ පාර හදලා තිබෙනවා. නමුත් යන වේගය සීමා කරන්නය කියලා. අද මේ යෝජනාව -

**ගරු රවීන්ද්‍ර යසස් කුමානායක**
Hon. Ravindra Yasas Kumanayake

පාර හදලා තිබෙනවා. හතර අතට ණය වෙනවා කියලාත් තේරෙනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා බුද්ධිමත් මන්ත්‍රීවරයෙක් හැටියට, නීතිඥ මහත්මයෙක් හැටියට මේක ආරක්ෂක ලේකම්තුමාට ශක්තියක් දෙන්න කියලා ගෙනාපු යෝජනාවක්. ඔක්කොමන්ලා කියන්නේ මොකක්ද? කොළඹ හදන්න. කොළඹ හදන්න කියලා තමයි කියන්නේ. නමුත් මේ ඉඩකඩම්ල හිටපු අය අනවසර පදිංචිකරුවෝ තමයි 90% ක්. අද රේල් පාර දෙපස ගන්න, රේල් පාර දෙපස ගත්තාම අනවසරයි. මේ දවස්වල ළමයින් ඉස්කෝලේ දා ගන්න පුළුවන්ද? බැහැ. කවුද පදිංචි කළේ? එක්සත් ජාතික පක්ෂයේ මොහොමඩ් ගරු මන්ත්‍රීතුමා එදා ප්‍රවාහන ඇමැතිවරයා හැටියට තමයි ඔක්කෝම පදිංචි කළේ. අර මුඩුක්කුවල පදිංචි කළා. දැන් ඒවා ඉවත් කරනකොට තමයි මේ ප්‍රශ්නය තිබෙන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම මීට වැඩිය කාලය ගන්න යන්නේ නැහැ. ඩී.ඒ. රාජපක්ෂ මැතිතුමා මේ වාගේ පවුලක් අපට දායාද කරපු එක ගැන මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා, ආර්ථික කටයුතු ඇමැති වශයෙන් බැසිල් රාජපක්ෂ මැතිතුමා, ආරක්ෂක ලේකම් වශයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාට මොන පවුලද දායද කළේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේ වාගේ පවුලක් මේ රටට බිහි කරපු එක ගැන අපේ ගෞරවනීය ස්තුතිය ඉස්සෙල්ලාම එතුමාට පුද කරන්න ඕනෑ. ඒ වාගේම ජනාධිපති මහින්ද රාජපක්ෂ මැතිතුමා කරන මේ රටේ මහා යෝධ සංවර්ධනයට භය වෙලා තමයි අද එක්සත් ජාතික පක්ෂය -

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොඩිකාර පවුලේ ස්තුතිය.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ජනතා විමුක්ති පෙරමුණ එදා මේ රටේ කරපු භීෂණය - මොකද මේ අයට ආයේ ගිණි තියන්න, බත් පැකට් එකක් දීලා පෙළපාලියට ගෙනි යන්න, අරක්කු බෝතලයක් දීලා කැන්වසින් ගෙනි යන්න මිනිස්සු නැති වන කොට තමයි කොළඹ -

**ගරු මහින්ද ජයසිංහ**
Hon. Mahinda Jayasinghe

ගරු නියෝජ්‍ය සභාපතිතුමා, දැන් විනාඩි දෙක නොවෙයි, දහයක් විතර ගියා නේ?

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථාව අවසන් කරන්න.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ නිසා මෙතුමාගේ ගෙනෙන ලද යෝජනාව අපේ තුළින් ආරක්ෂක ලේකම්තුමාට තවත් ශක්තියක් වෙලා රට සංවර්ධනය කරගන්න ශක්තිය, ධෛර්යය ලැබේවා කියන ප්‍රාර්ථනය කරනවා. මේ පනත මීටත් වඩා ශක්තිමත් වෙන්න කියලා නාගරික සංවර්ධන අධිකාරියේ අපේ නිලධාරීන්ට අපේ ස්තුතිය මේ අවස්ථාවේදී පුද කරනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

සාධු ! සාධු! සාධු!

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

පිළිතුරු කථාව වශයෙන් සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමාට මම විනාඩි දෙකක කාලයක් ලබා දෙනවා.

[අ.භා. 01.34]

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විනාඩි දෙකක කාලයක් නම් මදි වෙයි. පිළිතුරු දෙන්න වෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ විවාදයේදී මතු වුණු එක කාරණයක් තමයි විශේෂයෙන්ම මේ ඉවත් කරන ගොඩනැගිලි ව්‍යාපාරික ස්ථාන, නිවාස වෙන්න පුළුවන්. ඒවා සියල්ල අනවසර ස්ථාන කීම. එතකොට ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, විශේෂයෙන්ම මම ආණ්ඩු පක්ෂයේ කථිකයින්ගෙන් අහනවා, අපි ගත්තොත් වනාතමුල්ලේ 34වත්තේ - කළුතර අබේගුණවර්ධන සහෝදර ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ අවුරුදු 15 කට අධික කාලයක් තිස්සේ ඔවුන් වෙළඳාම් කළා. එතකොට මේ සියල්ල පොදුවේ ගත්තාට පස්සේ ඔවුන්ගේ ස්ථානය අනවසරයි. හැබැයි ඔවුන්ගේ ඡන්දය නීත්‍යානුකූලයි. අවුරුදු 50 ක්, 60 ක් තිස්සේ පදිංචි මිනිස්සුන්ගේ නිවස තමයි මේ ඉවත් කරන්නේ. ඔවුන්ගේ ඡන්දය නීත්‍යානුකූලයි. ඔවුන් ගෙවන Tax එක නීත්‍යානුකූලයි. ඒක භාර ගන්නවා. හැබැයි, අර කඩන්න ඕනෑ වුණාට පස්සේ ඒක අනවසර තත්ත්වයක් ඇති කරලා තිබෙනවා. එතකොට විශේෂයෙන් අබේගුණවර්ධන ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඉතාම නීත්‍යානුකූල තත්ත්වයක් අනුගමනය කරලා තමයි කළුතර ඉවත් කිරීම් කළේ කියලා.

විශේෂයෙන්ම ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වනාතමුල්ලේ,34 වත්තේ, 188 වත්තේ, කොටා රෝඩ් එකේ බේකරි වත්තේ. ඔය කළුතර. ඔය කියන ප්‍රදේශවල අඩුම තරමින් ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරි පනතේ 28 (1) අ යන්නවත් අනුගමනය කරලා නොවෙයි, ඒ කියන්නේ අඩුම තරමින් Notice එකක් දීලා නොවෙයි ඉවත් කර තිබෙන්නේ. ඊට අදාළ Notice එකක් දීලා මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් පවරලා තමයි ඔවුන්ට ඉවත් කිරීමේ කටයුත්ත කරන්න ඕනෑ. ඒ නිසා නීත්‍යානුකූල ඉවත් කළයි කියන තර්කය කිසිසේත්ම පිළිගන්න බැහැ, ගරු සභාපතිතුමනි.

ඊට අමතරව සුසාර දිනාල් ගරු මන්ත්‍රීතුමා එක්තරා ප්‍රවේශයකට ආවා. මේ කොල්ලුපිටිය ප්‍රදේශයේ එතුමා සිටියේ. ඉස්කෝලේ ගියේ කෝල්ලුපිටියේ කියලා. දුප්පතුන් සම්බන්ධයෙන් මහ නරක චිත්‍රයක් ඒ කොල්ලුපිටිය ප්‍රදේශයේ තමන් දැකපු දර්ශනය පිළිබඳව පැහැදිලි කළා. මම ඔබතුමාට කියනවා. කොල්ලුපිටිය ස්ටේෂන් වත්ත ඔබතුමා දන්නවාද? ඒ ස්ටේෂන් වත්ත දැන් ඔන්න නාගරික සංවර්ධන අධිකාරියෙන් කඩන්න නියම වෙලා තිබෙනවා. මේ ස්ටේෂන් වත්ත පර්චස් 12 1/2 යි. හරියට කොල්ලුපිටිය හන්දියත් එක්ක තිබෙන්නේ. මේක ඉල්ලන්නේ ධම්මික පෙරේරා මහත්මයාට බදු දෙන්න. අර අහිංසක මිනිස්සුන්ට යන්න කියලා කියන්නේ ඒකයි. කොල්ලුපිටිය. කොල්ලුපිටිය තමුන්නාන්සේ කියන දුප්පතුන්ගේ ඔය කියන තත්ත්වය නැහැ. ඒක නිසා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඔබතුමාගේ පිළිතුරු කථාව අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, පොදුවේ ගත්තොත් මේ ගෙනි යන්නේ කොල්ලකාරී ආර්ථිකයක්. කොල්ලකාරී ආර්ථිකයට පාවඩ හදන්න තමයි මේ අදාළ ඉදි කිරීම් ඉවත් කරන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මෙතැනදී ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ මිනිස්සු බුලත්විට විකුණගෙන, ඉදිආප්ප විකුණගෙන, රොටිය විකුණගෙන ජීවත් වන්නේ. ඒ මිනිස්සුන්ව අර දෙන කුකුල් කූඩුවලට, උරු කොටුවලට කොටු කරනවා. කොටු කළාට පස්සේ මේ ස්වයං රැකියාවත් කඩා වැටෙනවා. අපි ආණ්ඩු පක්ෂයේ ගරු මන්ත්‍රීවරුන්ගෙන් අහනවා. ඔවුන්ගේ ජීවන තත්ත්වයට, ඔවුන්ගේ යැපෙන්නන්ට වග කියන්නේ කවුද කියලා.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, උපුල් මහේන්ද්‍ර රාජපක්ෂ මැතිතුමා ලස්සන කථාවක් කිව්වා. මේකෙන් මගේ කථාව අවසන් කරනවා. ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, එතුමා කිව්වා නාගරික සංවර්ධන අධිකාරිය කටයුතු කරන්නේ මුවන්පැලැස්සේ කදිරා වාගෙයි නොවෙයි කියලා. හැබැයි, ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, අපි දවස් දෙකකට ඉස්සෙල්ලා ඕල්කට් මාවතේ කඩ ඉවත් කරපු හැටි දැක්කේ මුවන් පැලැස්සේ කදිරා වගේ නොවෙයි. කුලප්පු වෙච්ච මී හරකෙක් විධියට තමයි නාගරික සංවර්ධන අධිකාරිය ඔය කියන ඕල්කට් මාවතේ කටයුතු කළේ. ඒ නිසා මේ රටේ නීතිය පැත්තකට දාලා, සදාචාරය පැත්තකට දාලා ජීවන තත්ත්වය පැත්තකට දාලා තමයි කටයුතු කළේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. ඒ අනුව ගරු නියොජ්‍ය සභාපතිතුමනි, මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය පල්ලෙහාට දාලා මේ කරන සංවර්ධනයේ හරය මොකක්ද කියලා හෘද සාක්ෂියට එකඟව මීට අදාළ මන්ත්‍රීවරුන්ගෙන් මම ප්‍රශ්න කරනවා. අවසාන වශයෙන් ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ පාදඩ කොල්ලකාරී ආර්ථිකයට පාවඩ හදන්න මේ අහිංසක දුප්පත් - අන්න මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා කිව්වා. 70% ක් කොළඹ නගරයේ ස්වයං රැකියා කරලා එදා වේල හරි හම්බ කරන් කන මිනිස්සු. අන්න වනාතමුල්ලේ අර තිබෙන අඩි 200 කොටුවකට කොටු කරනවා ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේක අතිශය වැරැදියි. මිනිස්සුන්ගේ ජීවන තත්ත්වය කඩා වැටිලා. පසුගිය 2014 ජූලි මාසේ 31 වැනිදා වන කොට හතර දෙනෙකුගෙන් යුත් පවුලකට ජීවත් වෙන්න රුපියල් 51,296/- ක් අවශ්‍යයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි. මේ ඉවත් කරන මිනිස්සු ජීවත්වන තත්ත්වය මේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු විස්තර කරලා දෙන්න කියන ප්‍රශ්නය මේ සභාවට යොමු කරනවා. නීතිය පැත්තකට දාලා මේ කරන වැඩ අතිශය අපි හෙලා දකිනවා. වගකිවයුතු බලධාරීන් වෙත මේ යෝජනාව යොමු කරන්නය කියන ඉල්ලීම තමුන්නාන්සේගෙන් කරනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා, සභාවට ඉදිරිපත් කරපු යෝජනාව පිළිබඳව බෙදීමක් තිබෙනවාද ගරු විපක්ෂ නායකතුමා?

**ගරු සිසිර ජයකොඩි -** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායකතුමා
Hon. Sisira Jayakody - Chief Government Whip

බෙදීමක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සීනුව නාද කරන්න.

***ප්‍රශ්නය විමසන ලදින් 61 (3) රීතිය යටතේ පළාත් සභාව පක්ෂව 24 යි, විරුද්ධව 32 යි, වැළකුණු 00 යි යනුවෙන් බෙදුණේය.***
*Question put and the Council divided as per Rule No 61 (3), 24 for, 32 against and 00 decliners.*

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

ඒ කියන්නේ ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, රටේ නීතිය -

**ගරු ශ්‍රීනාත් ම. පෙරේරා**
Hon. Srinath M. Perera

ඒ කියන්නේ නීතිය කඩපන් කියන එක. මට ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ව තේරුම් ගන්න පුළුවන්. හැබැයි මේ වාමාංශිකයෝ කියලා කට්ටියක් ඉන්නවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

මීළඟට ගරු මන්ත්‍රීතුමන්ලාට, විනාඩි 15 ක වාගේ බොහොම ඉතා කෙටි කාලයක් තබෙන්නේ.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම රීති සම්බන්ධයෙන් කෙටි පැහැදිලි කිරීමක් බලාපොරොත්තු වන්නේ. මේ යෝජනාව සම්මත වීම හෝ සම්මත නොවීම නොවෙයි ගැටලුව වෙලා තිබෙන්නේ. මේ පරාද වෙලා තිබෙන්නේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව මගින් රටේ නීති ස්ථාපිත වීමයි. ඒ පිළිබඳව ලොකු ගැටලුවක් තිබෙනවා. රටේ නීති සම්බන්ධව අභියෝගයට පත් වෙලා තිබෙන්නේ.

[සභාවේ ඝෝෂා]

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දෙවැනි පෞද්ගලික මන්ත්‍රී යෝජනාව -

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

ඔබතුමන්ලා මේ රටේ නීතිය පරාද කරලා තිබෙන්නේ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

අපි මේ රටේ නීතිය අනුගමනය කරන්න කියලා ඉල්ලන්නේ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

යෝජනාව මොකක්ද කියලා දන්නේ නැහැ.

**ගරු අශෝක සපුමල් රන්වල**
Hon. Asoka Sapumal Ranwala

මේ සභාවට එහෙම බලය නැහැ.

**ගරු සුනිල් වටගල**
Hon. Sunil Watagala

මේ රටේ නීතිය ක්‍රියාත්මක කරන්නය කියලා මේ යෝජනාවෙන් කියන්නේ. අයියෝ මේ වාගේ

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී. ]***
*[Expunged on the order of the chair]*

ටිකක් මේක දන්නේ නැහැ.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමා, වාඩි වෙන්න. ගරු මන්ත්‍රීතුමන්ලා ඔබතුමන්ලා මේ යෝජනාව ගැන නැවත කථා කරන්න එපා. ඒ ගැන ඡන්දය විමසලා ඉවරයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ඉතාමත් කෙටි වේලාවක් තිබෙන්නේ සභාව අවසන් වෙන්න. ඒ අනුව -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

36(1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

දැන් දෙන්න කාලය මදී. දෙවැනි පෞද්ගලික මන්ත්‍රී යෝජනාව විවාදයට ගන්න ප්‍රමාණවත් කාලසීමාවක් නැහැ. දෙවැනි පෞද්ගලික මන්ත්‍රී යෝජනාව අපි ඊළඟ න්‍යාය පත්‍රයට ඇතුළත් කරනවා. ඊළඟට සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව එනම්, රීති අංක 31(ආ) යටතේ යෝජනාව ඉදිරිපත් කරන ලෙස ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට මම ආරධනා කරනවා. ඒ සඳහා විනාඩි 05 ක කාලයක් එතුමාට ලබා දෙනවා.

# 31(ආ) යටතේ යෝජනාව
MOTION UNDER 31(B)

[අ.භා. 01.48]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, කාර්ය පටිපාටි රීති අංක 31(ආ) යටතේ සභාව කල් තබන අවස්ථාවේ යෝජනාව මම ඉදිරිපත් කරනවා.

*"බස්නාහිර පළාත් සභාව යටතේ පවතින රෝහල් දිස්ත්‍රික් රෝහල, මූලික රෝහල ලෙස නාමකරණයන් පැවැතියද*

[ ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි ]

*එකී රෝහල්වල ඇති නාමකරණ පිළිබඳව අවධානයක් යොමු නොකරන සාමාන්‍ය ජනතාව රෝහලකින් සම්පූර්ණ විය යුතු හදිසි සේවාවන් බලාපොරොත්තු වේ. එහෙත් තමන් බලාපොරොත්තු වූ සේවාව ඉටු නොවීමෙන් රෝගී තත්ත්වයන් උත්සන්න තත්ත්වයට පත්ව අවශ්‍ය ප්‍රතිකාර අහිමි වීමෙන් වටිනා ජීවිත අහිමි වූ අවස්ථාද වේ.*

1. *රෝහලක් ලෙස හදිසි රෝගී අවස්ථාවන්ට මුහුණ දීමට හැකි තත්ත්වයෙන් සෑම රෝහලකටම තිබිය යුතු අත්‍යවශ්‍ය සේවාවන් සම්පූර්ණ කිරීමට පළාත් සභාව කටයුතු කළ යුතුය.*
2. *ඒවා සම්පූර්ණ කිරීමට තවදුරටත් අපොහොසත් නම් එවැනි අත්‍යවශ්‍ය සේවාවන් රෝහල තුළ නොමැති බවට ජනතාවට දැන ගැනීමට දැනුවත් කළ යුතුය.* ”

යන්න යෝජනා කර සිටිමි.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මේ යෝජනාව ගෙනෙන්නේ, ඇත්තටම රෝහලකට ගිහිල්ලා ප්‍රතිකාර ගන්න යන ජනතාව බලන්නේ නැහැ, මේ රෝහලේ බෝඩ් එක මොකක්ද කියලා. ඒ අය බලාපොරොත්තු වන්නේ මේ රෝහලෙන්, රෝහලකින් ලැබෙන්න ඕනෑ දේවල් ලැබෙනවාද කියලා. එහෙම බලාපොරොත්තුවකින් තමයි ඒ ගොල්ලෝ ගිහිල්ලා මේවායේ ප්‍රතිකාර ගන්න නේවාසික වෙන්නේ. නමුත් වෙන්නේ රෝහලක නතර වෙන කෙනෙකුට අවශ්‍ය මූලික පහසුකම්වත් මේ බොහෝ රෝහල්වල නැහැ. දැන් උදාහරණයක් හැටියට ගත්තොත් එහෙම සමහර රෝහල්වල ECG යන්ත්‍රය නැහැ. ECG යන්ත්‍ර සමහර වෙලාවට එකක් තිබෙනවා. ඒක කැඩිලා. එතකොට ඒක අර රෝගියා දන්නේ නැහැ. ඒ වාගේම තමයි ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, සමහර තැන්වල ECG යන්ත්‍රය තිබෙනවා. ඒකට කොළේ නැහැ. මෙන්න මේ වාගේ තත්ත්වයක් තිබෙන්නේ. ඒ නිසා මේ මොහොත වන විටත් මම ගරු ඇමැතිතුමාට කියනවා, මාස තුනක සිට දැනට ප්‍රතිජීවක ඖෂධ, අර ළමයින්ට දෙන සිරප් එක නැහැ. කිසිම රෝහලක. මූලික රෝහල්වලත් නැහැ. අනික් රෝහල්වලත් නැහැ. අවිස්සාවෙල්ල මූලික රෝහල, හෝමගම මූලික රෝහල, වෑතර දිස්ත්‍රික් රෝහල ඉඳන් මේ හැම රෝහලකම තත්ත්වය එහෙමයි. ඒ වාගේම තමයි මේ මොහොත වන විට ගැස්ට්‍රයිටීස්වලට දෙන ඖෂධ නැහැ. ඒ වාගේම අර ළමයින්ට වමනෙට දෙන ඒ සිරප් එක නැහැ. මෙන්න මේ තත්ත්වය තමයි තිබෙන්නේ. ඒ වාගේම තමයි ගිලන්රථ පහසුකම නැහැ. මට බොහොම කෙටි කාලයක් තිබෙන නිසා ඉක්මණින්ම මේ ටික කියන්නේ. ඒක නිසා මේකට මුහුණදෙන හෘද රෝගීන් පත්වන තත්ත්වය, ඒ හෘද රෝගීන්ගේ පවුල්වල මිනිස්සු පත්වන තත්ත්වය, ජනතාව පත්වන තත්ත්වය ඉතාමත්ම කනගාටුදායකයි. මම දැනුවත්ව මේ මොහොතවන විට බොහොම කෙටි කාලයක් තුළ වෑතර ඉස්පිරිතාලෙට ගිහිල්ලා නතර වුණු හෘද රෝගීන් තුන්දෙනෙක් ඒ අවශ්‍ය පහසුකම් නැති නිසා ඔවුන්ගේ ජීවිත අහිමි වුණා. වචනයට කියනවා, රැකගත යුතු සම්පත මානව සම්පත කියලා. නමුත් ඒ සම්පත සම්බන්ධව තුට්ටුවකටවත් සලකන්නේ නැති ආකාරයක් මේවායේ තිබෙන්නේ.

ඒ නිසා ඇත්තටම මේ යෝජනාව දාන්න ඕනෑ, මේ පහසුකම් නැති රෝහල් ඇත්තටම ඒ රෝහල කියන නාමය සහිත බෝඩ් එක ඉවත් කරන්න කියලා. අපි දන්නවා, ඉස්සර ඩිස්පැන්සරි කියලා තිබෙනවා. එතකොට ඩිස්පැන්සරියක් කියලා තිබෙනවා නම් අර රෝගීන් දන්නවා මේක ඩිස්පැන්සරියක්. මේකේ නතර වුණාට වැඩක් නැහැ. දැන් ඔය සමහර රෝහල් ඇත්තටම රෝහල් බවට පත් වෙලා තිබෙන්නේ - අපි දන්නවා, කාත් එක්ක හරි මොකක් හරි ආරවුලක් ඇති වුණාට පස්සේ පොලිසියේ නීතිය ක්‍රියාත්මක කරලා අර අනික් කෙනාව අත්අඩංගුවට ගන්නකොට රෝහලේ නතර වෙනවා. ඒ සමහර රෝහල් අන්න ඒ තත්ත්වයට තමයි පත් වෙලා තිබෙන්නේ. ඒ නිසා ගරු ඇමැතිතුමාට විශේෂයෙන්ම මේ සම්බන්ධව කියන්නේ මේ අවශ්‍ය පහසුකම් දෙන්න. මේ යෝජනාවෙන් කියන්නේ මේවා වහලා දාන්න කියන එක නොවෙයි. මේ කියන්නේ, රෝහලකට අවශ්‍ය සියලු පහසුකම් දෙන්න. ඒ අත්‍යවශ්‍ය පහසුකම් දෙන්න. මේ රෝහල්වල නතර වෙන මිනිස්සුන්ගේ ජීවිත අහිමි කරන තත්ත්වයකට පත් කරන්න එපා. ඒ නිසා මම දැනුවත්ව මගෙත් ඥාතියෙක් වෙන කෙනෙක් මේ ළඟදී පිළියන්දල රෝහලේ නතර වුණා. එයා හෘද රෝගියෙක්. මේ හෘද රෝගියෙක් කියලා රෝහල දැනුවත් කරලා තිබුණා. ඒ ගොල්ලෝ කිව්වා ගැස්ට්‍රයිටීස් කියලා. පාන්දර 1 1/2 වෙන කොට හාට් ඇටෑක්වලට ආවා. නමුත් කළුබෝවිල රෝහලට යනකොට වේලාව මදී. දොස්තරලාගේ වැරැද්ද නොවෙයි. රෝහලේ පහසුකම් සම්බන්ධ ප්‍රශ්නය. මෙන්න මේ කාරණය දැනුවත් කරලා

මේ සම්බන්ධව අවශ්‍ය පියවර ගැනීම සඳහා තමයි මා මේ යෝජනාව ඉදිරිපත් කරන්නේ. ඔබතුමාට ස්තුතියි.

[අ.භා. 01.53]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, බොහොම ස්තුතියි. විශේෂයෙන්ම අපේ ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාවට අදාළව ඉතාම අත්‍යවශ්‍ය කරුණු ගණනාවක් මට ඔබතුමා මාර්ගයෙන් අපේ ගරු සෞඛ්‍ය ඇමැතිතුමා දැනුවත් කරන්න ඕනෑ. කොළඹ නගරයේ තිබෙන, විශේෂයෙන්ම මැද කොළඹ මැතිවරණ කොට්ඨාශයේ තිබෙනවා, ප්‍රේමදාස අනුස්මරණ රෝහල. ඒක බස්නාහිර පළාත් සභාවට අයිති රෝහලක්. අපේ හිටපු සෞඛ්‍ය ගරු ඇමැතිතුමාත් දන්නවා. හිටපු ඇමැතිතුමා යම් යම් දේවල්වලට මැදිහත් වුණා. නමුත් නැවත වතාවක් ඒ රෝහලේ කටයුතු ඉතාමත්ම අඩාල වෙමින් පවතිනවා. බෙහෙත් වර්ග ගැන. ඒ වාගේම ඒකේ මැටිනිටි වාට්ටුවක් තිබුණා. ඒකත් දැන් වහලා දාලා තිබෙනවා. ඒ වාගේම අනික් කාරණාව තමයි එහි තිබෙන යන්ත්‍ර සූත්‍ර සමහර දේවල් වෙනත් ප්‍රදේශවලට ගෙනියන්න, මාරු කරන්න පළාත් අධ්‍යක්ෂකතුමා උපදෙස් දීලා තිබෙනවා. ඒ කාරණා උඩ මම ඉල්ලා සිටින්නේ, විශේෂයෙන්ම දැන් ඒ ප්‍රදේශයේ ජනතාවට කොළඹ මහ රෝහල ඇරුණාම ඒ නගරයේ තුළ මේ රෝහල පමණයි තිබෙන්නේ, රජයේ රෝහලකට ගිහිල්ලා බෙහෙත් ගන්න. එතකොට මේක ලක්ෂ දෙකක, තුනක ජනතාවක් නියෝජනය කරන ප්‍රදේශයක තිබෙන රෝහලක්.

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, දැන් කථාවක් තිබෙනවා. මම දන්නේ නැහැ. ගරු සෞඛ්‍ය ඇමැතිතුමා මේකට පිළිතුරක් දිය යුතුයි. පළාත් අධ්‍යක්ෂතුමා දැනුම් දීලා තිබෙනවා කියලා මේ රෝහල නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙලා මේක අර්ධ පෞද්ගලීකරණ රෝහලක් බවට පත් කරන්න යනවා කියලා. එහෙම කථාවක් රෝහල තුළ සාකච්ඡා වෙමින් පවතිනවා. ඉතින් මේ පිළිබඳ නිවැරැදිතාවය, මේ කථාව පිළිබඳ සත්‍යතාවයක් තිබෙනවාද? මැද කොළඹ ප්‍රේමදාස අනුස්මරණ රෝහලේ. ඒ තත්ත්වය පිළිබඳව යම්කිසි දැනුවත් කිරීමක් කරන්නය කියලා ඉල්ලා සිටිනවා.

[අ.භා. 01.55]

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

මම ඉතාමත් සන්තෝෂ වෙනවා, අපේ ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා මීට පෙරත් අපේ පළාත් සභාවේ සිටියා. බොහොම හොඳට කරුණු ඉදිරිපත් කරපු මන්ත්‍රීවරයෙක්. වත්මන් සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට බස්නාහිර පළාත් සභාවේ මේ වාගේ අඩුපාඩු තමන්ට දකින දේ, හැඟෙන දේ මට ඉදිරිපත් කිරීම සම්බන්ධව විශේෂ ස්තුතියක් පිරිනමනවා. සභාවට ඉදිරිපත් කළත් භාර ගන්නවා. පුද්ගලිකව මට කරුණු ඉදිරිපත් කළත් භාර ගන්නවා. මගේ උපදේශක කාරක සභාව පැවැත්වෙන දවසට සුනිල් වටගල ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන් පැමිණිලා සහභාගී වෙනවා නම් මම බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා. ජනතා විමුක්ති පෙරමුණ වෙනුවෙන් නලින්ද ජයතිස්ස ගරු මන්ත්‍රීතුමා විශේෂ සහභාගීත්වයක් තිබෙනවා. ඉතින් එතුමා කියන දේවල්වලින් එතුමා වාගේ පළපුරුදු මන්ත්‍රීවරයෙකුට අදාළ නොවන වචන දෙක තුනකුත් පාවිච්චි වුණා. මම ඒ ගැන කනගාටු වෙනවා. මේ පහසුකම් නැත්නම් ඕකේ ඩිස්පැන්සරි කියලා ගහන්න කිව්වා. එහෙම එකක් නම් නැහැ. අපි බොහොම අවංකව කියන්න ඕනෑ. ලංකාවේ විවිධ විධියට දැන් රෝගකාරක තත්ත්වයන් වැඩි වෙමින් තිබෙනවා. දැන් මේ දවස්වල මීගමුව පැත්තෙන් පාත් වෙනවා, Airport එකෙන්. අපි ලොකු Security එකක් දීලා තිබෙනවා. ඉබෝලා වෛරසයයි. මේක ලෝකේ තිබෙන දෙයක්. බෝ නොවන රෝගකාරක තත්ත්වයන් දැන් වැඩියි. ඒ නිසා අපි සූදානම් වෙනවා. දවසින් දවස අලුත්වන සේවාවක් තමයි සෞඛ්‍ය සේවාව. ඉතින් මම මතක් කරන්නට ඕනෑ, වෙනදාට වැඩිය ගරු මන්ත්‍රීතුමනි හොඳ සේවාවක් බස්නාහිර පළාතෙන් අපි ලබා දීලා තිබෙනවා.

ඔබතුමා සඳහන් කරලා තිබෙන එක කාරණාවක් ගැන මම බොහොම සන්තෝෂයි. මෙහි තිබෙනවා, රෝහලක් ලෙස හදිසි අවශ්‍යතාවයන්ට මුහුණ දීමට හැකි තත්ත්වයෙන් සෑම රෝහලකටම තිබිය යුතු අත්‍යවශ්‍ය සේවාවන් සම්පූර්ණ කිරීමට පළාත් සභාව කටයුතු කළ යුතුයි කියලා. හදිසි රෝගී අවස්ථාවට මුහුණ දීමට හැකි තත්ත්වයෙන්. මේකට අපි සඳහන් කරන්නේ, හදිසි ප්‍රතිකාර ඒකක කියන කාරණාව තමයි. ETU කියන කාරණාව තමයි මම හිතන්නේ ඔබතුමාත්, අපිත් විශ්වාස කරනවා ඇත්තේ. ඉතින් ඒ නිසාවෙන් අද ග්‍රාමීය ප්‍රදේශවල රෝහල්

[ ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා ]

තිබෙනවා. බස්නාහිර පළාත් සභාවේ මූලික රෝහල්, දිස්ත්‍රික් මහ රෝහල්, දිස්ත්‍රික් රෝහල්, පර්යන්ත රෝහල්, ග්‍රාමීය රෝහල්, ගම් මට්ටමේ තිබෙන ඔය CD කියන මධ්‍යම බෙහෙත්ශාලා ආදී වශයෙන් විශාල ප්‍රමාණයක් තිබෙනවා. අපි හැම ගමකම තිබෙන පොඩි රෝහලකම පවා ETU එකක්, හදිසි ප්‍රතිකාර ඒකකයක් ඇති කරලා තිබෙනවා. ඉතින් එතුමා කිව්වා වාගේම, මම මේ එතුමාගේ සහයෝගයට කථා කරන්නේ. ඒවායේ තිබෙන X-ray යන්ත්‍ර, Scan යන්ත්‍ර වාගේ ඒවා කැඩිලා තිබෙනවා වෙන්න පුළුවන්. මම නැහැයි කියන්නේ නැහැ.

හැබැයි, මම සන්තෝෂයි. මට ඔබතුමාගේ අදහස් මගේ ෆැක්ස් යන්ත්‍රයට දානවා නම් හොඳයි. ඒවා සම්පූර්ණ කරන්න තමයි සෞඛ්‍ය ඇමැතිවරයා හැටියට මම ඉන්නේ. හැබැයි, මම කියන්නට ඕනෑ, වෙනදට වැඩියෙන් හැම රෝහලකම අපි මේ තත්ත්වය වැඩි දියුණු කරලා තිබෙනවා. විශේෂයෙන් රාත්‍රී කාලයට තමයි මේක වැඩියෙන් බලපාන්නේ. ග්‍රාමීය ප්‍රදේශවල. ඒ හදිසි ප්‍රතිකාර, ස්වසන තත්ත්වයන්, හෘද රෝග තත්ත්වයන්, වෙනත් අපහසුතාවයන් ගොදුරු වුණු අය හදිසියේ ආවාම තාවකාලික ප්‍රතිකාර වැඩ පිළිවෙළක් තමයි හදිසි ප්‍රතිකාර ඒකකවල තිබෙන්නේ. අපි එවලේ රාත්‍රි කාලයේ සිටිය යුතු වෛද්‍යවරයෙක් තියලා තිබෙනවා. හෙද කාර්ය මණ්ඩලයක් තියලා තිබෙනවා. ඇම්බියුලන්ස් රථය සූදානම් කරලා තිබෙනවා. අද අපේ සෑම රෝහලකටම අපි අලුත් ඇම්බියුලන්ස් රථ දීලා තිබෙනවා. අපේ හිටපු ගරු ඇමැතිතුමාත් දන්නවා. එතුමා ඉන්න කාලයේ අපට ඇම්බියුලන්ස් රථ ගොඩක් දුන්නා. මම මේ ළඟදී ඇම්බියුලන්ස් රථ සියල්ලම එකතු කරලා බැලුවා. ඇම්බියුලන්ස් රථ පැරණි ඒවාත් මම එකතු කළා. දැන් තැන් තැන්වල මඳුවැල් ගිය ඇම්බියුලන්ස් රථ කිහිපයක් තිබෙනවා. මම එකතු කරලා බැලුවා. ගරු මන්ත්‍රීතුමනි, මම බලාපොරොත්තු වෙනවා ඇම්බියුලන්ස් රථ අලුත් වැඩියා කරන්න. කිහිපයක් පුළුවන්. අලුත්වැඩියා කරලා නැති ඒවා වෙන්දේසි ක්‍රමයක් - මම දන්නේ නැහැ, අමාත්‍යාංශයේ තිබෙනවා. මේවා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

තව විනාඩියකින් අවසන් කරන්න උත්සාහ කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කථා කරන්න ඕනෑ. ගරු මන්ත්‍රීතුමා, ඔබතුමා කැමැතිද ඊළඟ සභාවට මේ යෝජනාව දාන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

කථා කරන්න.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඔබතුමා කැමැතිද මම විනාඩි 05 ක්, 06 ක් කථා කරනවාට. ඔබතුමාගේ කැමැත්ත මට වැඩියෙන් වැදගත් වන්නේ. එතුමා පුළුවන් කියනවා. ඒ නිසාවෙන් හැම රෝහලකම අපි -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, ප.ව. 02.00 ට සභාව අවසන් කරන්න වෙනවා.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

වැතර රෝහලේ ප්‍රධාන වෛද්‍ය නිලධාරීතුමාගේ නම වෛද්‍ය ධම්මික හේරත්. ඉතාම දක්ෂ වෛද්‍යවරයෙක්. මගේ බල ප්‍රදේශයේ පිඹුර රෝහල වැහෙන්න යන වේලාවේ - බොහොම හොඳ වෛද්‍යවරයෙක්. මම දැන් එතුමාට දුරකථන ඇමතුමක් දීලා ඇහුවා. මේ මෑත මාසය හමාර තුළ හෘද රෝගීන් කීදෙනෙක් මිය ගිහිල්ලා තිබෙනවාද කියලා. එක්කෙනෙක්වත් මැරිලා නැහැ. මේ දැන් ඇහුවා නේ? ධම්මිකා හේරත් මහතා මට හොඳයි කියලා කියන්න පුළුවන්. මම මන්ත්‍රීවරයෙක් හැටියට අවුරුදු 20 ගණනක් ඉන්න මිනිහෙක්.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඕකම තමයි ප්‍රශ්නය.

**ගරු රංජිත් සෝමවංශ** - අමාත්‍යතුමා
Hon. Ranjith Somawansha - Minister

ඉෆ්තිකාර් ගරු මන්ත්‍රීතුමා කන්න නැත්නම් අර එළුවන්ගේ මේවා එක දෙන්න කෝ අපට බෙදලා. අර මොකක්ද තිබුණායි කිව්වේ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

මම වගකීමෙන් කියන්නේ. ඔබතුමා දැන් එනවාද මේ සභාව ඉවර වෙලා මාත් එක්ක මේ ගෙවල් තුනට යන්න.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම වෙනුවට ගාමිණී තිලකසිරි ගරු සභා නායකතුමා යොමු කරනවා.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

ගරු මන්ත්‍රීතුමා, හෝමගම රෝහල නිසා මම -

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

හෝමගම නොවෙයි. වැතර.

**ගරු ගාමිණී තිලකසිරි - සභානායකතුමා**
Hon. Gamini Thilakasiri - Leader of the House

වැතර කියන්නේ හෝමගම මැතිවරණ කොට්ඨාශය නේ. එක් අයෙක්වත් මළේ නැහැයි කියලා දැන් කිව්වා. මම දන්නේ නැහැ, එතුමා ඇත්තක් කිව්වද? බොරුවක් කිව්වද? කියන එක.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

සලෝචන ගමගේ, අපේ තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමන්ලා එක්ක මම වැතර රෝහලට ගියා.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ගරු ඇමැතිතුමා, මම හිතනවා මේ යෝජනාව පිළිබඳව -

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මේක යෝජනාවක් ලෙස ලබන සභාවට දාන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම හොඳ යෝජනාවක්. මම ගරු ඇමැතිතුමාට මතක් කර සිටිනවා, ලබන සභා වාරයේ අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ යටතේ මේ පිළිබඳව අපි විශේෂ අවස්ථාවක්, වේලාවක් ලබා දෙනවා.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මට එක විනාඩියක් දෙන්න. ස්තුතියක් කරන්න ඕනෑ. ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමාට ඉතා බෙහෙවින්ම ස්තුතිවන්ත වෙනවා, සෞඛ්‍ය සේවාවේ අඩුපාඩු පිළිබඳව දැනුවත් කිරීම සම්බන්ධව. ඒ වාගේම මම බලාපොරොත්තු වෙනවා, ඉදිරියේදීත් මාව දැනුවත් කරයි. මාව දිරිමත් කරයි. යථාර්ථය අවබෝධ කරගෙන අපත් එක්ක සෞඛ්‍ය සේවාවේ දියුණුවට වැඩ කටයුතු කරයි කියලා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

ලක්ෂ්මන් නිපුණ ආරච්චි ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට විනාඩියක් දෙන්නද? කාලය අවසන් වෙලා තිබෙන්නේ.

[අ.භා. 02.00]

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, මම කියන්න ඕනෑ මම මේ මදි පුංචිකමක් කරන්න මේ යෝජනාව ගෙනාවා නොවෙයි. ඩිස්පැන්සරි කථාව කිව්වේ ඇත්තටම මිනිස්සු මැරෙන එක නතර කරගන්න ගරු ඇමැතිතුමා. මොකද, ඒ මිනිස්සු දන්නවා මේක රෝහලක් නොවෙයි.

**ගරු රංජිත් සෝමවංශ - අමාත්‍යතුමා**
Hon. Ranjith Somawansha - Minister

මම ඔබතුමා ගැන වැරදි වැටහීමක් කර ගත්තේ නැහැ.

**ගරු ලක්ෂ්මන් නිපුණ ආරච්චි**
Hon. Lakshman Nipuna Arachchi

ඉතින් ඒක නිසා මම ඉදිරිපත් කරපු කරුණුත් එහෙමයි. එතුමා කියනවා එහෙම මැරිලා නැහැයි කියලා. ඒ ගෙවල් තුනට යන්න. මම දැනුවත්ව ඒ ගෙවල් තුනට යන්න. මම ඒකයි ඔබතුමන්ලාට ආරාධනා කරන්නේ. ගිහිල්ලා ඒ ගෙවල්වල අයගේ කටවල්වලින්ම මේ දේවල් අහන්න.

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

බොහොම ස්තුතියි. මීළඟට -

**ගරු කේ.ඩී. අරුණ දීපාල්**
Hon. K.D. Aruna Deepal

ගරු නියෝජ්‍ය සභාපතිතුමනි, ව්‍යූහ කමිටුව අපට දැනුම් දීලා -

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

රීති අංක 31(ආ) යටතේ යෝජනාව පිළිබඳ සාකච්ඡාව මෙයින් අවසන් වෙනවා.

# කල් තැබීම
# ADJOURNMENT

**ගරු නියෝජ්‍ය සභාපතිතුමා**
Mr. Deputy Chairman

*"දැන් මම මෙම සභාව කල් තබනවා."*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 02.01 ට, 2014 සැප්තැම්බර් මස 09 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*Sitting, accordingly adjourned at 02.01 p.m till 9.30 a.m. on 09.09.2014*